## 2019.06.04 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදූර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ.සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 11.15 රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී☸**

**(01)**

**01.01 2019 – 05 – 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම**

2019-05-04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

- **ඒ අනුව 2019 – 05 - 04 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන නැත

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවට අවමංගල්‍යා උත්සවයක් සඳහා නගර සභාව සතු සුදු කොඩි 30ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව විසින් අවමංගල්‍යා උත්සවයක් සඳහා සුදු කොඩි 30ක් නොමිලේ සභා අනුමතියට යටත්ව ලබා දී ඇත. ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව සඳහා අවමංගල්‍යා උත්සවයක් සඳහා නගර සභාව සතු සුදු කොඩි 30ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි දිනායාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.02 අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා භූමි උපදේශක මහතා විසින් කොහුබත් , හුබස් මැටි සභා අනුමතියට යටත්ව ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>

ක්‍රීඩා භූමි උපදේශක , ජී අසෝක කුමාර මහතා විසින් අප නගර සභාව සතු පොල්වත්ත ක්‍රීඩාංගණය සහ මානාන ක්‍රීඩාංගණ වල ඇති විකට්ටුව ( තණතිල්ල ) සාදා ගැනීම සඳහා හුඹස් මැටි කියුබ් ½ සහ කොහුබත් කියුබ් 01 අවශ්‍ය ඇත. එය ලබාදෙන ලෙස ඉල්ලිමක් කර ඇත. එය සභා අනුමතියට යටත්ව ලබා දෙන ලෙස අනුමත කර ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව සතු පොල්වත්ත ක්‍රීඩාංගණය සහ මානාන ක්‍රීඩාංගණවල ඇති විකට්ටුව (තණතිල්ල ) සාදා ගැනීම සඳහා හුඹස් මැටි කියුබ් ½ සහ කොහුබත් කියුබ් 01ක් සභා අනුමතියට යටත්ව ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.03 අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයට වෙසක් පෝය දිනය වෙනුවෙන් සැරසිමේ කටයුතු වලට කොඩි කණු 12ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයට වෙසක් පෝය දිනය වෙනුවෙන් සැරසිමේ කටයුතු වලට කොඩි කණු 12ක් සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය සඳහා වෙසක් පෝදින ය වෙනුවෙන් සැරසීමේ කටයුතු වලට අවශ්‍ය කොඩි කණු 12ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී දිනායාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.04 ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමා විසින් හල්වතුර යෝජනා ක්‍රමයෙන් විද්‍යාලය සඳහා වෙන්කර ඇති අක්කර 05ක භූමිය නිත්‍යානුකුලව ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

හල්වතුර යෝජනා ක්‍රමයෙන් විද්‍යාලය සඳහා වෙන්කර ඇති අක්කර 05ක භූමිය නිත්‍යානුකුලව ලබා ගැනීම සඳහා ඉල්ලිමක් කර ඇත. දැනට විද්‍යාලයේ එක් මායිමකට යාව ඇත්තේ ඉහත යෝජනා ක්‍රමයට අයිති පුරන්ව ඇති කුඹුරකි. මා ද ඔබ සභාව නියෝජනය කරන වකවානුවක නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සකස් කරන ලද නගර සංවර්ධන සැලැස්මක ඉහත යෝජනා ක්‍රමය යටතේ විද්‍යාලය යාබදව ඇති පුරන්ව ඇති කුඹුරෙන් ක්‍රීඩා පිටියක් සඳහා අක්කර 05 ක් වෙන් කළ බව හොඳින්ම මාහට මතකව ඇත. දැනට අප විද්‍යාලයේ ළමුන් 3700 පමණ අධ්‍යාපනය ලබන අතර විද්‍යාලයේ ඉදිරි වකවනුව තුළ අවශ්‍ය ගොඩනැඟිලි ඉදිකිරිමට හෝ කිසිදු භූමියක් විද්‍යාලය සතුව නොමැත. එමෙන්ම විද්‍යාලයට ක්‍රීඩා පිටියද නොමැත.අම්බලන්ගොඩ නගර සභා සිමාවේ නගරයෙන් බැහැර නාගරික කොට්ඨාශ සඳහා දැනට ඇති එකම ප්‍රධාන විද්‍යාලය වන අව විද්‍යාලයේ ඉදිරි සංවර්ධන වෙනුවෙන් මෙම භූමිය නිත්‍යානුකුලව විද්‍යාලයට පවරා දීමට කටයුතු කිරිම ඉතා වැදගත් වේයැයි විශ්වාස කරන අතර මිට පෙරද ඉල්ලිම් කිහිපයක් කර ඇත. එමෙන්ම මෙවැනි පුරන්වූ හිස් භූමියක් විද්‍යාලයට යාබදව පැවතීම ළමුන්ගේ ආරක්ෂාවටද බලවත් තර්ජනයක්ව ඇත. ( වර්තමානයේ උද්ගතව ඇති තත්වය වැනි අවස්ථාවක මෙය වඩාත්ම ඉස්මතුව ඇත ) මේ කරුණු අනුව මෙම භූමියේ අක්කර 05ක් විද්‍යාලයට නිත්‍යානුකුලව ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටි.මේ සඳහා සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුළු සියළුම පක්ෂ නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහාය ලැබෙනු ඇතැයිද ගෞරවයෙන් අපේක්ෂා කෙරේ. මේ සඳහා දැනට නිකුත් කර ඇති කිසියම් ගැසට් නිවේදනයක් බාධාවක් වේ නම් එම නිවේදනය සංශෝධනය කර ගැනීම හෝ අවලංගු කර ගැනීමට කටයුතු කිරිමටද නගරයේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන ඔබ සභාව විසින් සිදුකළ යුතු වැදගත් කාර්යයක් බවද ඉකා කරුණිකව සිහිපත්කර සිටි. නිත්‍යානුකුලව මෙය නගර සභාවට භාර දි තිබෙනවා. මේ සම්බන්ධව වන්දි ගෙවීම තමයි සිදු කිරමට ඇත්තේ . වන්දි ගෙවිම සඳහා මේ ස්ථානයේ අයිති පුද්ගලයන් නිසියාකාරාව හඳුනා ගෙන නැහැ. මා දන්නා විදියට මේ පද්ගලයෝ බලපිටිය දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත. එම නඩුව පවරා ඇත්තේ මෙම ඉඩම බෙදා වෙන්කර ගැනිම සඳහායි. ඒ බෙදා වෙන්කිරිමෙන් පසු අයිතිකරුවන් කවුද කියා දැන ගත් පසු ඔවුන්ට වන්දි ගෙවීමට සිදු වෙනවා. මා ප්‍රකාශ කර සිටින්නේ කුලරත්න විද්‍යාලයට අනිවාර්යයෙන්ම මෙම භූමිය පවරා දිය යුතු බවයි. ගරු මන්ත්‍රීවරුන් මේ ගැන සලකා බලන්න. අම්බලන්ගොඩ නගරයේ ඇති කිසිම පාසලකට ක්‍රීඩා පිටියක් නැහැ. ඒ නිසා ඔවුන්ට මෙම ක්‍රීඩා පිටිය ලබා දී ඔවුන්ගේ ක්‍රීඩා කෞශලායන් නංවාලිමට හැකි වේ. මෙසේ මේ භූමිය ලබා දීමට එහි වන්දි ගෙවිම අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ විද්‍යාලයෙන් ලබා ගන්නා ක්‍රමයක් යටතේ සිදු විය යුතුයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවන ලද ඉල්ලිම නගර සභාව විසින් වාර දෙක තුනකදිම ක්‍රියාත්මක කිරිමට හැදුවා. නමුත් එය ක්‍රියාත්මක කර ගැනිමට බැරි වුණා. දැන් හෝ මෙම ඉල්ලිම කර

ඇති නිසා මෙම විද්‍යාලයට මෙය ලබා දිය යුතුයි. ඉතාම ශ්‍රීඝයෙන් දියුණුවන ස්ථානයකි. අද වන විට සිසුන් 3700 ක් පමණ ප්‍රමාණයක් අධ්‍යාපන කටයුතු හදරනවා. මෙ වන විට විද්‍යාලයේ ඉඩකඩ පොඩි දෙයකටවත් යොදා ගැනිමට නොහැකි තත්වයක් තමයි තිබෙන්නේ. සියළුම ස්ථානවල ගොඩනැඟිලි ඉදිකර විද්‍යාලයට සියළුම පහසුකම් සාදා තිබේ. ක්‍රිඩාංගණයට යාබදව තිබෙන මෙම ඉඩම නගර සභාවට පවරාගෙන තිබෙන්නේ. එම නිසා නගර සභාව විසින් මෙම අක්කර 5ක භූමිය පවරා දීමට එකඟතාවය පළ කළහොත් හොඳයි. විද්‍යාලයේ දියුණුව සඳහා. ඔබතුමා ප්‍රකාශ කළා වන්දි ගෙවිම සම්බන්ධව. මේ පවරා ගනු ලැබූ ඉඩම් වලට මේ වන විට වන්දි ලබාගැනිමට ඉල්ලීම් කළ අය 5%ක් වත් නැතිව ඇති. අක්කර 200 ක පමණ ප්‍රමාණයක් පවරා ගෙන තිබෙන විට මෙහි වන්දි ගෙවිම සිදු කරන බව ඔවුන් සමහර විට දන්නේ නැතිව ඇති. සමහර තැන්වල අයිතිකරුවන් සිටිනවා. සමහර තැන්වල නැහැ. සමහර විට වන්දි ගෙවීමේ ගැටළුවක් වෙන එකක් නැහැ. විද්‍යාලයට මේ අක්කර 5ක භූමිය ලබා දෙන ලෙස මා ඉල්ලිමක් කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, කුලරත්න විද්‍යාලයේ වත්මන් විදුහල්පති ජගත් සේනාරත්න මහතා අප සමඟ නගර සභාවේ සිටි කාලයක මෙම ඉල්ලීම කළා. මෙය දෙන්න තින්දු කර තිබුණේ. නාගරික සංවර්ධන අධිකාරියේ රැස්විමකුත් ඔබතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වුවා. මේ ගනු ලැබූ තින්දු තීරණ ක්‍රියාත්මක නොවිම නිසා තමයි මේ තත්වය උදා වී තිබෙන්නේ. මේ අත්පත්කර ගත් අක්කර 250 ක් විතර තිබෙනවා. සමහරුන්ට වන්දි ගෙවා නැහැ. සමහරුන්ට වන්දි ගෙවනවා.අපි මෙහි හරි විස්තරය දන්නේ නැහැ.මෙය කොච්චර කතා කළත් මෙය ක්‍රියාත්මක නොවන ආකාරයට යනවා. එම නිසා මෙයට අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලේකම්තුමා,විදුහල්පතිතුමා , ඒ අදාල නිළධාරින් මෙතැනට ගෙන්වා මේ පිළිබඳව සාකච්ඡා කරන්න.

- **පෙරවරු 11.15ට ගරු සභාපති ඩබ්.එම් අරුණ ප්‍රදිප් මහතා සභාවෙන් නික්ම ගිය අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ගරු සභාවේ මුලාසනයට පැමිණියහ.**

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

මෙතැන කතා වෙනවා. නමුත් ක්‍රියාත්මක වන්නේ නැහැ. මෙය ඉදිරියට යන්නේ නැහැ. එම නිසා මෙය වැදගත්ම දෙයකි.කුලරත්න විද්‍යාලයේ දරුවන් 4000 කට ආසන්න ප්‍රමාණයක් සිටිනවා. ඒ සඳහා උනන්දුව තිබෙනවා. මුදල් සොයා ගැනිමේ ක්‍රමවේදයට විදුහල්පතිතුමාත් උනාන්දු වි කටයුතු සිදු කරයි . අපි මෙය දෙනවා කියා කොපමණ කතා කළත් වැඩක් නැහැ නිත්‍යානුකුල ක්‍රමවේදය අනුගමනය නොකළ. තල්ගස්ගොඩ බැද්දේ ඉඩම අපි නිදහස් කළා. අත්පත්කර ගත් එක නිදහස් කිරිමේ ක්‍රමවේදයකට ගිහින් අපගේ හිටපු සභාපති හා වර්තමාන සභාපතිතුමා ඊට අදාලය උපලේඛණ එම ක්‍රමවේදයට ගියා. දැන් මේ නිත්‍යානුකුල ක්‍රමවේදයට අපි බැසිය යුතුයි. ඒ සඳහා බැසිමට ප්‍රාදේශිය ලේකම්තුමිය අත්‍ය අවශ්‍ය වෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමා,විදුහල්පතිතුමා, ගරු මන්ත්‍රිවරු නියෝජනය වන ආකාරයෙන් කැඳවා මෙහි සුල මුල සොයා කාටද වන්දි මුදල් ගිහින් නැත්තේ කියා .එ තුල ඇත්තේ කාගේද අයිතිය. සමහර විට එහි අයිතිකරුවන් මියගොස් අයිතිකරුවෙකුත් නැහැ. මේ පිළිබඳ සොයා බැලිමටත් කමිටුවක් පත්කරන ලෙස ඉල්ලා සිටිනවා. දැන් මේ කටයුත්ත විදුහල්පිතුමා ඉල්ලා සිටින්නේ වසර 10 ක සිටය. මීට වසර 14 කට පෙර තමයි විදුහල්පතිතුමා මේ සභාවේ ගරු මන්ත්‍රිවරයෙකු වශයෙන් නියෝජනය කරනු ලැබුවේ. ඒ කාලයේ යෝජනා කළත් මේවනතුරු එය ඉටු වී නැහැ. ඉඩම් අත්පත් කර ගත්තාට වන්දි ගෙවා නැහැ.අදාල වන්දි ගෙවිය යුතු පුද්ගලයන්ට වන්දි ගෙවා සංවර්ධන කටයුත්ත සිදු කරන්න. මෙහි ගරු නවක මන්ත්‍රිවරු සිටින්නේ. මෙහි සුලමුල දන්නේ නැහැ. එමනිසා කමිටුව පත්කර අවශ්‍ය කටයුතු ටික ඉක්මනින් සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>

නගරයේ පුද්ගලයෝ විදියටත්, නගරයේ ප්‍රධාන පාසලක් විදියටත් , මේ ඉඩම් කුලරත්න විද්‍යාලයට ලබා දිම පිළිබඳව අවශ්‍යතාවයක් ඉතා හොඳින් පැහැදිලිව පෙනේ. නමුත් ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ ආකරයට ලිපියක් ඉදිරිපත් කර ඒ ලිපිය මේ සභාවේ සාකච්ඡා කර එතැනින් සභා වාර්තාවට ගිහින් නවතින

ක්‍රමවේදයක් තමයි පසුගිය කාලය පුරාවටම දකින්නට තිබෙන්නේ.එහෙම ලිපි ඉදිරිපත් කර එසේ සිදු වෙනවා නම් අපරාදේ සභාවේ කාලය කා දැම්මක් ලෙස තමයි මට හැඟෙන්නේ.යම් දෙයක් සාධාරණ දෙයක් සියළු ගරු ම

මන්ත්‍රීවරු විසින් නගරය වෙනුවෙන් ගනු ලබන තීන්දුවක් බව අවබෝධ කර ගත යුතුයි. නගරයේ ප්‍රධාන පාසලක් ගා / පි. ද එස් කුලරත්න විද්‍යාලයට මේ අක්කර 5ක භූමිය ලබා දිම පිළිබඳව මේ සඳහා ක්‍රියාවෙන්ම සිදු කළ යුතුයි. මේ මස හෝ ලබන මසය වනවිට සංවර්ධන කමිටුව නැවත ආරම්භ කරනවා. මේ සංවර්ධන කමිටු නොපැත්වීම පිළිබඳව විශාල බලපෑමක් අපි ඇති කළා.නගරයේ ගැටලු නිරාකරණය කර ගැනිමට ඇති එකම තැන අමිහි වි ඇති බවට. ගරු ජනාධිපතිතුමා විසින් එවා ඇති කාල සටහනට අනුව මේ මස හෝ ලබන මස සංවර්ධන කමිටු ක්‍රියාත්මක කිරිමට නියමිතයි. සංවර්ධන කමිටු මාර්ගයෙන් මේ යෝජනාව ඉදිරිපත් කරන්න ප්‍රාදේශිය ලේකම්තුමියට ඉදිරිපත් කරන්න. විදුහල්පතිතුමාටත් එදිනට සහභාගි වෙන ලෙස දන්වා සිටින්න. මේ පිළිබඳව එහිදි සාකච්ඡා කරනු ලැබේ. එවිට ප්‍රාදේශිය ලේකම්තුමිය මේ පිළිබඳව සොයා බලයි. මේ පාසල ඉල්ලා සිටින අක්කර 05ක භූමි භාගය නිරවුල් වෙලාද ? එයට අයිතිකරුවන් ඉදිරිපත් වි තිබෙනවාද ? නැතිනම් එයට මුදල් යොදවා තිබේද? මේ ඉඩම් සඳහා වන්දි ගෙවා තිබේනම් , අයිතිකරුවන් සිටි නම් වන්දි ලබා දි මේ අක්කර 5 ක භූමි ප්‍රදේශය ගා/පී දඑස් කුලරත්න විද්‍යාලයට ලබා දිය හැකිය. නගර සභාවෙන් මෙය ප්‍රාදේශිය ලේකම්තුමියට ඉදිරිපත් කරන්න.නගර සභාව විසින් මේ සඳහා වන්දි ගෙවනු ලබයි. නාගරික සංවර්ධන අධිකාරියට යම්කිසි මුදලක් ගෙවිය යුතුයි. එවිට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අපට මෙය බේරා ගත හැකිය. සංවර්ධන කමිටුවේදි මේ සඳහා අවශ්‍ය තින්දුව ගත හැකිය. ගරු නාගරික සංවර්ධන අමාත්‍ය චම්පික රණවක මැතිතුමාට යොමු කිරිමෙන්, පාසලක් වෙනුවෙන් එතුමාගේ මුදල් යොදවා මෙය ඉටුකර ගත හැකිය. එතැනට තල්ලුවිමට මෙය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>මූලාසනය- ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

මෙහි වන්දි ගෙවා ඇත්තේ අප විසින් සංවර්ධනය කරන ලද කොටස සඳහා පමණි. මෙය පවරා ගැනීම සතුයි.මේ අක්කර 200 ගණනම සභාව විසින් තමයි පවරා ගෙන ඇත්තේ.නාගරික සංවර්ධන අධිකාරිය විසින් වන්දි ගෙවා ඇත්තේ ඔවුන් විසින් සංවර්ධනය කරනු ලැබූ කොටස සඳහා පමණි. එවිට මෙහි අයිතිය සම්පූර්ණම ඇත්තේ සභාවටයි. මේ වනවිට 25% ක්වත් නැතිව ඇති වන්දි ඉල්ලන පිරිස. මේ අක්කර 05 කාටද අයිති මෙය දුන්පසු මේ වන්දිය ඉල්ලනවාද නැද්ද කියා තීරණය කළ හැක්කේ මෙය ලබා දුන් පසුවයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

මේ වන්දි ගෙව්වා හරි මොනවා හරි වල නගර සභාව විසින් ලිපිගොණු ගෙන්වා ගෙන තිබිය යුතුයි. එය අපගේ වගකිමයි. මෙය කලින් ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් මකත් කරනු ලැබුවා මෙහි ගෙවිමට ඇත්තේ සුළු කොටසක් බව. අපට එසේ ප්‍රකාශ කළාට ලිඛිතව තිබෙන දේවල් වලින් කරුණු කරනා අවබෝධ කිරිමෙන් පසුයි කටයුතු කළ යුත්තේ.මේවා රජයට අත්පත් කර ගත් පසු ඒවාට වන්දි ගෙවනන ක්‍රමවේදයක් තිබෙනවා. මෙහි සුලමුල සෙවිය යුතුයි.අපි වන්දි ගෙවිමේ කටයුතු 25% ක් සිදු කළ බව ප්‍රකාශ කළාට.

<u>මූලාසනය- ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

වන්දි ගෙවිමේ කටයුතු සිදු කරනු ලබන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙනි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

ප්‍රාදේශිය ලේකම් විසින් තමයි. අපි දැනගත යුතුයි කොයි එවාටද වන්දි ගෙවා ඇත්තේ.මොන කොටස් වලටද වන්දි ගෙවා ඇත්තේ. අපේ වගකිමනේ එය දැන ගන්නා එක. මේ වගේ සංවර්ධන කටයුතු සඳහා දිය නොහැකි වෙනවා එය දැන ගත්තේ නැතිනම්.මෙතුමා ප්‍රකාශ කරන කතාව හරි. ප්‍රාදේශිය ලේකම්ට ඉදිරිපත් කළානම් එතුමිය ඉදිරිපත

කරනු ලබයි කාටද වන්දි ගෙවා ඇත්තේ. කොපමණ අක්කර ගණනකට වන්දි ගෙවා ඇත්තේ. තව ගෙවන්න තිබෙන කොටස කුමක්ද ? නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධද ?

**<u>මූලාසනය- උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

අපිට තව ගන්න තිබෙන්නේ වන්දි ගෙවීමේ කටයුතු සිදු කළ යුත්තේ ප්‍රාදේශීය ලේකම් විසිනි.මෙය අත්පත් කර ගැනිමට සභාවට භාර දි තිබෙන්නේ.මේ අක්කර 200 ගණනම පවරා ගෙන නගර සභාවට භාර දි තිබෙනවා.දැන් මෙහිදි අපගෙන් ඉල්ලා සිටින්නේ අක්කර 05 නිදහස් කිරිමටයි. මේ ගරු සභාවෙන් තින්දුව ගන්නවාද අක්කර 05 නිදහස් කිරිමට.සභාවෙන් මෙය සිදු කරනු ලබන්නේ නිත්‍යානුකුලවයි.මේ අක්කර 05 නිදහස් කරනවාට කවුරුත් විරුද්ධද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

කිසිම කෙනෙක් විරුද්ධ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස් .එම්. සරත් චන්ද්‍ර මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපගේ පක්ෂයේ අශිර්වාදය හා කැමැත්තත් මේ සඳහා ලබා දෙනවා.අපි කැමතියි කුලරත්න විද්‍යාලය වගේ පාසලකට අපේ සහායෝගය දක්වන්න.

**<u>මූලාසනය- ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

අපි මෙය යෝජනාවක් ගෙනත් සම්මත කළොත් හොඳයි කියා සිතනවා. එම නිසා කවුරුහරි යෝජනාවක් ගෙනවිත් සම්මත කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

කලින් යෝජනාවක් ගෙනත් තිබෙනවා නේද?

**<u>මූලාසනය- ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

දැන් මාස 6කට වැඩියි යෝජනාව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

එම අක්කර 05ක් කුලරත්න විද්‍යාලයට ලබා දිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

අපගේ විපක්ෂනායකතුමා යෝජනා කළා.එය ජගත් කුමාර මහතා ස්ථිර කළා.ගරු සභාව ඒකමතිකව තිරණය කරනු ලැබුවා එය ලබා දිමට.

**තීරණය**

අම්බලන්ගොඩ ගා/පී ද එස් කුලරත්න විද්‍යාලය සඳහා හල්වතුර යෝජනා ක්‍රමයෙන් විද්‍යාලයට වෙන්කර ඇති අක්කර 05ක භූමිය නිත්‍යානුකුලව ලබා දීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරිම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උපසභාපතිතුමා විසින් යෝජනා කළ අතර , එකි යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට්

පනියන්දුවගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ලදුව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**03.05 ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමා විසින් විද්‍යාලයේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරිම පිළිබඳව 2019.05.10 දින එවන ලිපිය සභාගත කරන ලදී.**

<u>**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**</u>

ප්‍රාදේශිය ලේකම්තුමියට එවන ලද ලිපියේ ජායා පිටපතක් විදුහල්පතිතුමා විසින් ගරු සභාවට එවා ඇත්තේ.විද්‍යාලයේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරිම පිණිස. විද්‍යාලය දැනට ළමුන් 3700ක් පමණ අධ්‍යාපනය ලබන විද්‍යාලයකි. මෙම විද්‍යාලයට පිවිසෙන රණසුරිය මාවත පටු මාර්ගයක්වන අතර ළමුන් ප්‍රවාහනය කරන බස් රථ ඇතුළු පෞද්ගලික මෝටර් රථ ගමන් කිරිමේදි මාර්ගයේ දැඩි අවහිරතාවයක් ඇති වේ. අප විද්‍යාලය ඇතුළු නගරයේ ප්‍රධාන විද්‍යාලයන්ට ළමුන් ප්‍රවාහනය කරන පාසල් බස්රථ විශාල ප්‍රමාණයක් විද්‍යාලයේ තාප්පය අසළ මාර්ගය දෙපස ගාල් කර තැබීම කාලයක් තිස්සේ සිදු කරන ලදි.දැනට රටේ උද්ගතව ඇති තත්වය මත ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් විද්‍යාලය අසළ ළමුන් ප්‍රවාහනය කරන රථ නතර කර තැබිම වලක්වා ඇත. නමුත් දැනට පවතින තත්වය හමුවේ වුවද , සාමාන්‍ය තත්වය හමුවේ වුවද පාසල අසළ බස්රථ ගාල් කර තැබිම ළමුන්ගේ ආරක්ෂාවට දැඩි තර්ජනයක්ව ඇත. මේ නිසා විද්‍යාලයට පිවිසෙන මාර්ගයන්ට යාබදව ඇති පුරන්වූ වෙල්යායේ මාර්ගයට සමීපව දැනට අර්ධ වශයෙන් ගොඩවී ඇති මිටර් 200ක පමණ දික් වු පටු තීරය අඩි 20ක් පමණ පළලට පස් දමා සකස් කර දීමෙන් බස්රථ 25ක් පමණ ගාල් කිරිමට හැකියාවක් ලැබෙනු ඇත.ඒ තුලින් ළමුන්ගේ ආරක්ෂාව මෙන්ම ගමනාගමනයට දීර්ඝකාලීන විසඳුමක් සැලසෙන බව පෙනි යයි. මේ සම්බන්ධව අම්බලන්ගොඩ ගරු නගරාධිපති අරුණ ප්‍රදිප් මැතිතුමාගෙන්ද ඉල්ලීම් කර ඇති බවත්, විශේෂයෙන්ම දැනට රටේ උද්ගතව ඇති තත්වය පිළිබඳ අවධානය යොමුකර හදිසි පුමුඛ කාර්යයක් ලෙස සලකා මෙම පටු බිම් තීරය පස් දමා සකස් කර දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. මා හිතන්නේ රණසුරිය පාරේ දැනට බෝක්කුව ඉදිකරන ලද ප්‍රදේශයයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්**</u>

කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට දින හතේ වැඩ සටහන යටතේ මෙය භාගයට ගොඩකර තිබේ.පොලිසිය දැනුවත් කර තිබෙන්නේ විදුහල්පතිතුමා සමඟ. විශේෂයෙන් බස්රථ ගාල් කිරිමේදි ලොකු ගැටළුවක් තිබෙනවා.මැදට බස්රථ ගාල් කරනවා. ලොකු අපහසුතාවයක් සිදු වෙනවා ත්‍රිරෝද රථ , වෙනත් වාහන හා දරුවන්ට ගමන් කිරිමට නොහැකිව. ආරක්ෂිත හේතුන් මත හා ඩෙංගු උවදුර යන දෙකම සලකා බලා නිත්‍යානුකූලව මේ අක්කර 05 ලබා දිමට ඔබතුමාලාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මෙහි පස් ගෙනවිත් දැම්මා කියා මෙහි රැදි සිටින්නේ නැහැ.අඩි 20ක් වාහන ගාල් කිරිමටත් ක්‍රිඩා පිටිය ඉදිකළත් ඉදිරි අනාගතයේදි මෙය ප්‍රයෝජනවත් වෙයි.කරන දෙය නිසියාකාරව සිදු කළ යුතුයි. එහෙම නම් අඩි 20ක් 25ක් ඉදිරියෙන් පැති බැම්මක් ඉදි කළ යුතුයි.

<u>**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**</u>

ගරු විපක්ෂනායකතුමනි, පැති බැම්මක් යාමට තරම් එතරම් උස මට්ටමක නැත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්**</u>

එසේ නොමැති වුවත් බර වාහන එහාට මෙහාට ගන්නා විට මේ ගැට්ට කැඩිමට පුළුවන. මෙය කැඩි කැඩි යයි.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

දැනුත් එහි බස්රථ ගාල් කරනවා. උඩ මට්ටමක් නැති නිසායි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

එහෙම නම් මෙහි පාරට හැඩකර ගොඩනැඟිලි කඩා ඉවත් කරන දැ එම ස්ථානයට ගෙනගොස් දමන්න. ඒ ගැන පොලිසිය හා ප්‍රාදේශිය ලේකම්තුමිය දැනුවත් කල යුතුයි. මධ්‍යම හා පරිසර අධිකාරියේ ඒ නිලධාරියා දැනුවත් කළ යුතු වෙනවා.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එම ගොඩනැඟිලි කඩන දේවල් දැන් දමා තිබෙන්නේ. දිගටම දමා තිබෙන්නේ. ඒ උඩට පස් ටිකක් දමන ලෙසයි මේ ඉල්ලා සිටින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

එහෙනම් මෙයට පාසල් දරුවන්ගේ අවශ්‍යතාවයක් කියා පස් ටිකක් දමා තුනි කර දෙන්න.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මේ විදුහල්පතිතුමා ඉල්ලීම කරනු ලබන්නේ මෙය සභාවෙන් කර දෙන ලෙසටයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

මා හිතන්නේ නැහැ කුලරත්න විද්‍යාලය ආර්ථික අතින් එතරම් ශක්තිමත් කියා. මෙහි අප සැමදෙනාගේම නියෝජනය කරන දරුවන් මේ පාසලට යනවා එනවා. මේය මුදල් වලට ගෙන නෙමේ . නගර සභාවෙන් අපේ කපන තැනක පස් ටික දමා මෙය තුනිකර දී ලබා දෙන්න.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

සභාවේ පස් කපන්නේ නැහැ. අපගේ හල්වතුර කසළ අංගණයටත් පස් ගෙන එනු ලබන්නේ මුදල් වලටයි.මා හිතන්නේ පස් කියුබ් එකක් රු2800/=ක මුදලකටයි මිලදී ගනු ලබන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

අපට පස් ගැනිමට පුළුවන් නම් අපගේ මැෂින් එක දමා අපට ඒ සඳහා ලොකු මුදලක් වැයවෙන්නේ නැහැ.එහෙම කිරිමෙන් නගර සභාවට විශාල වියදමක් යන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සැම පාසලකම බස්රථ නතර කරනු ලබන්නේ ඔය ස්ථානයේයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය කුලරත්න විද්‍යාලය අසළ බස් නතර කිරිම අනාරක්ෂිතයි. මා එහි සිටින විටදි තිරිංග නොමැතිව බස්රථයක් උඩ සිට පහළට පැමිණියා බස්රථ 4ක් පමණ තල්ලු කර ගෙන.ඒ වෙලාවේ එහි කිසිදු ළමයෙකු සිටියේ නැති නිසා අනතුරක් සිදු වුණේ නැහැ. අපගේ හිටපු දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍ය ගරරු රාහසාපුත්‍ර මැතිතුමා පාසලේ උත්සවයකට පැමිණි අවස්ථාවේ විමසා තිබෙනවා බස්රථ ගාල් කරන ස්ථානයක්ද කියා. එය දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන අයුරින් සිදි විය යුතුයි. පෝරඹ කාණු පද්ධති වල පස් වගයක් ගොඩ ගසා තිබෙනවා. එම පසුත් එතනට ගෙනහින් දැම්මට පුළුවනි.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ඔබතුමා හොඳ යෝජනාවක් කරනු ලැබුවේ.මා ගරු විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ වන විට ඔබතුමා මාර්ග සංවර්ධනයේ යෙදෙන බව. මේ වන විට ගොඩහේන පාරත්, පනියන්දුව පාරත් කාපට් කිරීමේ කටයුතු සිදු කරන බව. ඒ මාර්ග වල දෙපස කැපෙන පස් එම ස්ථානයට දමන ලෙස මා ඉල්ලීමක් කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

මා එය එකතු කර දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු ඩෙනට් පනියන්දුවගේ මහතා කරන ලද ප්‍රකාශයට මාත් එකඟ වෙනවා. පස් තල්ලු වීමක් සිදු වීමට පුළුවනි බස්රථ ගාල් කරනවා. ඒ සඳහා මා යෝජනා කරනවා අඩි 20 නම් අවශ්‍ය ටිකක් එහාට ගෙන අංශක 45කට ඇළ කර හරි ගස්වා පස් දැම්ම සිදු කළා නම් හරි . නැතිනම් බස්රථ ගාල් කරන විට විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළ දෙය සිදු වෙයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය විදුහල්පතිතුමා විසින් කරන ලද ඔය ස්ථානය අභයභූමියක් ලෙස ගැසට් කර තිබෙන ස්ථානයකි. එම නිසා එහි බස්රථ ගාල් කිරීම සඳහා නොකියා ඩෙංගු උවදුර මර්ධනය කිරීම සඳහා පස් යොදන බව සඳහන් කරන්න. බස් කතන්දරය ඔතනට දමන්න එපා.දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂිත හේතූන් මත කියන්න. මෙහි පස්ටික දමා සකස් කරන්න. නැතිනම් මෙහි ප්‍රශ්නයක් ඇතිවිය හැකියි.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

විදුහල්පතිතුමාට මා ප්‍රකාශ කළ සිටියේ එහෙම ලිපිය එවන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

විරුද්ධ අයත් සිටිනවා. විදුහලේ ආරක්ෂක අංශයට පවා ප්‍රශ්න දමන අය සිටිනවා. එම නිසා ගැටළුවක් ඇති විය හැකියි. අපේ ගරු මන්ත්‍රීතුමාලා පස් සොයා දෙන ප්‍රමාණය ගන්න. ඔතන පුළුවනි රියදුරන්ගෙන් පස් ලබා ගන්න.විදුහල්පතිතුමා දැනුවත් කරන්න. එතුමා පස් ටික අරගෙන දෙයි .

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මේ වන විටත් ගරු මන්ත්‍රීතුමා එය ගොඩවී තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

හේතු කාරණා නිතරම ලියා තබන්න. ඩෙංගු උවදුර නිසා මෙයට පස් යොදන බව . මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා මඟින් නිර්දේශයක් යොදා ගන්න. මෙය පස් දමා ගොඩකරන්න කියා.ඩෙංගු මදුරු කීටයන් සිටින බව දන්වා එය සිදු කරන්න.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ලේකම්තුමිය මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා නැද්ද? නිලධාරින්ට දන්වා සිටින්න සභාව දිනයට මෙහි රැඳී සිටින්න කියා.ඩෙංගු අවධානමක් තිබෙන නිසා මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා සිටිය යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කොට්ඨාශයේ මන්ත්‍රිවරයා විදියට මෙහි අයිතිවාසිකම් කියාගෙන එනවිට විශාල ගැටළුවක් මතු වෙනවා. ගරු සභාපතිතුමාටත්, මටත් විරුද්ධව පොලිසියේ පැමිණිලි දමන බව පැවසුවා.මේ නිත්‍යානුකුල තත්වය බලන්නේ නැතිව ඩෙංගු උවදුර කියා පස් දමා ගොඩ කරන්න.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ප්‍රකාශ කළේ එහෙම එවන්න කියා. ඇත්තටම ජලය පිරෙනවා එතන.මා ගොස් මේ ස්ථානය පරික්ෂා කළා. ඒ වන විටත් ජලය තැනින් තැන රැදි සිටිනවා. මා විදුහල්පතිතුමාට ප්‍රකාශ කළා මෙය බස් නතර කිරිමට නෙමේ. මෙහි ජලය රැදි සිටින නිසා ඩෙංගු මදුරුවන් බෝවන නිසා පාසල් දරුවන්ගේ ආරක්ෂාව සඳහා,පස්දමා මෙය අපි ගොඩ කර දෙන්නම් කියා. ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා. මා ඉල්ලා සිටනවා ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාගෙන් ඉහත මාර්ග වල පස් ටික දමන ලෙස. එම පස්ටික දැමූ විට ලොකු පරාසයක් ගොඩවන බවයි.මෙය ගොඩවෙලා තිබෙන්නේ. පාර මට්ටමට ලේවල් එකක් නැති එකයි තිබෙන්නේ. කොන්ත්‍රාත්කරුවන් මේ පස්ටික මුදල් වලට දැම්මට පටන් ගනී. ඊට වඩා හොඳයි එම පස්ටික මෙතනට දැම්මානම්. එම කාර්ය නිකම්ම ඉෂ්ඨ වෙනවා. එම නිසා මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාගෙන් වාර්තාවක් ගන්න. මේ ස්ථානය අනාරක්ෂිතයි.විද්‍යාලයේ දරුවන්ගේ ආරක්ෂාවට ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා මේ කාර්ය ඉටුකරන බවට ලබා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්</u>**

හල්වතුරේ කාණු සුද්ද කළා. දැන් පස්ටික පාරේ. වැස්සට නැවත කාණුවලට යාමට පුළුවනි.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

සෞඛ්‍ය අංශයෙන් සිටින්නේ කවුද ? මෙය ගරු මන්ත්‍රිතුමා අපි සුද්ද කළ එකක් නෙමේ. මෙය මාර්ග සංවර්ධන අධිකාරියෙන් සුද්ද කරනු ලැබුවේ. හරි කැතයි මා දුටුවා පෝරඹ දෙපැත්තේම දමා තිබෙනවා. මා හිතන්නේ නැහැ ඔවුන් මෙය අයින් කරයි කියා . දැන් සුමාන ගණක් තිබෙනවා. ඒ ටික හරි ගිහින් දමන්න. ප්‍රධාන පාරකි. මේ සඳහා කවුරුත් විරුද්ධ වෙන එකක් නැහැ. මෙය බැකෝ යන්ත්‍රයෙන් පටවීමට බැරිය.

**<u>ගරු නගර සභා මන්ත්රි මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්</u>**

පාර අවහිර වෙනවා. මෙය අතින් කළ යුතු වන්නේ. වර්ෂාපතනය නිසා තද වි තිබෙන්නේ. මෙය බැකෝ යොදා කල නොහැකිය.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මෙය බැකෝ එකෙන් කළ නොහැකිය. ලේකම්තුමියණි, මේ මාර්ග වල කාණු සුද්ද කර තිබෙනවා. එහි පස් හා කසළ මාර්ගයේ දමා තැබිමෙන් නගරය අවලස්සන වි තිබේන නිසා මෙය ඉක්මනින් අයින් කර දෙන ලෙසත් මාර්ග සංවර්ධන අධිකාරිය දන්වා සිටින්න .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

මෙය මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයින් කළහොත් පස්ටික අපට ගැනිමට බැරිවෙනවා. මේ පිළිබඳව කතා නොකර අපේ ට්‍රැක්ටරයක් හා සේවකයන් යොදවා මේ පස්ටික දමා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

මෙම පස් මාර්ග සංවර්ධන අධිනාරියෙන් ඉල්ලිමක් කර ලබා ගත හැක. මේ පස් ඔවුන් ඩිපෝ එකට ගෙනහින් දමන්නේ.අපට මේ පස්ටික කතා කර ලබා ගත හැකිය.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

කතා කර ලබා දෙන්න. මේ පස් ගොඩ ගසා අවලස්සනයි.සුමාන ගාණක් වෙනවා ගොඩ දමා.මෙය මාර්ග සංවර්ධන අධිකාරියට ( ඇල්පිටියේ ) දුරකථන ඇමතුමක් ලබා දෙන්න.

**තීරණය**

අම්බලන්ගොඩ ගා/පී ද එස් කුලරත්න විද්‍යාලයීය විදුහල්පතිතුමා විසින් ප්‍රාදේශිය ලේකම්තුමිය වෙත යොමු කරන ලද ලිපියේ පිටපතේ සඳහන් පරිදි ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරිම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව රටේ පවතින තත්වය හා ඩෙංගු උවදුර සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරික්ෂකතුමාගේ වාර්තාවක් ලබාගෙන එම කොටස පස් දමා සකස් කර දීම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති  කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව  ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**03.06 ඩිපෝ කළමණාකාරතුමා විසින් ඩෙංගු මදුරු කීටයන් බෝවීම වලක්වා ගැනිම සඳහා සුද්ද පවිත්‍ර කටයුතු සඳහා සභාව සතු බැකෝ යන්ත්‍රය ( තෙල් ලංගම කාර්යාලය මඟින් සපයා දීමේ පදනම මත)  සභා අනුමතියට යටත්ව ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ඩිපෝ කළමණාකාරතුමා විසින් බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලිමක් කර ඇත. ඉහත කරුණ සම්බන්ධයෙන් අප ඩිපෝව තුල ඩෙංගුමදුරු කීටයන් බෝවීම සම්බන්ධව ස්ථාන කිහිපයක් ඉඩකඩ ඇතිබව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය පරික්ෂණ කර මා වෙත දන්වා ඇත. එබැවින් එම ස්ථාන සුද්ද පවිත්‍ර කිරිම සඳහා එක් දිනක් එනම් 2019.05.30 දින එම බැකෝ යන්ත්‍රය ලබාදෙන ලෙස ඉල්ලා ඇත. එය ගරු සභාපතිතුමා සභා අනුමතියට යටත්ව එය ලබා දීමට කටයුතු කිරිමට අවසර දී ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා. මෙය ඉන්ධන ඔවුන්ගෙන් ලබාගන්නා ලෙස දන්වා ඇත.මෙය ලබා දී නැතිනම් එය ලබා දීමට කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි මෙය ලබා දෙනවාට විරුද්ධ වෙනවා නෙමේ. අප ප්‍රදේශයේ සුද්ද කළ යුතු කාණු මාර්ග බොහොමයක් තිබෙනවා. මේ කාණු සම්බන්ධව ඉල්ලිම් කළත් නැසු කන්ව සිටිනවා. අපිත් ඉල්ලා සිටිනවා මේ අවශ්‍ය තැන්වලට මේ බැකෝ යන්ත්‍රය ලබා දෙන්න කියා.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා මා හිතන්නේ නැහැ එහෙම සිද්ධියක් වෙනවා කියා.මෙහි බැකෝ යන්ත්‍රය ඉල්ලා සිටි සෑම මන්ත්‍රිවරයෙකුටම බැකෝ යන්ත්‍රය ලබා දි තිබෙනවා.හිමාල් මහතාණෙනි , විශේෂයෙන්ම ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා ඉල්ලිමක් කළහොත් එය ලබා දෙන්න. හැම තැනටම කරනවා.දිගින් දිගටම මෙය යන නිසා කෙරමිණිය , පින්නදුව ප්‍රදේශයේ ඔබතුමා බලා මේ කරුණ ඉෂ්ඨ කර දෙන්න. ගරු සභාවේ මේ තත්වය යන්න දෙන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කලින් වැඩසටහනක් තිබෙනවානේ. ඇත්තම පවසනවා නම් එය ක්‍රියාත්මක වන්නේ නැහැනේ.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

නැහැ . ගරු මන්ත්‍රිතුමා එය ක්‍රියාත්මක වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

මේ අහන්න. පළමුවෙන්ම ක්‍රියාත්මක වුයේ කෙරමිණියේ සහ පින්නදූවේ කොට්ඨාශ වලින් තමයි වැඩය පටන් ගනු ලැබුවේ.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා මෙය ක්‍රියාත්මක වුයේ නැද්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>**

ක්‍රියාත්මක වුණා. නමුත් විවිධ හේතු නිසා අප බලාපොරෝත්තු වූ විදියට සිද්ධ වුයේ නැහැ.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

විවිධ හේතු කියන්නේ මොනවාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>**

අපගේ නායකත්වයේ අශිර්වාදය මදිකම නිසා තමයි එහෙම සිද්ධ වුණේ.එතුමා එකඟ වුයේ නැහැනේ වැඩයට . අපේ ශ්‍රමිකයන් සැපයීම එහෙම අඩාල වුණා.එම නිසා අපි සෑහිමකට පත්වුයේ නැහැ වැඩපිළිවෙල ගැන.දැන් බොහොම අපහසුවෙන් යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි කියන්නේ වරදක් නෙමෙ. අම්බලන්ගොඩ නගරයේ ඩෙංගු තත්වය 250කට වඩා ඉහළ ගොස් ඇත.ඒ කියන්නේ ඉහළම අභයක් ගෙන තිබෙන්නේ. බලපිටිය රෝහලට ගියවිට දැනගත හැක. මේ ගරු මන්ත්‍රිවරුන් ගෙන එන ඒවා. අපිට කමක් නැහැ. පක්ෂ විපක්ෂ ද කියා නැහැ. මහජනතාව ගෙන එනු ලබන දේවල් මහජනතාව වෙනුවෙන් තමයි මේ සියළු දෙනාම කටයුතු කරන්නේ.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මේ වැඩය හරියටම කළේ ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා පමණි.එතුමා ඒ දින පහේම හරියට වැඩ ටික කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

එකතමයි කියන්නේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්</u>**

මා සම්පූර්ණ විරුද්ධ වෙනවා ඔබතුමා කළ ප්‍රකාශ ගැන. මාගේ කොට්ඨාශයේත් මෙම වැඩසටහන කරනු ලැබුවා. ඒ සඳහා මට ගමේ ප්‍රසංශාව ලැබුණා.ඔබතුමා මෙවැනි ප්‍රකාශ කළාම අපිට ගමේ ගොස් මුහුණ දිමට ප්‍රශ්නයක් වෙනවා. අපිත් හරියට වැඩේ කළා.

**<u>මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ඔබතුමාලා මට කියන්න දුන්නේ නැහැනේ. මුලින්ම මේ වැඩසටහන දෙනු ලැබුවේ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණිය මහතාටයි. ඊළඟට පැමිණියේ මට. ඉන්පසු ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාට .ඔහුගෙන් පසු ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතාට. නමුත් අපට වඩා පාරට බැස ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා මේ කටයුත්ත සිදු කළා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

දැන් මට කතා කරන්න දෙන්නේ නැද්ද? අපේ අදහස කියන්න එපායි.දැන් මේ කියන කතාන්දරය ඇත්ත. මොකද හේතුව ගරු සභාපතිතුමා සමහරුන්ට සලකනවා එක විදියකට . තව සමහරුන්ට සලකනවා තව විදියකට. ඇත්ත කතන්දරය ඕකනේ.එම නිසා එහෙම වෙන්න එපා. මේ නගර සභාව තමයි අපකීර්තියට පත් වෙන්නේ.ජනාතාව බනින්නේ ගරු සභාපතිතුමාටයි ගරු මන්ත්‍රීවරුන්ටයි . අරකද මෙකද කියා පාලන තන්ත්‍රයක් නැහැ මෙතන. මෙතුමා ඉන්නවා නම් හිරේවත්තේ. මෙතුමාට බනිනවා හිරේවත්තේ ජනතාව ඒ ප්‍රදේශය බැලුවේ නැතිනිසා.ඔබතුමා හොඳයි. ඔබතුමා හොයා බලා මෙතුමාගේ හරි වැඩටික කරන්න. අපේ වැඩ නොකළත් කමක් නැහැ. මේ අයගේ වැඩ කරන්න.පාලන තන්ත්‍රයේ ගරු මන්ත්‍රීවරු 2ක් දැන් කියා සිටියේ. ඔබතුමා මූලික වෙලා සෞඛ්‍ය ප්‍රශ්නය විසඳන්න. මේ බැකෝ එක මදිනම් මුදලට තව එකක් හරි ගෙන වැඩේ කරන්න.

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

මා මෙහි තව පැය භාගයක් විතර වැඩ බලයි . ඉන්පසු ගරු සභාපතිතුමා තමයි වැඩ කටයුතු සිදු කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මැතිතුමිය කතා කරමින්**

ඩෙංගු උවදුර සඳහා දුමානය කටයුතු සිදු කළා. අපගේ සමුපකාරය එහාට කළේ නැහැ.දැන් අපගේ නිවස අසළින් නතර කරලා. මෙය හරි ප්‍රශ්නයක්. හිමාල් මහතාණෙනි ඇයිද ඒ

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

මේ කටයුත්ත සිදු කරනු ලැබුවේ මහජන සෞඛ්‍ය නිලධාරි මහතායි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මැතිතුමිය කතා කරමින්**

මහජන සෞඛ්‍ය නිලධාරිතුමා ඇයි සභාවට පැමිණෙන්නේ නැත්තේ. මගේ නිවස ඉදිරිපිට කාණුවේ ජලය තිබෙනවා. මදුරු කීටයන් සමඟ .මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා නඩු දැමිය යුත්තේ නගර සභාවට විරුද්ධවයි.එතැන ඩෙංගු බෝවන ස්ථානයක් නිසා.මා තාක්ෂණසේවා නිළධාරි සඳුන් මහතාට දින කිහිපයක් ප්‍රකාශ කළා. ධම්මකුසල විද්‍යාලය අසළ මාර්ගයේ පිටුපස ජලය පිරී. එම ජනතාවට ගමන් කිරීමට බැහැ. දැන් ඔවුන්ට ඩෙංගු හැදෙනවා.

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

සඳුන් මහතාණෙනි, මේ ගරු මන්ත්‍රීතුමිය දැන් සභා වාර කිහිපයකදීම මේ ගැන කියනවා. මොකද වෙලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මැතිතුමිය කතා කරමින්**

ගියේ නැහැනේ එය බලන්න.

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

ඔබතුමා තාක්ෂණසේවා නිලධාරි මහතානේ. මෙයට විසඳුමක් දීමට බැරි. ඔබතුමාට බැරිද? මෙය කළ හැකි ආකරය කුමක්ද කියා ඔබතුමාට හැඟෙන්නේ කොහොමද ? මෙය දිගින් දිගටම යන ප්‍රශ්නයකි. මේ ජලය බැස්සීමට මොකක්හරි ක්‍රමවේදයක් ඇතිනේ.මේ ප්‍රධාන පාරට වඩා අතුරු මාර්ගයේ පිටුපස පහතයි. එම ජලය ප්‍රධාන පාරට බැස්සීමට බැරිද? ඒ අසළ නිවෙස් වලින් ජලය බැස යාමට හැකිද ?

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය කතා කරමින්**

අසාධාරණයට ලක්වී ඇත්තේ නිවෙස් දෙකක් පමණි. ඒ අය මුදල් වලට සින්නක්කර ඔප්පු වලින් ගත් අය.මේ නළය එළිමට නොදෙන අය පොඩි පර්චස් 10ක් පමණ වෙල ගොඩකර අල්ලා ගත් අයයි. එම නිසා මේ නිවෙස් වල ඉඩම් වලින් යැවිය යුතුයි බටය. මොකද මෙය රජයට අත්පත් කර ගත් ඉඩම්.

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

මෙහි ජලය බැස්සිය යුත්තේ ප්‍රධාන කාණුවටද ? ප්‍රධාන කාණුව උසයිද අර ස්ථානයට වඩා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

පණතේ බලතල දි තිබෙනවා.මහජන පිඩාකාරි තත්වයක් තිබෙනවා නම් පණතේ බලතල ගරු සභාපතිවරයාට තිබෙනවනේ. ඒ අනුව කරන්න මෙය . භය වෙන්න එපා.

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

එතන කාණුවේ සිට කොපමණ දුර තිබෙනවාද ජලය බැස්සවීමට.තාක්ෂණසේවා නිලධාරි මහතා , ලේකම්තුමියත් , මාත්, ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි මැතිතුමියත් මේ ස්ථානය නිරික්ෂණය කිරිමට ගොස් සුදුසු පියවරක් ගැනිමට තීරණය කරන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මැතිතුමා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , සතියේ දින පහේ වැඩසටහන ලබා දුන්නා හෙප්පුමුල්ල ප්‍රදේශයට. ඔබතුමා දන්නේ නැතිව ඇති. ඒ වැඩකටයුතු උපරිම අන්දමින් සිදු කළා. මට සේවකයින් 6 කු ලැබුණා. බැකෝ යන්ත්‍රයත් ලැබුණා. ඒ වැඩකටයුතු සාර්ථකව සිදු කිරිමට කටයුතු කළා හිමාල් මහතා සහ සාරාංග මහතාගේ උපරිම සහායෝගය ලැබුණා. මා එම වැඩ කටයුත්ත දින 4 ½  කින්  සාර්ථකව නිම කළා. එම ගමේ අපි ගිහින් කතා කර එම වැඩ කටයුත්ත සිදු කිරිමට මා බැහැලම හිටියා. මෙය සිදු කිරිමට අපගේ උනන්දුව තිබිය යුතුයි. මේ නිලධාරි මහතුන් සමඟ ගොස් කතා කර අවශ්‍ය කටයුතු සිදු කරගත යුතුයි.ඒ වැඩ ටික කරගැනිමට අපගේ ධෛර්ය ශක්තිය තිබිය යුතුයි.ගමේ අයත් සහායෝගය ලබා දුන්නා. ඒ අයට කෑම බිම දුන්නා.එය සාර්ථක වුවා.

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

එය ඇත්තටම ක්‍රියාත්මක වුණා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

මේ වැඩසටහන ක්‍රියාත්මක වුණා. පොල්වත්ත ප්‍රදේශයේ. පොල්වත්ත ප්‍රදේශයේ කෙළවර තමයි පොල්වත්ත පුර කියන්නේ.කවුරුත් මියගියවිට භූමිදාන කටයුතු සිදු කිරිමට යන්නේ  ඔය සුසාන භූමියට. මිනි වළ දමන ස්ථානය පටන් ගන්න තැනම වළකි.

**මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

අපි හෙට එම වැඩය ආරම්භ කරනවා..

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

බොහොම ස්තුතියි.

මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

තල්ගස්ගොඩ නවත්වා එය ලබා දෙන්න. අනිද්දාට මෙය ලබා දෙන්න. ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතාණෙනි, අපට වඩා ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා මහන්සි වුණා.

ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්

එහෙම කියන්න පුළුවන්. ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා ඉදල ගෙන අතු ගැවා. අපිට ඒ වගේ දේවල් කරගන්න බැරි වුණා. ගමේ ජනතාව මේ සභාවට යොමුකරන ලද ලිපියක් තිබුණා.

**තීරණය**

අම්බලන්ගොඩ ඩිපෝව , ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ඉදිරිපත් කර ඇති ඩෙංගුමදුරු කීටයන් බෝවීම වැලැක්වීම සම්බන්ධ ලිපියට අනුව බැකෝ යන්ත්‍රය ලබාදීම සුදුසු බවත් ,තෙල් ලංගම කාර්යාලයෙන් ලබා ගැනිම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**03.07 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ඕකන්ද ප්‍ර දේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උස් ජල ටැංකියක් ඉදිකරමින් ජලය සැපයීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම හෝ වෙනත් විකල්පයක් යෙදිම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.**

මූලාසනය-ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.අම්බලන්ගොඩ ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති උස් ජල ටැංකියක් ඉදිකරමින් ජලය සැපයීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම හෝ විකල්පයක් යෙදීම.උක්ත කරුණ සම්බන්ධයෙන් ලේකම් නගර සභාව විසින් හා ප්‍රධාන අමාත්‍ය ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා විසින් යොමුකර ඇති ඉල්ලීමට අනුව මවිසින් ඔබ වෙත යොමු කරන ලද ඉල්ලීමට අනුව AEA/AMB/33/05/EAS දරණ 2018.10.174 දිනැති ලිපියට අනුව මෙම උස්බිම වල පිහිටි නිවාස 15 ම සඳහා දිනකට පැය 05ක කාලයක් , බිම් මට්ටම් සඳහා ප්‍රමාණවත් පීඩනයක් යටතේ ජල සැපයුමක් ලැබෙන බැවින් අම්බලන්ගොඩ සේවා ජලාශයේ පවතින පීඩන තත්ත්වය යටතේ එම නිවාස 15 පිහිටි උස් ප්‍රදේශවලට දැනට පවතින ජල සැපයුම් පිඩනය වැඩිදියුණු කිරීම සිදු කළ නොහැකි අතර , ජලය සපයන පැය ගණනද වැඩි කල නොහැකි බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( දකුණ ) විසින් මටද පිටපතක් සහිතව ලේකම් ,නගර සභාව දැනුවත් කර ඇත.පුවත්පත් මගින් අදාල ගැටළුව දිගින් දිගටම හොවා දැක්වීම හේතුවෙන් හා ලේකම් නගර සභාව විසින් දිගින් දිගටම මේ සම්බන්ධයෙන් අප ආයතනය වෙතින් විමසීම් කිරීම හේතුවෙන් ඉහත ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා ඔවුන් ගෙන දැක්වූ යෝජනාවට අදාලව එම ප්‍රදේශයේ පිහිටි ප්‍රජාශාලාව අසල ඉඩමේ Booster Pump House එකක් ඉදිකර ජලය බෙදාහැරිමට යෝජනා වූ නමුත් එම ඉඩම උස් ස්ථානයක පිහිටීම හේතුවෙන් ලැබෙන ජල ධාරිතාවය හා පීඩනය ප්‍රමාණවත් නොමැති බැවින් එම යෝජනාව නොසලකා හැරීමට සිදු විය. එබැවින් විකල්ප පිලියමක් වශයෙන් එම බෙදාහැරීම් නල මාර්ගයට ආසන්නයෙන් දිවෙන පොම්පීකරණ නල මාර්ගයක් සැපයුමක් ලබා දී බොදාහැරීම් නල මාර්ගයේ පීඩනය වැඩිකිරිමට යෝග්‍ය යැයි නිර්දේශ කර ඇත. නමුත් මණ්ඩලීය ක්‍රමවේදයන්ට අනුව පොම්පීකරණ නල මාර්ගයකින් බොදාහැරීම් නල මාර්ග සම්බන්ධ කිරීම සිදු නොකරන නමුත් ඉදිරි වැඩිදියුණු කිරිමක් යටතේ ගැටළුවට ස්ථිර විසඳුමක් ලබාදෙන තෙක් එහි යෝජනාවට අනුව මෙම ගැටළුව නිරාකරණය කර ගැනිමට අවශ්‍ය අනුමැතියක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.ලේකම්, නගර සභාව කියා ලිපියක් ඉදිරිපත් කර ඇත. ගරු සභාපතිතුමා නැවත සභාවට පැමිණෙනවා.

- පස්වරු 12.30 ට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා නැවත සභාවට පැමිණිම.

## ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්

ඊයේ වන විට මෙහි අනුමතිය ලැබුණා. නියෝජ්‍ය සාමාන්‍යාධිකරිතුමියත් මේ වන විට මේ වන විට අනුමතිය ලබා දී තිබෙනවා.ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලීමක් කළා නගර සභාවෙන් . මාර්ගයේ මීටර් 20 පමණ ප්‍රමාණයක් පළුදු වෙනවා. එය යථා තත්වයට පත්වීම අප නගර සභාවෙන් කර ගන්නා ලෙස. මෙම කාර්ය තව සුමාන දෙකකින් පමණ යථා තත්වයට පත් කරන බව. මෙය සියයට සියයක්ම සාර්ථක වේද කියා ගැටළුවක් තිබෙනවා. මේහි නියම ක්‍රමවේදය නෙමේ අනුගමනය කරනු ලබන්නේ මණ්ඩලයෙන් . අපි බලාපොරෝත්තු වෙනවා 90%ක්වත් සාර්ථක වෙයි කියා. විශේෂයෙන්ම ජල සම්පාදන මණ්ඩලයට ස්තුති වන්ත විය යුතුයි. ජල සම්පාදන මණ්ඩලයෙන් නිතියෙන් පිටතට ගිහින් වගේ තමයි පොම්පිකරණ නළ මාර්ගයකින් පිටතට ගිහින් නළ මාර්ගයකට දෙන්නේ නැහැ.නගර සභාවෙන් හා අපේ බලවත් ඉල්ලීම මත හා පුවත්පත් වල පළ වූ දේවල් මත යෝජනා වුණා. ඕකන්ද ජනතාවට ජලය ලැබෙයි.

## ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්

ගරු සභාපතුතිමනි, ඇත්තටම සතුටු වෙනවා. ඕකන්ද ප්‍රදේශයේ ජලය නොමැතිව ජනතාව විදින පිඩාව මේ සභාවේ කතා වුණා.මා අපේ ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතාට මේ අවස්ථාවේ ස්තුති වන්ත වෙනවා.ඕකන්දේ තිබෙන සියළුම සමිති මගින් ලිඛිතව ලිපි මගීන් දන්වන ලදී.ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ලිඛිතව දන්වා යැව්වා.දැඩි උත්සාහයක් ගනු ලැබුවා මෙය ඉටු කර ගැනිමට.කෙසේ වුණත් මෙය සාර්ථකව ඉටු කර ගැනිමට හැකියාව ලැබේවා කියා ප්‍රර්ථනා කරනවා.

## ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්

ගරු සභාපතිතුමනි,ඕකන්ද ජල ප්‍රශ්නය විසදිම සඳහා ක්‍රම උපායක් සැලසීම සම්බන්ධව. විශාල වශයෙන් එදා සිටම තිබු ප්‍රශ්නයකි මෙය.ඉල්ලීම් කළා ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්. එතුමාගෙත් සහායෝගයත් ලැබුණා.ගරු සභාපතිතුමා ප්‍රමුඛ සියළුම ගරු මන්ත්‍රිවරු මෙයට සහායෝගය ලබා දුන්නා.මෙය සාර්ථක වෙයි කියන බලාපොරෝත්තුව තිබෙනවා.ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ප්‍රමුඛ සියළුම ගරු මන්ත්‍රිවරුන්ට ස්තුතිය පුද කරනවා මේ සම්බන්ධව කටයුත කරන්න සහායෝගය කිරිමට කටයුතු කිරිම පිළිබඳ.

## ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

අපේ ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා ජලසම්පාදන මණ්ඩලය පෞද්ගලික හිතවත්කම මත තමයි මෙය ලබා ගනු ලැබුවේ.මා දන්නා තරමට එය ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාගේ පෞද්ගලික දෙයක් ලෙස තමයි ලබා ගනු ලැබුවේ.එතුමා මා සමඟත් දවස් දෙක තුනක් ගියා.මධ්‍යයට ස්තුතිය පුද කරනවා.කරන්න බැරි ව්‍යාපෘතියක් කවදාවත් එවැනි දෙයක් කරන්නේ නැහැ. කෙරමිණියේ පොම්ප කරන එම මාර්ගයේම ජල සැපුයුම් නල මාර්ගය වැඩි දියුණු කිරිමට තමයි හදන්නේ.එහෙම ජල සැපයුම වැඩි කළාම ඒ හරහා මෙම ප්‍රදේශයට ලබා දිය හැකි බව. අපි මේ සභාව නියෝජනය කළා. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා දිගින් දිගටම මේ සභාවේ ඕකන්දට ජලය ලබා ගැනිම පිළිබඳ කතා කළා.මෑත කාලයේ බිහිවූ අපේ ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාට අපේ ස්තුතිය පුද කරනවා.මේ සම්බන්ධව විශාල ගැටළුවක් තිබෙනවා. ඕකන්ද ප්‍රදේශයට ජල සම්පාදනය ලබා ගැනීම සම්බන්ධව.මෙය සාර්ථක වෙයි කියා ප්‍රර්ථනා කරනවා.ඒ සම්බන්ධව එතුමාට අපගේ ස්තුතිය පුද කරනවා.

## ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්

මේ සම්බන්ධව මා ප්‍රකාශ කළ යුතුයි. කතාවක් තිබෙනවා වරක් වැද්දොත් කැළණියේ කරන ලද පව් සමාවෙනවා කියා.මා පොදුජන පෙරමුණේ මන්ත්‍රිවරයෙක් ලෙස තෝරා ගැනිමට ප්‍රධාන හේතුව වුයේ එතුමා ජලසම්පාදන මණ්ඩලයේ රාජකාරි කිරිම නිසායි.අපි ලොකුවට හිතලා ලොකුවට දෙයක් කරන්න ගියාම එය කරන්න අමාරු වෙයි.කාර්යාලයට පැමිණ මගෙන් වැඩේ කර ගන්නවාට වඩා කාර්යාල කාර්ය සහායකගෙන් වැඩේ කරගන්න පුළුවන් කියන එක මා දන්නවා.ඇත්තටම එම කරුණ ඔප්පු කරමින් එම සේවකයොත් සමඟ ලෙන්ගතුකමින් ,

සේවකයන් අශ්‍රය කිරීම මත පෞද්ගලිකවම එතුමාගේ කටයුත්තක් සේ සලකා මේ කටයුත්ත කර ගැනීමට හැකි වුණා. මෙතුමා කරන ලද යෝජනාව කලිනුත් කරන්න තිබුණා. මේ ප්‍රශ්නය ගැන මුහුණ දිලා මේ වැසියන්ගේ එම ප්‍රශ්නයට මුහුණ දීමට එතුමාට හැකිවීම ගැන මා සතුටු වෙනවා. ඔබතුමා එදා දුර දැක්ම අද හරියි කියන එක ප්‍රකාශ කර සිටිනවා.ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් කළ යුතු උපරිම සේවය කළ බව මා ප්‍රකාශ කරනවා.කැළණි ගොස් ඇවිත් කරපු පව් අවසන් කියා සිතන ආකාරයට තම ප්‍රදේශයේ ජනතාවට කළ යුතු සේවය 99.9%ක්ම ඔබතුමා ඉටු කළ බව මා සිතනවා.මේ මාර්ගය කැඩීම පිළිබඳ යන වියදම සභාව විසින්ම දරා ගන්නා ලෙස සියළුම ගරු මන්ත්‍රීවරුනගෙන් ඉල්ලීමක් කරනවා. ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යන වියදම අපි සභාව විසින් දරා ගැනීමට කටයුතු කරන්න. මීට ඉහතදි මෙවැනි පොදු නළයක් සකස් කිරීමේදී මාර්ගය පළුදු කිරීම සඳහා යන වියදම සභාව විසින් අතහැර දමා තිබෙනවා.මේ කටයුත්තත් පොදු කටයුත්තක් සේ සලකා ඕකන්ද ප්‍රදේශයේ ජනතාවට ජලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.කෙරමිණියේ ඉදිකරන ලද ජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා මා යම් වැඩ කොටසක් සිදු කරනු ලැබුවා.ප්‍රධානම ප්‍රශ්නය වෙලා තිබුණේ අම්බලන්ගොඩ ජල ටැංකියෙන් තමයි කොස්ගොඩ පියගම දක්වාම ජලය බොදා හරිනු ලැබුවේ.අපි ටැංකියවසා දමා නැවත විවෘත කරපු ගමන් කොස්ගොඩ පියගම ප්‍රදේශය එම ස්ථානයේ ජලපොම්පාගාරයේ ජලය ගිය ගමන් අඩි 4ක් පමණ සීමාවක ජලය වැටෙනවා .මේ සීමාව පැය 24 ම නිසි අයුරින් තබා ගැනීමට ජලසම්පාදන මණ්ඩලයට බද්දේගම සිට ජලය පොම්ප කිරීමට සිදු වුණා.මෙම ජල ටැංකිය ඉදිකරනු ලැබුවේ අම්බලන්ගොඩ නගරය උදෙසා. එම නිසා අම්බලන්ගොඩ ජනතාවට ලැබිය යුතු ජලය ටික ආරක්ෂා විය යුතුයි. ආරක්ෂා වීම උදෙසා මා යෝජනාවක් වශයෙන් කළා .බලපිටිය ප්‍රදේශයට යන ජලය වෙනම පොම්පාගාරයක් ඉදිකර එතැනින් පොම්ප කර ලබා දෙන්න.මේ ටැංකියේ ජලය නොමැති වූ විට ගම්වැසියන්ට ජලය නැතිවෙනවා.ඔය කෙරමිණියේ ඉදිකරනු ලැබූ ජල පොම්පාගාරය ඉදිකරනු ලැබුවේ ඒ විදියට තමයි.දැන් ඇත්තටම අපේ ටැංකියෙන් නෙමේ බලපිටිය ප්‍රදේශයට යන්නේ. අපගේ මේ පොම්පාගාරය හරහා වෙනම පොම්ප වී එම ජලය යනවා.එයින් ඔවුන්ට වාසියක් ලැබුණා. සමස්ත අම්බලන්ගොඩ අයත් සමඟ බෙදා ගත් දේ තිනියම ඒ ජනතාවටත් තනියම ජලය ලබා ගන්න අවස්ථාව ලැබුණා.මා ඔය පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම ලබා දුන්නේ මාගේ ඥාතිවරයෙකුගෙන් . මුලින්ම ඉඩමක් අවශ්‍යයි කිවූ විට ඔවුන් ඉල්ලා සිටියේ මාගේ සීයා ලබාදුන් ඉඩමකි. නමුත් මට ඒ ඉඩම විකිණීමට අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. ඒ ඉඩම වෙනුවට මාගේ තවත් ඥාතියෙකුට කතා කර මේ ඉඩම ජලසම්පාදන මණ්ඩලයට ලබා දී තමයි ඔය කටයුත්ත සිදු කළේ. එම නිසා ඔය කටයුත්ත තුළ ඕකන්ද ප්‍රදේශයේ ජනතාවටත් යම් සහනයක් ලබා දීමට හැකිවීම ගැන අපි සතුටු වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඔය ප්‍රශ්නය ගැන ඌනපූරණයක් තිබෙනවා කතා කරන්න. මේ පිළිබඳව අප සතුටු වන මොහොතේ මේ ගැටළුව පිළිබඳ ඉංජිනේරුවන්ට කලින් මේ දුර දක්නා නුවණින් මේ කටයුත්ත සිදුකරන්න මේ ක්‍රම උපාය සොයා ගනු ලැබුවේ අපගේ ගරු උප සභාපතිවරයායි. මට මතකයි අපේ නියෝජ්‍ය සභාපතිවරයා මේ කෙරමිණියේ ප්රදේශයේ ඇති ජල පොම්පාගාරය හරහා ඕකන්ද ප්‍රදේශයට ජලය ලබා දිය හැකි බව කිහිප වතාවකම ප්‍රකාශ කළා. එතුමාටත් මීන් වැඩි කොටසක් ඉටු විය යුතුයි ගෞරවයේ.

**තීරණය**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ඕකන්ද ප්‍රදේශයේ ප්‍රමාණවත් ධාරිතාවක් නොලැබීම සම්බන්ධව කරන ලද ඉල්ලීම් වලට අනුව විකල්ප පිලියමක් වශයෙන් එම බෙදාහැරීම් නල මාර්ගයේ පීඩනය වැඩිකිරීමට යෝග්‍ය බව නිර්දේශ කර ඇති ලිපිය සඳහා ගරු සභාවේ අනුමතිය ලබා දුන් අතර එකී ව්‍යාපෘතිය ක්‍රියා කිරීම සඳහා නල මාර්ගය යෙදීමේදී මාර්ගය පළුදු කිරීම සඳහා වැයවන මුදල ගරු සභාව විසින් දැරීම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**03.08 ගා/පී.ද.එස්.කුලරත්න විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමා විසින් විද්‍යාලයේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිළිබඳව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය මගින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය , අම්බලන්ගොඩ ගා/පී.ද එස්. කුලරත්න විද්‍යාලයේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරිම. උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබටද පිටපතක් සහිතව මා ඇමතු අම්බලන්ගොඩ ගා/පී.ද එස්. කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිගේ 2019.05.10 දිනැති ලිපිය හා බැදේ. ඒ අනුව විදුහල්පති විසින් බස්රථ ගාල් කිරිම සඳහා ඉල්ලා ඇති භූමියේ අයිතිය අම්බලන්ගොඩ නගර සභාව සතු වේ නම්, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගෙන කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ ඉල්ලිම පරිදි කටයුතු කිරිම සුදුසු බව ප්‍රාදේශිය ලේකම්තුමිය නිර්දේශ කර ඇත. ඒ අනුව ඉදිරියේදි කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

ප්‍රාදේශිය මහාලේකම් කාර්යාලය මඟින් ගා/පී ද එස් කුලරත්න විද්‍යාලයේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරිම සම්බන්ධව බස් රථ ගාල් කිරිම සඳහා ඉල්ලා ඇති ඉල්ලිම අනුව වනජිවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන කටයුතු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව  ලදුව සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**03.09 2019.05.25 දින කෙරමිණිය ප්‍රදේශයේ හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහන  සඳහා ලද ආදායම් වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

හිඟ වරිපණම් එකතුකිරමේ ආදායම් විස්තරය. 2019.05.25 දින හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහන කොට්ඨාශ අංක 13 කොටසක් වන කෙරමිණිය ප්‍රදේශයේ සිදු කරන ලදී. එම ජංගම වැඩසටහන සිදු කරන ලද දිනයේ රු..197462/= ක මුදලක් එකතු කරන ලදි. ඊට අමතරව මෙම ජංගම වැඩසටහනට ආදාලව තැපැල් කරන ලද ලිපිවලට අදාලව කාර්යාලයට ගෙවන ලද මුදල රු44002/=  . ලිපිවලට අදාලව තවමත් කාර්යාලයට මුදල් ගෙවමින් පවති. ඒ අනුව 2019.05.25 දින පවත්වන ලද හිඟ වරිපනම් එකතු කිරිමේ ජංගම වැඩසටහනට අදාලව මේ වන විට එකතු වි ඇති මුළු ආදායම රු241464/= කි.එය සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ නිලධාරින් බොහොම උනන්දුවෙන් කටයුතු කළා. ඒ වගේම අප ගම්වැසියෝ නිතිගරුකයි. මේ රු.197463/= ක මුදලක් ගෙවනු ලැබුවා බොහොම පරිත්‍යාගශිලි ලෙස. මේ අදාල බල ප්‍රදේශය තුල එකතු කරන මුදල එම ප්‍රදේශයේ දැවෙන ප්‍රශ්නයකට යෙදවීමට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

මා මිටවඩා වැඩි මුදලක් සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන්නම්.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ 2019.05.25 දින හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහන කොට්ඨාශ අංක 13 කොටසක් වන කෙරමිණිය ප්‍රදේශයේ සිදු කරන ලද හිඟ වරිපණම් එකතු කිරිමේ ආදයම් විස්තරය ගරු සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී

**03.10 හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම සේවය  කොට්ඨාශ 13 සඳහා අනුමතිය ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ඝන වරිපණම් එකතු කිරීමේ ජංගම වැඩසටහනක් කොට්ඨාශ 13 කොටසක් වන තල්ගස්ගොඩ ප්‍රදේශයේ 2019.06.29 දින සිදු කිරීමට නියමිතව ඇත. ඒ සඳහා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ ඝන වරිපණම් එකතු කිරීමේ ජංගම වැඩසටහන 2019.06.29 දින කොට්ඨාශ අංක 13 කොටසක් වන තල්ගස්ගොඩ ප්‍රදේශයේ සිදු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදී .

**03.11 අම්බලන්ගොඩ ලංකා බැංකුව අසල ත්‍රී රෝද රථ රියදුරන්ගේ සංගමය මඟින් පවත්වන පොසොන් මහා බත් දන්සැල් සඳහා ක්‍රීඩාංගණයේ උඩ කොටස වෙන්කර ගැනීමට ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ලංකා බැංකුව අසළ ත්‍රී රෝද රථ රියදුරන්ගේ සංගමය විසින් පොසොන් මහා බත් දන්සැල් සඳහා ක්‍රීඩාංගණයේ උඩ කොටස වෙන්කර ගැනීම. අප සංගමය මෙවරත් පොසොන් පොහොය යෙදී තිබෙන 2019 ජූනි මස 16 වන දින දිවා මහා බත් දස්සැලක් පැවැත්වීමට කටයුතු සුදානම් කොට ඇත. මීට පෙර වසර දෙකකදී දිවා බත් දන්සැල පැවැත්වීම සඳහා ඔබතුමා ක්‍රීඩාංගණයේ උඩ කොටස වෙන් කොට ලබා දීමෙන් දැක් වූ සාදර අනුග්‍රහයට ඔබතුමාට අප සංගමයේ හදපිරි ගෞරවණිය ස්තුතිය පිරිනමන අතර මෙවරත් ක්‍රීඩාපිටියේ එම උඩ කොටස ලබා දෙන ලෙස ඉතා ගෞරව පූර්වකව ඉල්ලා සිටී. බුදු දහමට නිසා දෙන මෙවැනි යුගයක අප සංගමය දැලුවූ පහන් වැටක් සේ සිදු කරන මෙම කාර්යට ඔබතුමාගේ පූර්ණ සහායෝගය ලබාදෙන මෙන් ඉල්ලා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඇත්ත වශයෙන්ම පොසොන් පොහෝය දින දන්සැලක් දෙන එක ඉතා හොඳ කාර්යයකි. මේ රටේ ඇති වි තිබෙන තත්ත්වය අනුව. නමුත් මොවුන් ඉල්ලා සිටින්නේ ලංකා බැංකුව අසළ ත්‍රි රෝද රථ රියදුරන්ගේ සංගමය කියා නම් කර ගෙන ඇති සංගමයක් මඟින්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ඒ අය ලිපිය එවා ඇත්තේ ඒ නම යොදා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එහෙම ලංකා බැංකුව අසළ කියා සභාවේ නම්කර ගන්න එපා.දන්සැල සඳහා එම භූමිය ලබා දෙන්න.ඒ සදහා ත්‍රී රෝද රථ ගාලක් කියා නම්කරන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

රථගාල් නම්කිරීමේ බලය තිබෙන්නේ සභාවට .සභාව විසින් එම රථගාල් නම්කරන විට නම්කළ හැක. දැනට මෙම ස්ථානය අනුමත රථගාලක් ලෙස නම්කර නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ලිඛිතව දැනුම් දීමක් ලබා දෙන්න . මෙහි අනුමත රථ ගාලක් නොමැති බව. මේ වන විට මේ ස්ථානයේත් ත්‍රි රෝද රථ ගාලක් තිබෙනවා. මුළු නගරයේම ත්‍රි රෝද රථ ගාල් කිරිමට ඉඩ දෙන්න බැහැ. එම නිසා මා ඉල්ලීමක් කරනවා ඒ අයගේ ත්‍රී රෝද රථ ගාල කියන එක සම්පූර්ණයෙන්ම අයින් කරන්න.දන්සැල පැවැත්වීම

සඳහා එම ස්ථානය ලබා දෙන්න. නමුත් ලංකා බැංකුව අසළ ත්‍රී රෝද රථ ගාල කියන එක මේ සභාවේ ඉල්ලා අස්කරන ඉල්ලා සිටිනවා.. මේය අනුමත කළ නොහැක.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්**</u>

ත්‍රී රෝද රථ ගාල කියන එක වාර්තා සියල්ලෙන්ම ඉවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

පොසොන් මහා බත් දන්සැල සඳහා 2019 ජූනි මස 16 වන දින ( පොසොන් පොහොය දින)දිවා මහා බත් දන්සැල පැවැත්වීමට මහජන ක්‍රීඩාංගනයේ උඩ කොටස වෙන්කර දීම සුදුසු බවත් , අම්බලන්ගොඩ ලංකා බැංකුව අසළ නගර සභාවේ අනුමත ත්‍රී රෝද රථ ගාලක් නොමැති බව දන්වා යැවීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදී .

03.12 අම්බලන්ගොඩ නගරයේ අලංකරණය සඳහා ගාලු පාර දෙපස මල් වැවීමේ ව්‍යාපෘතිය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගරෙය් අලංකරණය සඳහා ගාලුපාර දෙපස මල් වැවීමේ ව්‍යාපෘතිය සඳහා 2018.07.03 දිනැති අංක 03.08 දරණ සභා තීරණය මගින් අනුමැතිය ලැබුණු නමුත් ප්‍රායෝගිකව එම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ දි ගැටළු ඇතිවිය හැකි බව ප්‍රකාශ වු බැවින් ක්‍රියාත්මක නොවුණි.නගර අලංකරණ ගිණුමේ ඇති මුදල් කිසිදු ව්‍යාපෘතියකට වැය නොකිරීම සම්බන්ධව විගණන විමසුමකට ද ලක් වි ඇති බැවින් උක්ත ව්‍යාපෘතිය සඳහා ලැබුණු සභා තීරණය වෙනුවට පහත සඳහන් ව්‍යාපෘති සකස් කර ඒවා ක්‍රියාවට නැංවීම තුලින් එම මුදල් වියදම් කිරිම සුදුසුයැයි යෝජනා කර ඇත. අම්බලන්ගොඩ නගර සභා කාර්යාල පරිශ්‍රය අලංකාර කිරිම, නගර සභාව සතු සුසාන භූමි අලංකරණය කිරිම. යනුවෙන් පරිසර සංවර්ධන නිලධාරි විසින් ඉල්ලිමක් කර ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ නගරය අලංකරණය කිරිම සම්බන්ධව 2018/07/03 දිනැති අංක 03.08 දිනැති සභාතිරණය මගිනක් අනුමතිය ලැබුණත් එම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සිදු නොවු නිසා එම ලැබුණු සභා තීරණය වෙනුවට අම්බලන්ගොඩ නගර සභා කාර්යාල පරිශ්‍රය අලංකාර කිරිම , නගර සභාව සතු සුසාන භූමි දෙක අලංකරණය කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදී

**03.13 Digital Camera වක් ඉල්ලා සිටිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභාව සඳහා දැනට නිල වෙබ් අඩවියක් සහ නිල වෙබ් ජාලාවක් පවත්වාගෙන යනු ලැබේ.එම ක්‍රියා පිළිවෙත යාවත්කාලින කිරිම හා සාර්ථකව කරගෙන යාම සඳහා කාර්යාලිය අවශ්‍යතාවය සඳහා අප කාර්යාලයට Digital Camera වක අවශ්‍යතාවය දැඩිව පවති. ඒ සඳහා අප කාර්යාලයට Digital Camera වක් ලබා දෙන ලෙස ඉල්ලිමක් කර ඇත.එම ඉල්ලිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා. මෙතෙක් කල් අප පාවිච්චි කරනු ලැබුවේ එන්.ජී.ඕ. එකෙන් ලැබුණු එකක්. දැන් එය කැඩි ඇත. මිළ ගණන් කැඳවා හොඳ එකක් ලබා ගන්න.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව සඳහා Digital Camera වක් ලබාදීම සුදුසු බවටත්, ඒ සඳහා මිළ ගණන් කැඳවා හොඳ වර්ගයේ එකක් ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව අනුමතිය ලබා දෙන ලදී .

## 03.14 කසළ බැහැර කිරීමේ විශේෂ ව්‍යාපෘතියේ සේවකයින් සඳහා( 1200) අතිකාල ගෙවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>

මෙම නගර සභාවේ සෞඛ්‍ය අංශයේ කසළ බැහැර කිරීමේ කාර්ය සඳහා අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් ප.පා.කො.ගේ දපස/ප්‍රඅ/පපා/04/06/01 හා 2017.07.31 දිනැති ලිපියට අනුව ලියාපදිංචි කර සේවකයින් බඳවාගෙන ඇත. ඔවුන් සඳහා රු.1200/= ක දෛනික දීමනාවක් ගෙවනු ලබයි.සේවකයින් ප්‍රමාණවත් නොවීම මත මෙම සේවකයින් රාත්‍රී කාලයේද අතිකාල සේවාවේ යෙදවීමේදී කම්කරු හා රියදුරු , විශේෂ ව්‍යාපෘති කම්කරු හා රියදුරු , සඳහා ලැබෙන අතිකාල දිමනාව සමඟ විශාල පරස්පරතාවයක් පවතින බැවින් විමර්ශන නිලධාරි මහතාගෙන් දුරකථනය මගින් විමසන ලද අතර කම්කරු ආරම්භක වැටුප පදනම් කරගෙන ඔවුන්ටද අතිකාල ගෙවන ලෙස විමර්ශන නිලධාරි විසින් පවසන ලදී. ඒ අනුව කම්කරු වැටුප පදනම් කරගෙන ඔවුන්ටද අතිකාල ගෙවීම සුදුසු යැයි යෝජනා කරන අතර උපදෙස් සඳහා ඉදිරිපත කරනවා. දැන් මෙහෙමයි වෙලා තිබෙන්නේ. මා දන්නා විදියට පැහැදිලි කර දෙන්නම්. අපේ සාමාන්‍ය කම්කරුවෙකුගේ වැටුප රු.391/=කි.මේ ව්‍යාපෘතිය යටතේ බඳවා ගන්නා අයගේ වැටුප රු.1200/= කි.මේ රු391/= ක මුදලින් තමයි ඔවුන්ට අතිකාල දිමනා ලැබෙන්නේ.මේ අය කළ විට රු.1200/= න් තමයි බෙදෙන්නේ.එකම කාර්ය කරන සේවකයන් අතර විශාල පරතරයක් තිබෙනවා.මෙය අනෙක් සේවකයා ගන්න පදනමින් මෙය නිත්‍යානුකූලව සිදු කරන්න බැහැ.මේ අය යෝජනා කර සිටිනවා රු391/= මුදලට මේ අයටත් අතිකාල කරන්න ඉඩදෙන ලෙස.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ඔබතුමා ප්‍රකාශ කළ ආකාරයට රු.1200/= ක මුදල 8න් බෙදා ලබාදෙන එකයි , මේ ශේෂය යටතේ දෙන එකයි අතර වෙනසක් තිබෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>

අපි කම්කරු නිතිය යටතේ ගියවිට ඒ අයට රු.1200/= නම් රු.1200/= ක මුදල 8 න් බෙදිම තමයි සිදු කළ යුත්තේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ස්ථිර සේවකයින්ට ගෙවන්නේ රු.391/= වැටුප පදනම් කරගෙන නේද ? එය බෙදිම 8 වැඩිකිරිම 1.2 නේද ? එහෙම වෙන්නේ . එතකොට අර අයටත් එම ගණනම එනවා.අපේ දිමනාව දෙන සේවකයන්ට එහෙම ගෙවන්නේ නැහැනේ.අනික් කරුණ නම් අපේ ස්ථිර සේවකයින් අතිකාල පැය 80 වැටුණු පසු වැඩට එන්නේ නැහැ.එවිට අපට යොදවන්න වෙන්නේ දිමනාව ගෙවන සේවකයන් විතරයි.මා දන්න රියදුරු මහතුන් දෙතුන් දෙනෙක් සිටිනවා. ඔවුන් අතිකාල පැය 80 සම්පූර්ණ වු විට වැඩට එන්නේ නැහැ. නවතිනවා. ඉන් සිදුවන්නේ අපේ නගරයේ සංවර්ධන වැඩ කටයුතු නතර කිරිමට සිදු වෙනවා. එහෙම සේවකයින් සිටිනවා නම් නිසි දඬුවමක් ලබා දෙන්න. සෞඛ්‍ය අංශය ඔබලා පාලනය කරන නිසා මේ පිළිබඳව ගරු සභාපතිතුමාට හෝ ලේකම්තුමියට දැනුම් දිය යුතුයි. එසේ සිදු නොවිම නිසා මා දින කිහිපයක් පැමිණ ඔබට කැගැසුවා.ඒ අවස්ථාවේ ඔබ මට එම ප්‍රශ්නය කියනවා. ඒ අවස්ථාවේ එය ප්‍රකාශ කර වැඩක් නැහැ. ඒ පිළිබඳව ගරු සභාපතිතුමා හෝ ලේකම්තුමිය දැනුවත් කළ යුතුයි.මේ පිළිබඳව සොයා බලා ඉතා ඉක්මනින් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

සාරංග මහතා නේද මේ සඳහා සේවකයන් යොදවන්නේ.යොදවන විට මේ තත්ත්වය වලකින විදියට යොදවන්න.ඔය සේවකයන්ට මුල් අවස්ථාවේ අතිකාල දෙනවාට වඩා හොඳයි අවසාන අවස්ථාවේ අතිකාල ලබා දෙන එක.එතකොට නිවාඩු ගන්න බැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්</u>**

අතිකාල ගෙවීම සම්බන්ධව අප සභාවට ප්‍රශ්නයක් පැමිණිමට පුළුවන.රු.1200 කට්ටියට අතිකාල ගෙවලත් අපට ප්‍රශ්නයක් පැමිණිමට පුළුවන. 8න් බෙදා අතිකාල ගෙවන ක්‍රමයක් නැහැ.එය 1.5න් වැඩිකළ යුතුයි.එතනත් ප්‍රශ්නයක් තිබෙනවා. කවදාහරි දිනයක ඒ අය නඩුවක් දැමුවහොත් අපට ගෙවන්න සිදුවෙයි.මේ සඳහා රු.391 වැටුපේ තබා පැමිණිමේ දිමනාව හරි මොකක් හරි එකතු කරලා එය 1.5 වැඩි කළානම් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.රු.1200ට 8න් බෙදා අතිකාල ගෙවන්න බැහැ. එහෙම ගෙවන ක්‍රමයක් නැහැ.එය 1.5 න් වැඩි විය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

රජයේ ආයතන වල අතිකාල ගෙවන විට ඔවැනි තින්දු ගැනිමට බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා ආයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

දිමනාවකට අතිකාල ගෙවිය නොහැක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ක්‍රමවේදය ඔබතුමිය ක්‍රියාත්මක කළාද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

එම ක්‍රමවේදය සැදිය යුත්තේ රජය විසින් අපට ලබා දී ඇති චක්‍රලේඛ අනුව මිස අපට ඕන විදියට සැදිය නොහැක.එම නිසා ලේකම්තුමිය එය බලා නිත්‍යානුකූල පදනම මත එය කරන්න.

**තිරණය**

කසළ බැහැර කිරීමේ විශේෂ ව්‍යාපෘතියේ සේවකයින් සඳහා( 1200) අතිකාල ගෙවිම සම්බන්ධව ගරු ලේකම්තුමිය මේ ගැන නිත්‍යානුකූල පදනම මත එය සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**04.** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** :- නැත

**05.** **යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**05.01 සභිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

05.01.01 අම්බලන්ගොඩ නගර සභාව මගින් අම්බලන්ගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කර ඇති මුදල් වලින් රු.3500000/= මුදලක් ආපසු ලබා ගැනීම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එය ගන්නේ කුමකටද ?

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>

මෙය ගිණුම් අංශයෙන් තමයි අපට එවනු ලැබුවේ . ගෙවීම් කටයුතු සිදු කිරිමට.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>

ඒ කියන්නේ ව්‍යාපෘති කටයුතු වලට

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>

නැහැ. දැනට ඉදිරිපත් වි ඇති ගෙවීම් කටයුතු සිදු කිරිමට.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

එහෙනම් කරුණාව කියා ඇති නේද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ඔබතුමා පැහැදිලි කළානම් හරි. ස්ථිර තැන්පතු කියන්නේ සභාපතිතුමා ලැබෙන මුදල් සියල්ල ස්ථිර තැන්පතු දමනවා. මේ සභාවේ ආර්ථිකය යහපත් කිරිමට. මෙය ගරු සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට දැන ගන්න පැහැදිලි කළානම් හරි.මේ ස්ථිර තැන්පත් දැම්මට වැඩ කළ විට ගෙවන්න මුදල් ගන්න වෙනවා. ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රීවරුන්ට සභා වාර්තා සමඟ යවන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>

අපි සාමාන්‍යයෙන් එදිනෙදා වියදමට අවශ්‍ය නොවන අතිරික්ත වන මුදල ස්ථිර තැන්පතු සඳහා තැන්පත් කරනවා.එයින් යම් පොළියක් ඇත්ත වශයෙන්ම ලැබුණා.අපේ සේවකයින් 200 ක් පමණ සිටිනවා. අපගේ අවුරුදු දීමනා වශයෙන් එක් කෙනෙකුට රු.10000/= ක මුදලක් දිමට සිදු වුණා.ඊට අමතරව සේවකයන්ට ණය ලබා දෙනවා. එම ණය ලබා දිමත් ඉතාම පහළ මට්ටමක තිබුණේ. දැන් එහෙම නැහැ. එම පොළිය අපි යොදවා තිබෙනවා මේ සේවකයන්ගේ එම ප්‍රශ්නය විසඳිම සඳහා.එය විසඳා දෙනවා නම් එම මුදල් ටික අපේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යෙදවිය හැකිය.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපි මේ පිළිබඳව අසන්නේ මෙහි ස්ථිර තැන්පත් තිබෙන නිසා පොළිය අහිමි වෙන නිසා.එම නිසා තමයි අහන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>

දැන් අපිට ගෙවිම වගයක් තියෙනවා.එම නිසා තමයි මොවුන් මුදල් ඉල්ලා සිටින්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

මෙහි නිලධාරින් ලියා ඇති නේද ? මොකක්ද කරුණ කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

එම කාර්ය සඳහා මුදල් යොදවන්න අනුමතිය ඉල්ලා සිටින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

අනුමතිය දෙනවා. ඒ මොකක්ද කියා පැහැදිලිවම ප්‍රකාශ කළානම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

මේ වන විට පොදු ගිණුමේ ගෙවීම් සඳහා බිටුමික්ස් ආයතනයට ගෙවීම් සඳහා රු.800000/= ක මුදලකුත් , ආරක්ෂක අංශයට ලක්ෂ රු250000/= කුත් ලෙස , රු.1100000/= කුත් ප්‍රාග්ධන ගිණුම මඟින් සහා අරමුදල් යටතේ ගෙවීම් කිරිමට රු.2000000/= ක ගෙවීම් කිරිම සඳහා වවුචර් සකස් කරමින් පවතින බව විෂය නිලධාරි විසින් පවසන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

එහෙනම් නිර්දේශ කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

එම මුදල් වෙනදා තිබෙන්නේ සාමාන්‍ය ගිණුමේ. එම නිසා පොළි හම්බ වුයේ නැහැ.

**තිරණය :-**

අම්බලන්ගොඩ නගර සභාව මඟින් අම්බලන්ගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කර ඇති මුදල් වලින් රු.3500000/= මුදලක්, ප්‍රාග්ධන ගිණුමට රු.2000000/= ක් හා පොදු ගිණුමට රු.1500000/= ක් ගෙවීම් කටයුතු සිදු කිරිම සඳහා ආපසු ලබා ගැනීම සුදුසු බවටත් ,ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.02 අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිමට ( අදියර 01) කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිම ( අදියර 01) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.03 අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිමට ( අදියර 02) කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිම ( අදියර 02) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.04** **අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිමට (අදියර 03) කරන ලද යෝජනාව සහාගත කරන ලදී**

**තිරණය :-**

අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිම ( අදියර 03) සුදුසු බවට ගරු සහාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සහාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු සහාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.05** **අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ගාමිණි විද්‍යාල මාවත පැතිබැම්ම ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සහාගත කරන ලදී**

**තිරණය :-**

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ගාමිණි විද්‍යාල මාවත පැතිබැම්ම ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සහාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සහා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු සහාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.06** **අම්බලන්ගොඩ ගාමිණි විද්‍යාල මාවත කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සහාගත කරන ලදී**

**තිරණය :-**

කළුවඩුමුල්ල ගාමිණි විද්‍යාල මාවත කොන්ක්‍රිට් ආවරණ පුවරුව ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සහාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සහා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු සහාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.07** **ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො01) ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සහාගත කරන ලදී**

**තිරණය :-**

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො01) ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සහාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සහා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු සහාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.08** **ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො02) ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සහාගත කරන ලදී**

<u>**ගරු නගර සහා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්**</u>

ගරු සහාපතිතුමනි, මේ කලින් සහාවේ අනුමත වු දේවල් . මේ සඳහා ඇස්තමේන්තු සැකසු නිලධාරිණිය ස්ථාන මාරු ලබා ගොස්. ඒවත් රැගෙන ගොස්. මෙවා එම නිසා කඩා ඉදිරිපත් කර ඇත. නැතිනම් ගරු අනික් මන්ත්‍රිවරු මේ පිළිබඳව විමසයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා නම් විරුද්ද වෙනවා. සෑම කොට්ඨාශයටම සමානව බෙදිය යුතුයි. එකම හැන්දෙන්. මෙහි බැලුවොත් හැම එකක්ම ඕකන්ද ප්‍රදේශයටයි.මා ගරු සභාපතිතුමාගෙනුත් , ලේකම්තුමියගෙනුත් ඉල්ලා සිටිනවා මෙවැනි සංවර්ධන කටයුතු සිදු කරන විට යම්කිසි ක්‍රමවේදයක් තිබිය යුතුයි.සෑම කොට්ඨාශයකටම සමානව තිබිය යුතුයි

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

අපි සෑම කොට්ඨාශයක්ම අපේ කොට්ඨාශයක් ලෙසයි සිතන්නේ. ඔබතුමියගේ කොට්ඨාශය කුමක්ද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩට කළේ නැහැ තවම. මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ කියනවා විතරයි. සංවර්ධන වැඩක් කෙරුණේ නැහැ. ගරු මහ ඇමතිතුමාට ස්තුතිවන්ත විය යුතුයි. එතුමාගේ මූලික වී තමයි මහ අම්බලන්ගොඩ සංවර්ධන කටයුතු සිදු වුයේ. ගරු සභාපතිතුමනි, මා ගරු මන්ත්‍රීවරුන්ටත් ප්‍රකාශ කර සිටිනවා අපි කොට්ඨාශ 13 නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් වශයෙන් කටයුතු කරන විට සියළුම කොට්ඨාශ සංවර්ධන කටයුතු සිදු කිරිමට ප්‍රමුඛස්ථානය දී කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

අපි ඔබතුමියටත් ස්තුතිවන්ත වෙනවා.එතුමාගෙන් මුදල් ටිකක් ලබා ගැනිමට ධෛර්ය තිබුණු එකම ගරු මන්ත්‍රිවරිය නිසාත් ඒ පක්ෂයේ තවත් ගරු මන්ත්‍රිවරු 2ක් සිටිනවා. ඔවුන්ට මුදල් දුන්නේම නැහැ.ඔබතුමියට විතරක් සැලකිම පිළිබඳ අපි සතුටු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමා ප්‍රකාශ කරනවා අනෙක් ගරු මන්ත්‍රීවරු දෙදෙනාට ගරු ප්‍රධාන අමාත්‍යතුමා කළේ නැහැ කියා. මට කියන්න පුළුවන් පොල්වත්ත ප්‍රදේශයට කළා.නුගේතුඩුවේ අතුරු මාර්ගයට රු900000/= වියදම් කර විදුලිය ලබා දුන්නා.පොල්වත්ත බුද්ධ දත්ත විද්‍යාලය අසළ පස්කියුබ් රු.700000/= වියදම් කර එම ස්ථානය හැදුවා. ගිනිගේ මහාතාගේ දුවගේ නිවසට යන මාර්ගය හැදුවා. ගියවසරේ පොල්වත්ත ප්‍රදේශයට වැඩකළේ නගර සභාවෙන් නෙමේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මුදලින්. එය මට ප්‍රකාශ කිරිමට අවශ්‍ය වුයේ ඔබතුමා දැන් ප්‍රකාශ කලානේ මේ මන්ත්‍රිවරුන්ට ඉටු කළානේ. එච්චරයි මට කියන්න තියෙන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

අපි හොරාට කරපුවා දන්නේ නැහැ. අපි කියන්නේ එළිපිට කරන ලද දේවල්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

මට ඇත්තටම කරන්න දෙයක් නැහැ. කලින් අපිට කර තිබෙනවා . ඔබතුමාත් හිටියනේ. රැකියාවල් ලබා දී තිබෙනවා 35ක් පමණ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

නැහැ . අපි එකතු වි වැඩ කටයුතු සිදු කරන්න.

**තිරණය :-**

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො02) ඉදිකිරිමේ කර්මන්තය සභා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.09 ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො03) ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදු කිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො03) ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.10 ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො04) ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො04) ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.11 අම්බලන්ගොඩ විහාරගොඩ පාරේ හරස් කාණුව ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

අම්බලන්ගොඩ විහාරගොඩ පාරේ හරස් කාණුව ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.12 හල්වතුර වාහන සේදුම් ස්ථානය ඉදිකිරිමේ කර්මන්තය කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

හල්වතුර වාහන සේදුම් ස්ථානය ඉදිකිරිමේ කර්මන්තය සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

**05.01.13 කසළ තුනි කිරිම Dozer D-04 Tralelive යන්ත්‍රය ලබා ගැනිම සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

කසළ තුනි කිරිම Dozer D-04 Tralelive යන්ත්‍රය ලබා ගැනිම සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.14** **මහ අම්බලන්ගොඩ පුස්තකාලය අසළ කාණුව ඉදිකිරිම සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

මහ අම්බලන්ගොඩ පුස්තකාලය අසළ කාණුව ඉදිකිරිම සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.15** **සුදුවැල්ල පාර ප්‍රතිසංස්කරණය කිරිම ( වැඩිපුර වැඩ සඳහා ) සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

සුදුවැල්ල පාර ප්‍රතිසංස්කරණය කිරිම ( වැඩිපුර වැඩ සඳහා ) සහා අරමුදලින් සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

**05.01.16** **හල්වතුර ළමා උද්‍යානයේ ඇතුල්වීමට ( Cover Slab) සකස් කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදුකිරිමට කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

**තිරණය :-**

හල්වතුර ළමා උද්‍යානයේ ඇතුල්වීමට ( Cover Slab) සකස් කිරිමේ කර්මාන්තය සිදුකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

05.02 ගරු නගර සභා මන්ත්‍රි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය විසින් ඉදිරිපත් කර යෝජනාව

**05.02.01** **පොල්වත්ත ආදාහනාගාරයට පැමිණෙන වාහන ගාල් කිරිම සඳහා මෙම භූමිය සකස්කර ඒ භූමිය වටා මල් වවා අලංකාර කරන කරන ලද යෝජනාව සභාගත කරන ලදී**

<u>**ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්**</u>

05.02.01 යටතේ ගරු නගර සභා මන්ත්‍රි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය විසින් ඉදිරිපත් කර යෝජනාවයි. ඔබතුමිය යෝජනාව ඉදිරිපත් කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා නිල පියස ඉදිකිරිම සම්බන්ධව කිහිප අවස්ථාවකම යෝජනා කරනු ලැබුවා. ඊට පසු විරෝධතාවයන් ඇති වු පසු එය නැතිවුණා.අංක 86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ ඉදිකිරිම සම්බන්ධව යි

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ඔබතුමිය කතා කළ යුත්තේ පොල්වත්ත ආදාහනාගාරයේ රථවාහන ගාල් කිරිම ඉදිකිරිම සම්බන්ධව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සීමාවේ පොල්වත්ත ආදාහනාගාරයේ ඉදිකර ඇති ගොඩනැගිල්ල කඩා ඉවත් කර බුදු මැදුරක් සකස් කර අලංකාර ලෙස සකස් කර දෙන ලෙසත් වාහන ගාල් කිරිමට අවශ්‍ය භූමිය සකස් කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා. මේ ගොඩනැඟිලි දෙක මා කඩා ඉවත් කරන ලෙස කිහිප වතාවකම ප්‍රකාශ කළා.අනවශ්‍ය දේවල් එහි සිදුවන බව ගම්වාසින් පවසනවා.සමහර අය රාත්‍රි කාලයේදි මත්ද්‍රව්‍ය පාවිච්චි කිරිමට භාවිතා කරනවා.තරුණ ළමයින් සිටින්නේ. ගම්වැසියන් ප්‍රකාශ කරනවා ලොකු අවහිරයක් වී තිබෙන මේ ගොඩනැගිලි දෙක කඩා ඉවත් කරන ලෙස.එම ස්ථානයේ කැලේ වැවි තිබෙනවා.මා පලමුවෙන්ම ඉල්ලා සිටිනවා එම ගොඩනැඟිලි දෙක කඩා ඉවත් කරන ලෙස. එම් බිම ප්‍රදේශයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා එය ඉදිකරනවා කිව්ව නිසා එම යෝජනාව ඉවත ගියා. එතුමා නොමැතිකමින් එය කෙරෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මේ යෝජනාව අපේ ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා ඉදිකරන බව ප්‍රකාශ කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මැතිතුමා කතා කරමින්</u>**

මේ යෝජනාව මා ඉදිරිපත් කර තිබෙන්නේ. මෙහි මුදල් කොහොමහරි ගෙන මේ යෝජනාව කරනවා. මිට ඉහතදි යෝජනා කර අනුමත කර තිබෙන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මා ඉතාමත් කනගාටු වෙනවා . මේවැනි යෝජනා ගෙන එම පිළිබඳ. මාස 06ක් ඇතුළත යෝජනාවක් දමා ගරු මන්ත්‍රිවරයෙකුට තව යෝජනාවක් ගෙන එමට බැහැ.එක්කෝ ගරු මන්ත්‍රිවරුන්ට දැනුම් දිය යුතුයි. නවක මන්ත්‍රිවරු මේ සියළු දෙනාම.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා කලින් ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා යෝජනාව ඉදිරිපත් කර මාසය කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

දැන් මාස 09ක් පමණ වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එහෙම නම් කමක් නැහැ.මෙක විහිලුවක් වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

මේ යෝජනාව ගෙනවිත් දැන් මාස 09ක් පමන වෙනවා. මා දින වකවනු සමඟ ලියා ගෙන තිබෙන්නේ.නමුත් මෙය කළ යුතුයි . මෙය ගමේ වැඩක්.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ඔබතුමියගේ එකක් නෙමේ. මේ සභාව පවත්වාගෙන යාමට නිතීයක් තිබිය යුතුයි.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්

මා දන්නවා . ඔබතුමාගේ නිතිය . මා පිළිගන්නවා.එහෙම දෙයක් තිබෙනවා නම් පසුගිය වතාවේ මෙන්න මේ මසේ මේ යෝජනාව අතුළත් වෙලා තිබෙනවා. එම නිසා මෙය මාස 6 කට ඉහත මේ යෝජනාව කර තිබෙන බවට නිවැරදි අර්ථ කථනයක් කරන්න.එවිට මගේ අර්ථ දැක්විම දෙන්නම්.අපේ මාදුවගේ මහතා මේ යෝජනාව කරනු ලැබුවේ කවදාද? මට මතක නැහැ.අනිවාර්යෙන්ම මේ කියන රිති ප්‍රශ්නය හරි.ඊට අවශ්‍ය නීතිමය පසුබිම ලබා දීමට මොන වාර්තාවේ මොන ස්ථානයේ තිබෙනවාද කියා ප්‍රකාශ කරන්න.මෙය 2018 ඔක්තෝම්බර් මාසයේ මෙය යෝජනා කර තිබෙන බව . මෙය ඉටු නොවූ නිසා තමයි යෝජනා කරනු ලබන්නේ. ඔක්තෝම්බර් සිට දැන් මාස 08 ක් වි තිබෙනවා. එම නිසා ඉදිරිපත් කිරිමේ හැකියාව තිබෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්

මා සභා වාර්තා බලා තමයි ඉදිරිපත් කරන්නේ.ඔක්තෝම්බර් මාසයේ මා යෝජනා කළා . නමුත් මෙය කෙරෙන්නේ නැහැ.දැන් මට ලොකු ප්‍රශ්නයක්. මෙහි ගොඩනැඟිලි ටික එහෙම තිබෙනවා.කැලේ වැවි තිබෙනවා.ජනතාව අනවශ්‍ය දේවල් වලට එය පාවිච්චි කරන බවට ගම්වාසින් ප්‍රකාශ කරනවා.අපි ගරු මන්ත්‍රිවරු කොට්ඨාශයේ සිටින. එය අපිට ලොකු අභියෝගයකි. දැන් ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා මෙය කරන බවට සභාවේ ප්‍රකාශ කළාට ගොඩනැගිලි දෙක හරි සභාවෙන් කඩා ඉවත් කරන්න. මොකද සභාවයි විදහා දක්වන්නේ ආදාහනාගාරය. ලංකාවේම අය මේ ස්ථානයට පැමිණෙනවා.මෙහිදි කතා කරනු ලබන්නේ අම්බලන්ගොඩ නගර සභාවේ තිබෙන දර්වල කම් කියා.ඒ දේ නැතිකර ගත යුතුයි. එම නිසායි මේ ඉල්ලිම කරනු ලබන්නේ.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්

හරි දැන් මාස 08ක් වන නිසා එම යෝජනාව අපි භාරගත යුතුයි.

**තිරණය :-**

පොල්වත්ත ආදාහනාගාරයට පැමිණෙන වාහන ගාල් කිරිම සඳහා මෙම භූමිය සකස්කර ඒ භූමිය වටා මල් වවා අලංකාර කරන ලෙස ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්දා අයිරාංගනි මැතිතුමිය විසින් කරන ලද යෝජනාව මිට ඉහත ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මහතා යෝජනා කළ තිබුණද එම යෝජනාව ඉදිරිපත් කර මාස 08ක් ඉක්මවා ගොස් ඇති අතර, එය ක්‍රියාත්මක නොවිම නිසා මේ යෝජනාව පිළිගැනිම සුදුසු බවට, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාකළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය විසින් ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.

05.02 ගරු නගර සභා මන්ත්‍රි ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය විසින් ඉදිරිපත් කර යෝජනාව

**05.02.02 86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියසක් ඉදිකිරිම සඳහා ඕකන්ද අත්කම්නිවාස අංක 09 ඉදිරිපිට තාප්ප මායිමේ සිට සුසාන භූමිය මායිම දක්වා උතුරු දිශාවට වන සේ ඉදිකිරිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්

ඔබතුමියගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්

ගරු සභාපතිතුමිනි, දැන් මේ නිලපියස ලොකු ගැටළුවක් වෙලා තිබෙන්නේ.අම්බලන්ගොඩ 86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියසක් ඉදිකිරිම සඳහා ඕකන්ද අත්කම්නිවාස අංක 09 ඉදිරිපිට තාප්ප මායිමේ සිට සුසාන භූමිය මායිම දක්වා උතුරු දිශාවට වන සේ ඉදිකිරිම සුදුසු බවට යෝජනා කරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාවේත් රීති ප්‍රශ්නයක් තිබෙනවා.මාස 06ක් ගතවීමට කලින් මේ යෝජනාව කිහිපවරක්ම යෝජනා වී තිබෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මේ කියන රීති ප්‍රශ්නය අනුව නම් ගියමාසයේත් කතා කර තිබෙනවා.මේ මසේත් කතා කරන්න බැහැ එම රීති ප්‍රශ්නය අනුව.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇයි එහෙනම් සභාවට යොමු කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙන එක ඇත්ත. නමුත් එයට සෑදීමට අවස්ථාව දෙන්න එපැයි.අනුමතිය නැතිව හදන්න බැහැනේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ඉන්න මට වැඩ කරන්න වෙන්නේ මට දි ඇති නීතිය අනුවයි.මට තිබෙන හැටියට ඔබතුමියට කියන්න ඕන ඉහතින් දැක්වූ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ අම්බලන්ගොඩ නගර සභාවේ රීතිමාලාවක් තිබෙනවා. එහි 11.05 යටතේ ඉහතින් වූ මාස 06ක් තුල සම්මත කරන ලද කිසිම යෝජනාවක් පරිවර්තන්න හෝ ඉහතින් වූ මාස 06 ක් තුල  ප්‍රතික්ෂේප කරන යෝජනාවක් සමාන ප්‍රතිඵල ගෙනදෙන වෙනත් යෝජනාවක් ඉදිරිපත් කිරිම හෝ ඉදිරිපත් කරන බවට යෝජනා සභිකයාගේ අත්සනට අමතරව තවත් අත්සන් යෙදූ සභිකයන් 04ගේ අත්සන් යෙදූ න්‍යාය පත්‍රයේ නිශ්චිතව ඒ බව සඳහන් ව ඇත්නම් මිස , ඒ කොටසේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වන්නේ යයි සලකනු නොලබිය යුතුය.ඒ යෝජනාව සම්බන්ධයෙන් සුදුසු කටයුතු කිරීමෙන් පසු මාස 06ක කාල සීමාවට හා ඒ හා සමාන යෝජනාවක් ඉදිරිපත් කිරිම කවර හෝ සභිකයෙකුට බලය නොමැති කියා සඳහන් වේ. ඒ අනුව මේ රීති ප්‍රශ්නය උඩ මේ යෝජනාව ඉදිරිපත් කිරීමට හැකියාවක් නැත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව කලින් අපි සභා සම්මත කර ගිහින් අදාල තැන බලා මෙය ඉදිකිරිමට ක්‍රිඩා භාණ්ඩ ආදියද ගලනවනු ලැබුවා. ඇයි එතන කරන්න බැරි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

අපේ සභාවේ නිත්‍යානුකූලව තැනකට අයිතිය දි තිබෙනවා.ඔබතුමිය විසින් වෙනත් තැනක් නැවත යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

නැහැ . ගරු සභාපතිතුමනි . මා ප්‍රකාශ කළා මේ ගස කපා ඉවත් කර දෙන ලෙස. එහෙමනම් මේ ගස කපා ඉවත් කර දෙන්න. මේ ගමේ උදවිය ක්‍රිඩා කරන අය එතැන අවශ්‍යයි කියා එම ස්ථානය දෙන්නේ නැහැ.අතන ළමයින්ගේ පෙර පාසල තිබෙනවා කියා එතන දෙන්නේ නැහැ.එතකොට මෙය මට ගමේ හදන්න නොදෙන්න තමයි සැරසෙන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමියණි, මෙය ගමේ ප්‍රශ්නයක් ඇති නොවන විදියට හදන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

ඔබතුමාට ගමේ ප්‍රධාන සමිතයකින් ඉල්ලීමක් කර තිබෙනවා. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාගේ මාමාණ්ඩිය හා මස්සිනාත් යන දෙදෙනාම අත්සන් කර එව්වා මෙය මෙතැන හදන්න කියා.මෙතැන කිසිම ගැටළුවක් නැති තැනකි.ජනතාවගෙන් ප්‍රශ්නයක් ඇති නෙවෙන්න තමයි ඔබතුමාලාගෙන් මේ ඉල්ලීම කරන්නේ. දැන් ඔබතුමාටත් කතා කළා කිව්වා ප්‍රාදේශිය ලේකම්තුමිය. මේ මුදල් රඳවා ගෙන සිටිය නොහැක.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මෙතැන තිබෙන රීති ප්‍රශ්නය උඩ නැවත කතා කිරිමට නොහැකිය. සභාව ගත් තින්දුව පරිදි ක්‍රියා කළානම් ඉවරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමියට දුන්නානේ මෙය හදන්න.ඔතන එය හදා දමන්න. නැතිනම් මෙය හැමදාම මෙය මේ සභාවට දාගෙන මෙතැන ප්‍රශ්න ඇති කර ගන්න එපා.දිපු තැන හදා දමන්න. නැතිනම් ඒ ප්‍රදේශයේ ජනතාවට එපා නම් අතහැර දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්</u>**

ප්‍රදේශයේ එක් අයෙකුට දෙන්නෙකුට තමයි මෙය එපා වි තිබෙන්නේ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ඒ අනුව මේ යෝජනාව ඉවත් කරනවා.ඔබතුමිය නිසි අයුරින් මෙයට වැටෙන අයුරින් ඉදිරිපත් කළහොත් කතා කළ හැක.මෙවැනි යෝජනාවක් මාස 06ක් පරිශිලනය වෙන්න කලින් ඉදිරිපත් කරන ක්‍රමවේදයක් මෙහි සඳහන් වි තිබෙනවා. ඒ සඳහන පරිදි ඉදිරිපත් කළහොත් ඇතුල් කරන්නම්. නමුත් දැනට තිබෙන මේ මට්ටම අනුව ප්‍රතික්ෂේප කරන්න වෙනවා.

**තිරණය :-**

86 ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියසක් ඉදිකිරිම සඳහා ඕකන්ද අත්කම්නිවාස අංක 09 ඉදිරිපිට තාප්ප මායිමේ සිට සුසාන භූමිය මායිම දක්වා උතුරු දිශාවට වන සේ ඉදිකිරිම සඳහා ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මැතිතුමිය විසින් කරන ලද යෝජනාව රීති ප්‍රශ්නයක් හමුවේ මෙය ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවට, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාකළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා විසින් ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.

- ගරු සභාපතිතුමා සභා ගර්භයෙන් නික්ම ගිය අතර මුලාසනයට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා පැමිණියහ

05.02 ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය විසින් ඉදිරිපත් කර යෝජනාව

**05.02.03 කළුවඩුමුල්ල පොදු නාන ළිඳ අලුත්වැඩියා කටයුතු කර ගැනිම සඳහා කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්**

කළුවඩුමුල්ල පොදු නාන ළිඳ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට යෝජනා කරනවා. කළුවඩුමුල්ලේ නාන ළිඳ මා තාක්ෂණසේවා නිලධාරි මහතුන් සමඟ කතා කර සුද්ද කර දැමුවා.එහි ප්‍රතිසංස්කරණ කටයතු සිදු කළ යුතුයි.සමහර වේලාවට ජලය නොමැති වෙලාවට ඕකන්දේ සිට මෙම ළිඳට පැමිණෙනවා නැමට. මේ ළිඳ අත්‍ය අවශ්‍යයි.මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්**

පඤ්ඤාලෝක මාවතේ තිබෙන ළිඳ එය දැන් සුද්ද කළා.

**මූලාසනය -ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා මොකක්ද වෙලා තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්**

මේ පසුගිය දින ගම සමඟ පිළිසදරක් වැඩ සටහන තිබුණා. එහිදි ගමේ ජනතාවගෙන් යෝජනා වුයේ මෙහි සමුපකාරයක් හරි ඉදිකර ගමේ අයට ප්‍රයෝජනවත් වන දෙයක් ඉදිකරන ලෙසයි.සියළුම නිවෙස්වලට ජල සැපයුම තිබෙනවා කියා. එතැන පාවිච්චි කරන්නේ නැතිකතාවක් කියන්නේ ගමේ ජනතාව.ගමේ ජනතාව සඳහන් කළේ එහි අපචාර සිදු වෙනවා කියා.

**මූලාසනය -ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

මාත් එම අවස්ථාවේ එතැන හිටියා. එම ජනතාව එහෙම ප්‍රකාශ කළා. ළිඳ වහන්න එක නම් අපි දන්නේ නැහැ. ඔය ළිඳ පවරා තිබෙන්නේ කවුරුහරි පුද්ගලයෙක් ළිඳකට නම් අපට වහන්න බැහැ.එහෙම ළිඳ වහන්න නම් ඒ පැවරූ පුද්ගලයාගේ දරුවන් හරි අයිතිකරුවන්ගෙන් කැමැත්ත ගත යුතුයි. එම නිසා ගරු මන්ත්‍රීතුමිය එයබලන්න. ගමේ අය එහෙම ප්‍රකාශයක් කළා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මැතිතුමිය කතා කරමින්**

ග්‍රාම නිලධාරි මහතා තමයි ප්‍රකාශ කළේ මෙය සුද්ද කරන්න කියා .

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද කළුවඩුමුල්ල නාන ළිඳ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා කරන ලද යෝජනාවට අනුව ඒ පිළිබඳව පරික්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට මූලාසනය දැරූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

- ගරු සභාපතිතුමා නැවත සභා ගර්භයට පැමිණියහ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කර යෝජනාව ඉදිරිපත් කරන්න. එම යෝජනාව 05.03.01

**05.03** **ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කර යෝජනා**

**05.03.01** **අඹලන්ගොඩ කරිත්තකන්ද ග්‍රාමසේවක වසමේ පටබැඳිගෙදර වත්ත 1 මාවතේ අග කොටස අත්කම් නිවාස ( කේ.ටී.චන්ද්‍රසෝම මහතාගේ නිවස ) අසළින් රේල්පාර දක්වා සම්බන්ධවන කාණු කොටස අප සභාව සතු පොදු අඩි 3ක මාර්ග කොටසින් වතුර බැස්වීම සඳහා කාණු පද්ධතිය සැදිය යුතු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අඹලන්ගොඩ කරිත්තකන්ද ග්‍රාමසේවක වසමේ පටබැඳිගෙදර වත්ත 1 මාවතේ අග කොටස අත්කම් නිවාස ( කේ.ටී.චන්ද්‍රසෝම මහතාගේ නිවස ) අසළින් රේල්පාර දක්වා සම්බන්ධවන කාණු කොටස අප සභාව සතු පොදු අඩි 3ක මාර්ග කොටසින් වතුර බැස්වීම සඳහා කාණු පද්ධතිය සැදිය යුතු බවට යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , එම ප්‍රදේශය සම්පූර්ණම පටබැඳිගෙදර වත්ත කාණු පද්ධතිය තිබෙනවා. එය අවසාන වන්නේ මෙම අඩි පාරෙනි.මේ කාණු පද්ධතිය අපේ රේල් පාරේ කාණු පද්ධතියට සම්බන්ධ වන්නේ නැහැ.ඉතා කුඩා කොටසක් තිබෙන්නේ. අඩි 30 ක 40 ක කොටසක්. මේය සභාවේ මුදල් වලින් සාදා දෙන්න. මේ කාලයේ හැටියට මෙය ඉදිකර දෙන්න. ඩෙංගු උවදුර වර්ධනය වු වකවානුවකි මේ.මේවා පහත් වෙල් බිම්.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ඔබතුමා මෙයට සහභාගි වන්න. මිට කලින් අපි මේය සැදිමට ගිහින් එහි ඉඩම් හිමියන් විරුද්ධ නිසා ආපසු හැරි එමට සිදු වුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

එය අපේ අඩිපාර . නගර සභාව සතු.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

අපි කලින් හදන්න හැදුවේ පටබැදි දෙවට 2 පාර ගොස් වැටෙන්නේ . නිතිඥ මහතෙකු සිටින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

ඒ දකුණු පැත්ත.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

එතන අයිනෙන් හදන්න හැදුවේ. ඉඩ දුන්නේ නැහැ. රේල්පාරෙන් එහා පැත්තේ සියල්ලම සාදා අවසන්.මෙහි ජනතාවගේ කැමැත්ත අරගෙන දෙන්න. මේ සඳහා තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන්න.

**තිරණය :-**

අම්බලන්ගොඩ කරිත්තකන්ද ග්‍රාමසේවක වසමේ පටබැඳිගෙදර වත්ත 1 මාවතේ අග කොටස අත්කම් නිවාස ( කේ.ටී.චන්ද්‍රසෝම මහතාගේ නිවස ) අසළින් රේල්පාර දක්වා සම්බන්ධවන කාණු කොටස අප සභාව සතු පොදු අඩි 3ක මාර්ග කොටසින් වතුර බැස්වීම සඳහා කාණු පද්ධතිය සැදිය යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා විසින් කරන ලද යෝජනාව සඳහා එහි ජනතාවගේ කැමැත්ත ලබා ගෙන තාක්ෂණසේවා නිලධාරි මහතාට ඇස්තමේන්තු සැකසිම සුදුසු බවට සුදුසු බවට, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනාකළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා විසින් ස්ථිරත්වයෙන් යුතුව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව . එය ඉදිරිපත් කරන්න.

05.04 **ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව**

**05.04.01 අම්බලන්ගොඩ පොල්වත්තේ දෙදුවස්ස පාර අවසානයේ සිට තල්ගස්ගොඩ මාර්ගය දක්වා පොඩි පාලම තෙක් මාර්ගයේ ඉඩම් අත්පත් කර ගැනිමේ පණතේ ප්‍රකාරව පවරා අත්පත් ගැනිමට කරන ලද යෝජනාව සභා සම්මත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මැතිතුමා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ පොල්වත්තේ දෙදුවස්ස පාර අවසානයේ සිට තල්ගස්ගොඩ මාර්ගය දක්වා පොඩි පාලම තෙක් මාර්ගයේ ඉඩම් අත්පත් කර ගැනිමේ පණතේ ප්‍රකාරව පවරා අත්පත් ගැනිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මැතිතුමා කතා කරමින්</u>**

මහජනතාවගේ කිසිදු ප්‍රතිචාරයක් නොමැති නිසා මෙය ඉඩම් අත්පත් කරගැනිමේ පණතේ ප්‍රකාරව මෙය සිදු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

මහජනතාවගේ විරෝධතාවයක් තිබේද ?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මෙය දිර්ඝ කාලයක් තිස්සේ අපේ ගරු නගර සභා මන්ත්‍රී ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා දිගින් දිගටම කතා කරන ලද දෙයකි.මෙය අත්‍යාවශ්‍ය මාර්ගයකි. ඉඩම් අත්පත් කර ගැනිමේ පණතක් යන්න අවශ්‍ය නැහැ.මෙය අපේ ඇළ රක්ෂිතයේ තිබෙන්නේ.අපේ ඇළ රක්ෂිතය දිගේ මෙය ඉදිකළ හැකිය.මෙය පවරා ගැනිමක් කරන්න අවශ්‍ය නැහැ. මෙය හොඳ යෝජනාවකි . මෙය ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා, හිටපු ගරු නගර සභා මන්ත්‍රී ජගත්

සේනාරත්න මහතා ආදි අය මෙය ගෙන එනු ලැබුවා. මට මතකයි මුලින්ම මේ යෝජනාව ගෙන එනු ලැබුවේ හිටපු උප සභාපති ජේ.පි අමරසේන මහතා විසිනි.නමුත් ඒ වෙනකම් කරන්න බැරිවුණා.දැන් අද අපගේ මේ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ආවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මෙය කරන්න බැරිවුණ හැම අවස්ථාවේම පවරා ගැනිම නොකළ නිසා තමයි මෙය ඉටු කිරිමට නොහැකි වුණේ.ඉඩම් අත්පත්කර ගෙන තිබෙනවා.එම ඉඩම් අත්පත් කර ගැනිමේ පණත මඟින් මෙය කළ හැකිය.ඉන්පසු මෙය කරන්න ගියාම ඉඩම් හිමියන් කියනවා මේ ඉඩම අපේ.මේ ඉඩම පවරා ගැනිම සඳහා ප්‍රාදේශිය ලේකම්ට යැවු විට එතුමිය ප්‍රකාශ කරයි මේ ඉඩම පවරා ගන්න කියා. ඉන්පසු අපි කර දමමු.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ඇළ රක්ෂිතයේ අපට අඩි 30ක් පමණ තිබෙනවා.එකේ හදාගන්න පුළුවනි.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

තිබෙනවා. යම් යම් පිරිස් මගදි විරුද්ධයි.එම නිසා තමයි මෙය හැදුනෝ නැත්තේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එහි හැදුවානම් කිසිම ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

දැන් එය ජනතාව පවිච්චි කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එහෙම පවිච්චි කරන්න බැහැනේ. එය වාරිමාර්ගයට අයිති.ඔබතුමා වාරිමාර්ගයට දන්වන්න. මෙයඇළ රක්ෂිතය අඩි 30ක් නම්කර දෙන්න කියා.ඉතිං ඇළ රක්ෂිතයේ මාර්ගය හදන්න.ඔහොම ගියොත් මෙය කෙරෙන්නේ නැහැ.මේ යෝජනා ගෙනවා විතරයි. අපි මේ සභාවට යෝජනා 5ක් 6ක් විතර පැමිණ තිබෙනවා.හැබැයි කෙරුනේ නැහැ.කුලරත්න විද්‍යාලයේ පිට්ටනිය වගේ තමයි . මේ ඇළ රක්ෂිතයේ මෙය ඉදිකිරිමට වාරිමාර්ගයේ උපදෙස් ලබා ගෙන මෙය ඉදිකරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්තේ දෙදූවස්ස පාර අවසානයේ සිට තල්ගස්ගොඩ මාර්ගය දක්වා පොඩි පාලම තෙක් මාර්ගයේ ඉඩම් අත්පත් කර ගැනිමේ පණතේ ප්‍රකාරව පවරා අත්පත් ගැනිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

- ගරු සභාපති එම් .ඩබ් අරුණ ප්‍රදිප් මහතා සභා ගර්භයෙන් නික්ම ගිය අතර මුලාසනයට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා පැමිණියහ.

## 05.05 ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කර යෝජනා

**05.05.01** පළාත් පාලන අමාත්‍යාංශය යටතේ දේශිය හා විදේශිය සහන ණය ක්‍රම යටතේ පහත සඳහන් මුලික අවශ්‍යතා ඉටුකර ගැනිම සඳහාත් මේ සභාවේ අවසරතා අනුව ක්‍රියා කිරිමට යෝජනා කර සිටිනවා.

01) 2004.12.26 වන දින සුනාමියෙන් අලාභ හානි වූ අම්බලන්ගොඩ පොදු වෙළඳ සංගමය බිම් මහල ඇතුළු මහල් 4ක් ඉදිකිරීම.

02) අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ල ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි අලුත් වැඩියා කිරීම.

03) අම්බලන්ගොඩ නගර සභාව සඳහා අඩුපාඩුව පවතින ප්‍රධාන ශාලාවක් සහිත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>

පළාත් පාලන අමාත්‍යාංශය යටතේ දේශිය හා විදේශිය සහන ණය ක්‍රම යටතේ පහත සඳහන් මූලික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහාත් මේ සභාවේ අවසරතා අනුව ක්‍රියා කිරීමට යෝජනා කර සිටිනවා.

එම යෝජනාව ස්ථිර කරන්න කවුරුහරි

<u>ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මැතිතුමා කතා කරමින්</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

01) 2004.12.26 වන දින සුනාමියෙන් අලාභ හානි වූ අම්බලන්ගොඩ පොදු වෙළඳ සංගමය බිම් මහල ඇතුළු මහල් 4ක් ඉදිකිරීම.

02) අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ල ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි අලුත් වැඩියා කිරීම.

03) අම්බලන්ගොඩ නගර සභාව සඳහා අඩුපාඩුව පවතින ප්‍රධාන ශාලාවක් සහිත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම. මේ සඳහා මා ඇතුළු ගරු නගර සභා මන්ත්‍රිවරු 12 කු අත්සන් තබා ඇත.මා පසුගිය සතියේ පළාත් පාලන අමත්‍යාංශයේ මේ පිළිබඳව දේශිය හා විදේශිය ණය අධ්‍යක්ෂක දර්ශන සමරකෝන් මහතා මුණ ගැසී මේ පිළිබඳව සාකච්ඡා කළා.එම සාකච්ඡාවේදි එතුමා ප්‍රකාශ කරනු ලැබුවා මේ නගර සභා ප්‍රාදේශිය සභාවල මේවා භාවිතා කරන බව. මෙම මුදල් ඉතා අඩු පොළියකට ලබා දෙනු ලබයි. ව්‍යාපෘති කිරීමට ඉතා මැලිබවක් දක්වනු ලබයි. මා එතුමාට ප්‍රකාශ කර සිටියා අපිට විශාල ගැටළුවක් තිබෙනවා. අපි මහජන පුස්තකාලයේ තමයි රැස්වීම පවත්වනු ලබන්නේ. එතකොට අපේ ප්‍රධාන ගොඩනැගිල්ල කඩා වැටී මුක්කු ගසා තිබෙන්නේ. අපේ නිලධාරීන් වැඩ කරන්නේ. ඉතා අමාරුවෙන් . එක ගොඩේ සිට. ඉතාම අපහසුතාවයකට පත්වෙනවා අපි. දැන් මෙහිදි නගර සභාව සතු ඉඩමක් තිබෙනවා. දැන් නගර සභාවට ශාලාවක් නැහැ. මේ පිළිබඳව මා දැනුවත් කළාම එතුමා ප්‍රකාශ කර සිටියා මෙය සභාවට ඉදිරිපත් කර සභාව අනුමත කර ගන්නා ලෙස. දේශිය හා විදේශිය ණය ක්‍රමය යටතේ අපට වෙළඳ පොළ ගැටළුවක් වී තිබෙන අපගේ පරණ ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීමට සහ ශ්‍රවණාගාර සහිත අලුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.මේ ශ්‍රවණාගාර හා ඉදිකිරීමට මිලියන 600 ( ලක්ෂ 6000)දක්වා අංග සම්පූර්ණ මුදල් දේශිය හා විදේශිය ණය මුදල් සහනදායි පදනම යටතේ පළාත් පාලන ආයතන වලට ලබා දෙනවා. මේ මුදල් ගෙන අපි අපේ අඩුපාඩු හදා ගන්න අවශ්‍යයි. ඒ නිසා තමයි මා එතුමා සමඟ සාකච්ඡා කර අද මේ විදියට ඉදිරිපත් කරන්නේ. මොකද මේක අපට අලියද , අතද , පොහොට්ටුව ද වැඩක් නහැ.කවුරු පාලනය කළත් නගරයේ ජනතාවට වගකිව යුතු මන්ත්‍රිවරු.අපේ වගකීමක් තිබෙනවා. අප සියළු දෙනාම එකට එකතු වෙලා අපේ නගරයේ තිබෙන සියළුම අඩුපාඩු හදා ගත යුතුයි. 2004 වර්ෂයේ සුනාමියට හසුවූ පොදු වෙළඳපොළ සාදා ගැනීමට නොහැකි අපිට මේ පිළිබඳව බලවත් කනගාටුව ප්‍රකාශ කළ යුතුයි අපේ ජනතාව. අපි මෙයට එදා සිට හිටපු සියළුම දේශපාලනඥයෝ වගකිව යුතුයි. මා දරන මතය. එම නිසා අපි අපගේ වගකීම වසර ගණක් තිස්සේ පැහැර හැර තිබෙනවා.එම නිසා අලුත් පාර , පරණ පාර ආදි

සියල්ලම හිර වී තිබෙන්නේ ජනතාවට තමන් ගෙනඑනු ලබන දේවල් විකුණ ගන්න විදියක් නැහැ. මාලු ටික විකුණනවා හංදියේ තබා ගෙන.අපට කියනවා ඒවා අල්ලා පොලිසියට ගෙනියන්න කියා. එකනෙමේ විසඳුම. අපේ වගකිමක් තිබෙනවා මේ ගොඩනැගිල්ල ඉදිකර දී සියළුම වෙළඳුන් එතැනට එකතු කර මාර්ග වල වෙළඳාම් කරන එක නතර කරලා නගරය ලස්සනට තබා ගැනිමට නායකත්වය දිය යුතුයි.මා යෝජනා කර සිටිනවා මේ වසරේ දේශිය හා විදේශිය ණය මුදල් ලබා ගෙන පොදු වෙළඳ සංකිර්ණය ඉදිකිරිමටත් , අපේ මේ පරණ ගොඩනැගිල්ල අලුත් වැඩියා කර අපි එතැනට ගොස් මේ පුස්තකාල ගොඩනැගිල්ල පුස්තකාලයට ලබා දීමටත් ,අපට අතන තිබෙන භුමි භාගයේ අඩුම ගානේ 300 -400 කට සිටිමට පුළුවන් හොඳ ශ්‍රවනාගාරයක් ඉදිකිරිමටත් මේ යෝජනාව යටතේ මෙයට මුදල් ඉල්ලා සිටිමත්, මෙය ලිපි ලේඛණ වලට විතරක් සිමා නොවි නගර සභාවේ අපි සියළු දෙනාම එකට එක්වෙන ලෙස ඉල්ලා සිටි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රිවරු 12ක් දෙනෙකු පමණ අත්සන් කර යෝජනා කිහිපයක් ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කළා. මා හිතන්නේ නගරයට අවශ්‍ය කරන වැඩපිළිවළ් රාශියක් එම යෝජනාවේ තිබෙනවා.මේ යෝජනා ඉදිරිපත් කරනවා. නමුත් මේ ඉල්ලිම් අනුව වැඩකටයුතු කරන ලෙස තමයි මා ප්‍රකාශ කර සිටින්නේ.දැන් වෙළඳ සංකිර්ණය බැලුවාම එය ඉතාමත්ම අබලන් තත්ත්වයේ තිබෙන්නේ. කොයි වේලාවේ කඩගෙන වැටෙයිද කියන තත්ත්වයේ තිබෙන්නේ.මා දන්නවා සමහර ඒවාට බදු ගන්නවා . මෙය ඉදිකිරිම කියන එක අත්‍ය අවශ්‍යයි.නගරයේ රථ ගාලක් නැහැ. මා ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතාගෙන් ඉල්ලා සිටිනවා මේ සඳහා රථ ගාලක් අත්‍ය අවශ්‍යයි. නගරයේ වාහන හැම තැනම.මෙය සැලසුම් කරන විට එකත් එක්කම කරන්න. අනෙකුත් වැඩ කොටස් කිරිමට විපක්ෂයෙන් ඔබතුමාලාට මුදල් අරගෙන දෙන්න හදනවා.නැත්නම් විපක්ෂය කරන්නේ මෙය කඩා කප්පල් කිරිමට කෙනෙහිලි කම් කිරිමයි. හැබැයි පාලන පක්ෂය දැන ගත යුතුයි මෙය ලබාගෙන ඒ අවශතා අනුව කටයුතු කරන්න.අපි ඉල්ලා සිටිනවා ලේකම්තුමියගෙන් , නවක ලේකම්තුමියක් වුණාට මේ සඳහා ඇප කැප වී වැඩ කටයුතු කරන ලෙස.අපට තේරේනවා දැන් මේ පාලක පක්ෂයේ ගරු මන්ත්‍රිවරුත් ප්‍රකාශ කර සිටින්නේ අපි යෝජනා කරනවා නමුත් වැඩ කෙරෙන්නේ නැහැ. නිලධාරින්ගේ අඩුව තිබෙනවා. මෙය ගරු සභාපතිතුමාට කිවු විට එය ගරු සභාපති තුමා නිලධාරින්ට කියා ඉන්නවා.එහෙම නොවි දැන් මේ යෝජනා ගත්තාම ගොඩක් දේවල් ක්‍රියාත්මක වී නැහැ.යම් යම් අඩුපාඩු තිබෙනවා. ලේකම්තුමියගේ වගකිමක් වෙනවා මේ කරන්න තිබෙන වැඩ කොටස් ටික ගොණු කර අවශ්‍ය දේ කිරිම. මේ වෙළඳ සංකිර්ණය ඉතාම භායනක තත්වයේ තිබෙන්නේ. මෙය බැලිමට ලේකම්තුමිය ගියාද ?මේ වගේ තිබෙනවා කියා දන්නවාද? එම නිසා අපි ඉල්ලා සිටිනවා. ඔබතුමිය ගොස් මෙය බලන්න. ගරු සභාපතිතුමාව උනාන්දු කරවන්න.එක වතාවක් හරි ගියොත් එහෙම මොකක්ද තත්ත්වය කියා දන්නවා. එතකොට හදන්න හිතෙනවා.කොච්චර වුණත් ගරු විපක්ෂ නායකතුමා නගරයට ගොඩක් ආදරෙයිත ඒ උනාන්දුව ඇත්තටම අපි අභය කරනවා.ගරු සභාපතිතුමා උනාන්දු වි මේ වැඩටික කරන ලෙස ඉල්ලා සිටිනවා.ඉතාම හොඳ යෝජනා ටිකක්. එතුමන්ලාගේ පාලන තන්ත්‍රය තිබෙන්නේ. ගරු විෂයභාර අමාත්‍යවරු සිටින්නේ එතුමාගේ පාලන තන්ත්‍රය තුලයි.එම නිසා මුදල් ගැනිමේ කිසි ගැටළුවක් වෙන එකක් නැහැ.මේ කර්තව්‍ය ඉටුකරන ලෙස විපක්ෂ නායක කණ්ඩායම වශයෙන් අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොදු වෙළඳ සංකිර්ණයේ ( මාලු ) හංදියේ සිට මාලු විකිණිම සම්බන්ධව. මා හිතන්නේ මාලු වෙළඳ සැල තිබෙනවා.මාලු වෙළඳසැලේ ලැලි ටික ගෙන පහළට යන ලෙස කියා සිටියත් ඔවුන් එම ලැලි ටික පහළට යන්නේ නැහැ.. පොලිසියටත් භාර දුන්නා. නඩු දනවා කිව්වා. පොලිසිය මොනවා කළාද කියා අද වෙනකම් දන්නේ නැහැ.ලියුම් දැම්මායි කියනවා. පිළිතුරක් නැහැ තවම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු උපසභාපතිතුමනි, අපගේ ගරු විපක්ෂනායකතුමා එතුමා ඒ වගේම රජයේ අම්බලන්ගොඩ ආසනයේ සංවිධායකවරයා.එතුමට හැකියාව තිබෙනවා මේ යෝජනාව යටතේ එය සාක්ශාත් කර ගැනිමට යම් උදවුවක් නගර

සභාවට කිරිමට.ඒ වගේම ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමාගේ යුතුකමක් වශයෙන් මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මා දකින්නේ අම්බලන්ගොඩ නගරය මේ පැත්තෙන් කළුතර හැරුණාම මේ පැත්තෙන් ගාල්ල හැරුණාම අම්බලන්ගොඩ ප්‍රධානම නගරයයි.අපි අම්බලන්ගොඩ කියා ප්‍රකාශ කළ විට අම්බලන්ගොඩට පැමිණි විට මේ නගරයේ තත්වය පිළිබඳ අවබෝධයක් තිබෙනවා.එම නිසා අම්බලන්ගොඩ විදියට උගත් බුද්ධිමත් ජනතාවක් මේ නගරය නියෝජනය කරනවා.අද ගත්තාත් මේ අම්බලන්ගොඩ නගරයෙන් බිහිවූ රජයේ නියෝජිතයන් තිදෙනෙකු නියෝජනය කරනවා.ආදායම් කොමසාරිස්තුමා, මැතිවරණ කොමසාරිස්තුමා, නාවික හමුදාපති.මේ අම්බලන්ගොඩින් බිහිවූ අය.ඒ අයගේ නගරය මේ. නගරයට පැමිණි විට නගරයේ සියල්ලම අවධිමත්.මෙයට නගරයක් කියන්න පුළුවන් තත්ත්වයක නැහැ.හැබැයි ඉතිහාසයේ 1938 සී.ටි, ප්‍රනාන්දු මහතාගේ සිට පැමිණි මේ නගරාධිපතිවරුන් මේ නගර සභාව නගරයක් කිරිමට විශාල කැපකිරිම් කළ තිබෙනවා. විශාල ඉදිකිරිම කර තිබෙනවා.මේ සංවර්ධන කටයුතු විධිමත්ව කරගෙන පැමිණ තිබෙනවා.හැබැයි අද වෙනවිට අපට බැරිවි තිබෙනවා ඔවුන් විසින් ගොඩනඟා දී තිබෙන දේවල් අඩුම වශයෙන් අලුත්වැඩියා කිරිමෙන්වත් පවත්වාගෙන යාමට නොහැකි වි තිබෙනවා.එයට බලවත් කානගාටුවක් තිබෙනවා.අප විපක්ෂනායකතුමා මේවා ඉදිරිපත් කරනු ලබන්නේ වගකිමකින් යුතුවයි.අපට ගරු සභාවට යෝජනා ඉදිරිපත් කර තිබෙනවා යම්කිසි ක්‍රමවේදයක්.එතුමාට ඒ අවශ්‍ය ලියකියවිලි අනුමතිය ලබා දෙන්න. එතුමාත් එකතු කරගෙන මේතරම් විශාල මුදලක ව්‍යාපෘති තුනකට අවසර දෙනකන් නැහැ. මේ එක ව්‍යාපෘතියකට හරි අනුමතිය ලබා ගන්න.නමුත් අත්‍ය අවශ්‍යයෙන්ම තිබෙන එක ව්‍යාපෘතියකට හරි අපි අනුමතිය ලබා දෙන්න ඕන.ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනිමට එතුමා දිරිගැන්විම අප ඉතාමත් යුහුසුළුව කළ යුතු කාර්යකි. ලේකම්තුමියණි එය ඔබතුමියගේ කාර්යකි. ඒ නිසා ඊට අවශ්‍ය සහාය ලබා දෙන්න.මේ නගරයේ පාසැල් 03 -04 සඳහා දෙමාපියන් 15000 කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වෙනවා.සිසුන් 15000කට අධිකයි. අඩුම වශයෙන් ඉන් භාගයක්වත් පැමිණෙනවා. නැවත සවස එම ප්‍රමාණයම වගේ අමතර පංති සඳහා පැමිණෙනවා. මේ සියළු දෙනාටම සේවය සැපයිමට මේ කුඩා නගරයේ කුඩා දේපල පමණයි තිබෙන්නේ. ඉතිං එක වත් සංවර්ධන කටයුතු සිදු වි නැති වුණාම මොකක්ද සිදු වෙන්නේ. ඉතිහාසයේ දැනට අවුරුදු ගණනකට කලින් තිබු අම්බලන්ගොඩ නගරයම තමයි තිබෙන්නේ.නමුත් අපි බැලුවොත් තද ආසන්න නගර වලට ඒවා දියුණු වෙලා තිබෙනවා.අපි ගාල්ලට ගොස් බැලුවිට ගාල්ල නගරයේ තිබෙන මාර්ග සමඟ අම්බලන්ගොඩ නගරයේ මේ පටුමාවත් සමඟ කරන යුද්ධයක් තිබෙන්නේ.අම්බලන්ගොඩ නගරයේ සංවර්ධනය බොහොම සෙමින්.සංවර්ධනයක් නැති තරම්.තිබෙන ගොඩනැගිලි වත් පිංතාරු කර තබා ගන්නා ක්‍රම වේදයක් නැහැ.එම නිසා මා කනගාටු වෙනවා.මේ සඳහා අපේ විපක්ෂනායකතුමා කරන යෝජනාවට අනුමතිය ලබා දෙනලෙස ඉල්ලිමක් කර සිටිනවා.එසේම එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරිම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්</u>

විශේෂයෙන්ම අම්බලන්ගොඩ නගරය ගැන කතා කරන විට අම්බලන්ගොඩ නගර සභා ශාලාව ගැන කතා කරන්න ඕන.ඇත්ත වශයෙන්ම මේ සභාව පවත්වා ගෙන යනු ලබන්නේ පුස්තකාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේය. විශේෂයෙන් අධ්‍යාපනය ගැන කතා කළහොත් අම්බලන්ගොඩ නගරයේ සිටින දරුවන් විශාල වශයෙන් උගතුන් වශයෙන් බිහිවෙන නගරයකි. ඉතිං එවැනි පසුබිමක් ඇති නගරයක ගරු මන්ත්‍රීවරු වශයෙන් මහජන සේවකයන් වශයෙන් අපෙන් විය යුතු යුතුකම පැහැර හරිමින් තමයි මේවැනි ගොඩනැගිල්ලක මෙය පවත්වාගෙන යන්නේ.එතුමා මෙවැනි වැඩපිළිවළක් ඉදිරිපත් කිරම ගැන සතුටු වෙනවා. ඒ වගේම ප්‍රකාශ කළ යුතුයි ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි අම්බලන්ගොඩ නගරය ඉතා පටු සිමාවක තිබෙන්නේ. නමුත් දියුණුව ගත්තාම අඩුපාඩු තිබෙනවා.ඒ අඩුපාඩු වලට ගරු සභාපතිතුමා මෙතැන නැති නිසා කතා කරන්න සුදානම් වෙන්නේ නැහැ. නමුත් ඔබතුමා හොඳයි. එම නිසා මා ඔබතුමාට දෝෂාරෝපණය කරන්නේ නැහැ. ගරු නගරාධිපතිතුමාගේ ඒකාධිපතිත්වය නිසා තමයි අපට ගරු ප්‍රධාන අමාත්‍යතුමෙකුත් සිටියදි අම්බලන්ගොඩ නගරය තුළ දියුණු කරන්න බැරි තත්වයක් උදා වුණේ.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඔබතුමා ගරු සභාපතිතුමා මෙහි නැති අවස්ථාවේ දොස් නගන එක වැරදියි.එහෙම කියන එක වැරදියි

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්

නැහැ මා ප්‍රකාශ කළේ අඩුපාඩු තිබෙනවා කියා.වැරදියි කියන එක නෙමේ. යම්කිසි දෙයක් කළාම අපි එය අගය කළ යුතුයි.ඒ අඩුපාඩු සිදු වුණාම ඒ දේශපාලන අධිකාරියෙන් ඉතිරි වැඩ කටයුතු සිදු කරගෙන යන්න බැරි වෙනවා.ගරු සභාපතිතුමාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් අතර යම්කිසි ගැටළුවක් ඇති වෙන කොට ඇත්තෙන්ම අම්බලන්ගොඩ නගරයේ සිටින නගර වැසියන්ට තමයි ඒ අවාසිය සිද්ධ වෙන්නේ.ඔබතුමා මූලාසනයේ නැතිව එතුමා මූලාසනයේ හිටියා නම් මා දීර්ඝව මේ ගැන කතා කරනවා. මේ කතාව මෙතැනින් නිමකරලා ගරු මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ගැන අපගේ පූර්ණ සහයෝගය ලබා දෙන බවත් එතුමාගේ ඒ කාර්ය ඉටු කර ගැනීමට ශක්තිය ධෛර්ය ලැබෙවා කියා ප්‍රර්ථනා කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්

ගරු සභාපතිතුමනි,මා පලමුවෙන්ම අපගේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමාට ස්තූතිය පුද කරන්න කැමතියි. මොකද එතුමා හැමදාම පක්ෂයේ හැම සාකච්ඡාවකදිම අම්බලන්ගොඩ සංවර්ධනය ගැන ඉතා උනන්දුවෙන් කතා කරන සංවිධායකවරයෙකි.ඒ යන හැම අවස්ථාවකදීම දෙන මුදල් සියල්ල අම්බලන්ගොඩට ගෙනවිත් එය සංවර්ධනය කිරිමට.එතුමා විශාල කැපකිරීමක් කරනවා අම්බලන්ගොඩ නගරය ගැන . පක්ෂ පාට දේශපාලනය බලන්නේ නැහැ.අපි ගරු නගර සභා මන්ත්‍රීවරු. අපි පැමිණ තිබෙන්නේ අම්බලන්ගොඩ නගරයට සේවය කරන්න.එතුමා එම නිසාම තමයි මේ ගොඩනැගිල්ල අලුත්වැඩියාව සඳහා සාකච්ඡා කළේ.ඇත්තටම අපි කනගාටු විය යුතුයි ගරු මන්ත්‍රීවරු විදියට . මේ අපි රැස්වී සිටින ගොඩනැගිල්ලේ තිබෙන්නේ පුස්තකාලයකි. පුස්තකාලයට තිබෙන පහසුකමක් අරගෙන තමයි අද අපි මෙය භුක්ති විඳින්නේ.එතුමා මා මෙතුමා කිව්වට පලමුවෙන්ම මාළු වෙළඳසැල සැදිය යුතුයි .නමුත් මේ නගර සභා සේවකයන්ට සේවය කරගෙන යාමට අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් සැදිය යුතුයි කියා මා ප්‍රකාශ කරනවා. මොකද ණය මුදලක් ලබාගෙන හරි මෙය සකස් කරන්න.අංග සම්පූර්ණ වැසිකිළි පද්ධතියක් සමග . මේ වැසිකිළි පද්ධති දැක්කාම කනගාටු වෙනවා. මේ සඳහා ලක්ෂ 4කට වැඩි ප්‍රමාණයක් දී වැසිකිළි සැදීම ගැන. එම නිසා එතුමා ගෙන ආ පලමු යෝජනාව ගරු සභාපතිතුමා වගකිම ගෙන පක්ෂ සංවිධායකතුමා වන එතුමා ගෙන එනු ලබන මුදල් ගෙනවිත් අම්බලන්ගොඩ නගරය දියුණු කරන්න හදන මොහොතේ සියළුම දෙනාගේ සහයෝගය ලබා ගෙන ණය මුදලක් හරි කමක් නැහැ ලබා ගෙන මේ කටයුත්ත සාර්ථක කරන ලෙස ඉල්ලා සිටිනවා.

මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

විශේෂයෙන්ම සඳහන් කළ යුතු වෙනවා වසර තුනකට අධික කාලයක් තුළ පාලනයක් නොමැතිව තිබූ අපි මේ නගර සභාව භාරගෙන වසර 1 ½ පමණ වෙන්නේ.එතකොට අපි මෙහි නැති වුණු කාලයේදි සිදුවූ සිද්ධි තමයි නගර ශාලාව නැතිවුණු එක.විශේෂයෙන්ම අපි ගරු විපක්ෂනායකතුමා ගෙනා ආ කිසිම යෝජනාවකට විරුද්ධ වී නැහැ.එතුමා ගෙන ආ සියළුම හොඳ යෝජනා වලට සහයෝගය දී තිබෙනවා.අපි ස්තුති කර තිබෙනවා.අපි සහයෝගය කර කියා තිබෙනවා ගෙන්න කියා.එය ගන්න කියා. එතුමා මොන යෝජනාව ගෙනාවත් මේ නගරයට ගෙන්නේ. එයට පක්ෂ භේදයක් ඕන නැහැ. මෙය මේ සඳහා මෙහෙම වුණා කියා ගරු සභාපතිතුමා නිසා මෙය සිදු වුණා කියා කියන එක වැරදි අර්ථ කථනයකි.විශේෂයෙන්ම කිව්ය යුතුයි අපි පැමිණි පසු තමයි මෙය කඩා ඉවත් කරන එක නැවැත්වුයේ. අපි ජාතික ගොඩනැගිලි පර්යේෂණ දෙපාර්තමේන්තුව ගෙන්වා පරික්ෂාකර බැලීමෙන් තමයි මෙය නවත්වනු ලැබුවේ. නැතිනම් මෙය කඩා විනාශ කර දමනවා.මුදල් බැඳ මේ ගොඩනැගිල්ල යථා තත්ත්වයට පත් කළ හැකි බව ප්‍රකාශ කර වාර්තාව ගනු ලැබුවේ අපි පැමිණි පසුවයි.මෙය කඩන්න තීරණය කර තිබුණේ.එම නිසා අනවශ්‍ය විදියට සභාවේ තිබෙන තිබෙන විදියට කතා කරන්න හොඳ නැහැ.මෙය නිලධාරීන් කළේ. ඔබතුමාලා කතා කරන්නේ මෙය අපි කළා වගේ. එම නිසා එහෙම කියන්න හොඳ නැහැ.අපි සිටින කාලේ මාළු වෙළඳසැල හදන්න මුල්ගල තැබුවා.සමුපකාර ගොඩනැගිල්ල හදන්න මුල්ගල තැබුවා. ඒ ගැන ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා දන්නවා.නමුත් ඒ එකක්වත් කෙරුණේ නැහැ.ඇත්ත කතන්දරය එකයි.ගරු මහ ඇමතිතුමාට වගකිමක් හා යුතුකමක් තිබුණා. එතුමා මේ එක දෙයක්වත් කළේ නැහැ.එතුමා වසර 15ක් මේ නගරය නියෝජනය කළ ගරු ප්‍රධාන අමාත්‍යවරයා.එතුමාට වගකිමක් තිබුණා. ගරු සභාපති නෙමේ කවුරු මොනවා කිව්වත් මේ නගරය සංවර්ධන කටයුතු සිදු කරන්න.එතුමාගේ නගරය. එතුමා පාසල් ගියේ ධර්මාශෝක විද්‍යාලයට.එතුමාට වගකිමක්

තිබුණා. එම වගකීම පැහැර හැරිය පසු අනෙක් අයට අත දික් කර හරියන්නේ නැහැ .දැන් ඔබතුමාලාට කතා කරන්න අවස්ථාව දුන්නා. දැන් ඒවාට පිළිතුරු දිය යුතුයි. එම නිසා තමයි මේ කියන්නේ.එම නිසා එම වගකීම අපිට වත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාටවත් කරන්න බැහැ.ගරු මන්ත්‍රීතුමා කතා කරන්න අවස්ථාව දෙන්න. ඔබතුමාට කතා කරන්න අවස්ථාව දුන්නානේ. මා ප්‍රකාශ කරන්නේ . ගරු මන්ත්‍රීතුමා වාඩිවෙන්නකෝ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

එහෙම කොහොමද වඩිවෙන්නේ.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මා කතා කරන්නේ ඇත්ත. මා කතා කරන එක නවත්වන් බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මැතිතුමා කතා කරමින්</u>

අපේ ගරු සභාපතිතුමා නැති වෙලවේ සභාපතිතුමාට දොස් නැගුවේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>

එහෙම සභාපතිතුමාට කතා කරන්න එපා.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

හරි විෂය පථයට තමයි කතා කරන්නේ.ගරු සභාපතිතුමා හා ගරු ප්‍රධාන අමාත්‍යතුමා අතර ප්‍රශ්නයක් තිබූ බව අපි දන්නවා.මේ දෙගොල්ලන්ගේප්‍රශ්නයක් කියා නගරයේ ජනතාවට අසාධාරණය වෙන්න දෙන්න හොඳ නැහැ.එක වෙන්න දෙන්න හොඳ නැහැ. විපක්ෂනායකතුමා ගෙන්න. අපි අත්දෙකම ඔසවා සහායෝගය ලබා දෙන්න.කිසි ගැටළුවක් නැහැ අපි අත් දෙකම ඔසවා සහායෝගය ලබා දෙන්න.නගරය වෙනුවෙන් . අපි ඒ දේ කරනවා.මා ප්‍රකාශ කරන්නේ නිල සෙවණ ඕකන්දේ හදන්න දෙන්නේ නැතිනම් තල්ගස්ගොඩ දෙනවා මා.කරුණාකාර එවැනි ප්‍රකාශ කරන්න හොඳ නැහැ.අපි සහායෝගය ලබා දෙනවා. ඔබතුමා සභාවේ ඕන යෝජනාවක් ගෙන එන්න . අපි සහායෝගය දෙනවා.අම්බලන්ගොඩ නගරයේ වැසියන්ට ලැබෙන පොදු පහසුකම් වෙනුවෙන් අපි සහායෝගය ලබා දෙනවා.එම නිසා ඔබතුමාගේ යෝජනාව ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ගන්න. ඒ සඳහා අපි අනුමතිය දෙනවා.

**තීරණය.**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ඉදිරිපත්කරනලද පළාත් පාලන අමාත්‍යාංශය යටතේ දේශිය හා විදේශිය සහන ණය ක්‍රම යටතේ පහත සඳහන් යෝජනා ක්‍රියත්මක කිරිම සුදුසු බවට මූලාසනය දැරූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සාභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

01) 2004.12.26 වන දින සුනාමියෙන් අලාභ හානි වූ අම්බලන්ගොඩ පොදු වෙළඳ සංගමය බිම් මහල ඇතුළු මහල් 4ක් ඉදිකිරිම.

02) අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ල ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි අලුත් වැඩියා කිරිම.

03) අම්බලන්ගොඩ නගර සභාව සඳහා අඩුපාඩුව පවතින ප්‍රධාන ශාලාවක් සහිත නව ගොඩනැගිල්ලක් ඉදිකිරිම.

**05.05 ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කර යෝජනා**

**05.05.02 අප විපක්ෂ මන්ත්‍රීවරුන්ට කණ්ඩායම් රැස්වීම් තිබෙන විට අපට මේ ශාලාj ලබා දෙන ලෙස යෝජනා කරනවා**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමනි, මා ඉල්ලා සිටියා අප විපක්ෂ මන්ත්‍රීවරුන්ට කණ්ඩායම් රැස්වීම් තිබෙන විට අපට මේ ශාලාවේ මුල්ලක් පාවිච්චි කරන්න දෙන ලෙස.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

නගර සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන්ට පමණක්. පිටස්තරයන්ට බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

නැහැ ගරු මන්ත්‍රීවරු පමණයි. වෙන කවුරුත් නැහැ.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීවරුන්ට පමණක් මෙය පැවැත්වීමට අවසර ලබා දෙනවා.

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා විසින් විපක්ෂයේ කණ්ඩායම් රැස්වීම පැවැත්වීම සඳහා සභා රැස්වීම් ශාලාව ඉල්ලා කරන ලද යෝජනාවට විපක්ෂයේ ගරු නගර සභා මන්ත්‍රීවරුන්ට පමණක් මේ රැස්වීම් පැවැත්වීමට රැස්වීම් ශාලාව ලබා දීම සුදුසු බවට මූලාසනය දැරූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මැතිතුමිය විසින් කරන ලද යෝජනාව. ගරු මන්ත්‍රීතුමිය මෙය යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන්න අවශ්‍ය නැහැ. කමක් නැහැ ඉදිරිපත් කරන්න.

**05.06 ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මැතිතුමිය විසින් ඉදිරිපත් කර යෝජනා**

**05.06.01 පින්නදූව පලවෙනි පාර පින්නදූව හංදියේන් පටන් ගෙන උඩට එන විට එම පලවෙනි පාරේ විදුලි කණු වලට විදුලි බුබුළු සවිකිරිමට මා යෝජනා කරනවා**

**<u>ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පින්නදූව පලවෙනි පාර පින්නදූව හංදියේන් පටන් ගෙන උඩට එන විට එම පලවෙනි පාරේ විදුලි කණු වලට විදුලි බුබුළු සවිකිරිමට මා යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මැතිතුමා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමනි, ඔය විදුලි බුබුළු සවිකිරිම ගැන කතා කිරිමේදි ආමිස් නැහැ. ඒවා තවම ගෙනවිත් නැහැ.දැන් ගොඩක් කල් මේ පිළිබඳව කියා.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මාත් දැන් බොහෝ  කලක සිටම කියනවා. සැපයුම් නිලධාරිණිය සිටිනවාද? මේවා කියා ගෙන්නුවාද?මේ සතියේ කවදාද ඒවා ගෙනෙන්නේ. සිකුරාදාට ගෙනෙනවාද?

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රී මගගෙ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද පින්නදූව පලවෙනි පාර පින්නදූව හංදියේන් පටන් ගෙන උඩට එන විට එම පලවෙනි  පාරේ විදුලි කණු වලට විදුලි බුබුළු සවිකිරිම සුදුසු බවට මූලාසනය දැරූ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනාව ඉදිරිපත් කරන්න.

**05.07 ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් කරන යෝජනාව**

**05.07.01 පොල්වත්ත රජයේ රෝහලේ රුධිර පරික්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවිමට යෝජනා කරනවා.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා කතා කරමින්.</u>**

මට මේ යෝජනාව ඉදිරිපත් කිරිමට ගරු මන්ත්‍රීවරුන් 16කු අත්සන් කර දුන්නා. පලමුව මා ඒ ගැන ස්තුති වන්ත වෙනවා. මා මේ යෝජනාව කරන්නේ මහජන සෞඛ්‍ය තුමියට ලිපියක් යවන්න කියා. අද තිබෙන ඩෙංගු උවදුරත් සමඟ පොල්වත්ත රෝහල ප්‍රයෝජනයක් ගන්න කියා  ප්‍රකාශ කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය කතා කරමින්</u>**

මා එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා කතා කරමින්.</u>**

රුධිර පරික්ෂණ කිරිම සම්බන්ධවයි. වර්තමානයේ ප්‍රධාන ගැටළුවක් වී ඇති ඩෙංගු උවදුර සම්බන්ධව අම්බලන්ගොඩ ප්‍රදේශවාසින් මහත් අපහසුතාවයන්ට මුහුණ පා ඇති බව නොරහසකි. මෙහිදි බලපිටිය මූලික රෝහල ප්‍රශංසනීය සේවයක් ඉටු කරයි. එහෙත් එකි කාර්ය මණ්ඩලයත්, සෞඛ්‍ය  සම්පත් ප්‍රමාණයක් ප්‍රමාණවත් නොවන බව එහි ගොස් විමසා බැලුවිට පෙනි යයි. මෙම රෝගී තත්ත්වය සඳහා රුධිර පරික්ෂාවට අනිවාර්ය වන අතර , මේ සඳහා පුද්ගලික රුධිර පරික්ෂණ මධ්‍යස්ථාන ඉතා විශාල මුදලක් අයකරනු ලබයි. නිදහස් සෞඛ්‍ය සේවය ඇති අපේ රටේ ජනතාව ආර්ථික අපහසුතාවයන්ගෙන් වෙලි ඇති මොහොතක මේ සඳහා සහනයක් ලෙස පොල්වත්ත රජයේ රෝහල අවස්ථානුකුලව දියුණු කර මිට වඩා ප්‍රයෝජනවත් ලෙස ජනතාවට අත්‍යවශ්‍ය සේවයක් සලසන ආයතනයක් බවට පතකරන  ලෙස යෝජනා කරනවා. මෙවැනි යෝජනා ඉදිරිපත් කිරිමට අවස්ථාවක් වන සම්බන්ධිකරණ කමිටු මේ දක්වා මන්ත්‍රීවරුන්ට අහිමි වී ඇති බැවින් මේ යෝජනාව මෙලෙස ඉදිරිපත් කිරිමට සිදු වී ඇති බව මෙහිලා සඳහන් කරයි.ඩෙංගු උවදුරට ගොදුරු වූ දරුවෙකු හෝ පුද්ගලයෙකු දින 4කට පසුව රුධිර පරික්ෂාවක් කළ යුතුයි.වෛද්‍ය නිර්දේශයන්ට අනුව. පොල්වත්ත මූලිදක රෝහලේ කිසිම රුධිර පරික්ෂාවක් කරන්නේ නැහැ.ඔක්කොම යන්නේ බලපිටිය රෝහලට. බලපිටිය රෝහලට රෝගීන් වැඩියි. ඔවුන්ට මෙය කරගන්න බැහැ. ඒ අය දෙනවා මේ රුධිර පරික්ෂණය කරගෙන එන්න කියා. එතකොට මෙය පෞද්ගලික

ආයතනයකින් පරික්ෂා කිරිම සඳහා ඒ අයට රු1000 ක් , රු1200ක පමණ මුදලක් වැයවේ. මේ අහිංසක දුප්පත් ජනතාව. මෙය ජනතාවට අනවශ්‍ය බරකි.මෙය කාලින ගැටළුවක් වෙලා තිබෙන්නේ. පොල්වත්ත රජයේ රෝහල ජනතාවට ප්‍රයෝජනයක් ගන්නා ආයතනයක් බවට පත් කිරිමට ඒ සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු මන්ත්‍රිවරුන්ගේ එකඟතාවය මත දන්වලා ගරු විපක්ෂ නායකතුමාගේ සහායෝගය මා මේ අවස්ථාවේ බලාපොරෝත්තු වෙනවා. මේ සම්බන්ධව හොඳ ප්‍රතිචාරයක් ලැබෙයි කියා මා බලපොරෝත්තු වෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්.</u>

ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මැතිතුමා ගෙන එනු ලැබූ යෝජනාව ඉතාමත් කලෝචිත යෝජනාවක්. මොකද ඩෙංගු කියන වසංගත තත්ත්වයට පත්වෙලා තිබෙනවා. දැන් මේ වන විට අම්බලන්ගොඩ දෙසිය ගණනක් වාර්තා වෙලා තිබෙනවා.මේ සඳහා බොහෝ දෙනෙකුට රුධිර පරික්ෂාවක් කරගැනිමට සිදු වෙනවා මේ ඩෙංගුද කියා දැන ගැනිමට. එයට රු.3000ක පමණ මුදලක් යනවා.බලපිටිය රෝහලෙත් රෝගින්ගේ තදබදය නිසා මෙය ගැටළුවකට මතුවෙලා තිබෙනවා. පොල්වත්ත රෝහලේ අක්කර 5ක් තිබෙනවා භූමිය විතරක්. පරිත්‍යාග කරන ලද ගොඩනැගිලිම තිබෙනවා විශාල ප්‍රමාණයක්.එවගේ හරි විශේෂ ඒකකයක් ඇති කරන්න පුළුවන්නම් මේ ඩෙංගු වකවානුව තුළ එය ඉතාමත් වැදගත්. මා හිතන්නේ එය ඉල්ලා සිටින්න ඕන . මෙම රෝහල දකුණු පළාත් සභාවට කොහේ අයිති.දකුණු පළාත් සෞඛ්‍ය සේවා ලේකම්තුමාට දන්වා යවන්න.ගරු ආණ්ඩුකාර තුමාටත් යැව්වාට කමක් නැහැ.මෙය හදිස්සියේම කළ යුතුයි. මේ ඩෙංගු .උවදුර ඇති කාලයක. අපි ගරු මන්ත්‍රිතුමා ගෙන එනු ලැබූ හොඳ යෝජනාවකි.ගරු මන්ත්‍රිවරු 16ක් සහායෝගය ලබා දි තිබෙනවා.හැකි ඉක්මනින් මෙවගේ දේවල් ක්‍රියාත්මක කරන්න. නගර සභාවත් බැඳි සිටිනවා ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවා ලිමට.නගර සභාවෙන් මුලිකත්වය ගෙන ඒ අවශ්‍ය දෙයක් තිබෙනවා නම් වියදම් වුණත් කමක් නැහැ. ලබා දෙන්න. සෞඛ්‍ය ලේකම්තුමාත් දැන්වත් කර සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි මගගේ චම්පා සුමුදු කුමාරි මැතිතුමිය කතා කරමින්.</u>

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතා ගෙන ආ යෝජනාව ගැන මාත් කරන්න ඕන.බලපිටිය මුලික රෝහලේ ඉතාමත්ම තද බදයක් තිබෙනවා.2,4,12 ආදි වාට්ටුවල රෝගින් පිරි තිබෙනවා. මොකද මා අත්දැකිමෙන් දන්නවා. මගේ පුතා ඩෙංගු රෝගියෙක් විදියට එහි ප්‍රතිකාර ගනු ලැබුවා.මා පෞද්ගලිකව පවා මැදිහත් වි තිබෙනවා පවිත්‍ර කිරිම් වැනි කටයුතු වලට.විශේෂයෙන් ස්තුති වන්ත වෙන්න ඕන වෛද්‍යවරුන් , හෙදියන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයට. ඒ අය අතිවිශාල මෙහෙවරක් කරනවා.ඇත්තටම ඒ අයට කන්න බොන්න වත් වේලාවක් නැහැ. මා සිටිය නිසා එය දුටුවා. විශේෂයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා ඒ සඳහා. මේ තදබදය වලක්වා ගැනිම සඳහා ගරු නගර සභා මන්ත්‍රි රාහුල මැතිතුමා ප්‍රකාශ කළ පරිදි ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මැතිතුමාගේ යෝජනාවට අනුව පොල්වත්ත රෝහලේ ඒ වෙනුවෙන් යොදා ගන්න පුළුවන්නම් එය ඉතා වටිනවා. ඩෙංගු රෝගි ප්‍රතිශතය වැඩිවිමක් මිස අඩුවිමක් නැහැ මේ පවතින තත්වයක් එක්ක.ඒ පිළිබඳව ඔබ සියළු දෙනාගේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ මහජන සෞඛ්‍ය මහත්වරුන් ඇතුළු සියළුම දෙනාට . දැන් පින්නදූවේ ඩෙංගු රෝගින් 10ක් විතර හිටියා. ඒ සියළුම තැන්වලට දුම ගැසිමට පැමිණියා. අපේ නිවසට පැමිණෙන විට මා රෝහලට ගිහිල්ලා.මට දුරකථන ඇමතුමක් ලබා දි කිව්වා දුම ගැසිමට පැමිණි බව. මා ප්‍රකාශ කළා විනාඩි 5ක් ඇතුළත පැමිණෙන බව. මා ත්‍රිරෝද රථයකින් පැමිණ මා එයට ගොඩක් උදවු කළා.ජනතාවගේ ඇත්තටම පිරිසිදු කමත් අඩුයි. එ අයත් මා කලින්ම දැනුවත් කළා. මේ පිළිබඳව මා විපක්ෂ නායකතුමාට විශේෂයෙන්ම සඳහන් කරනවා . ඔබතුමලා සියළු දෙනාගේම සහායෝගය මේ සඳහා ලබා දෙන්න. ඩෙංගු කියන්නේ මාරාන්තික රෝගයක්.අපි හැමදෙනාම දන්නවා. මා ඉල්ලා සිටිනවා මෙයට ඉතා ඉක්මනින්ම පියවරක් ගන්නා ලෙස.

<u>ගරු නගර සභා මන්ත්‍රි මගගේ ඩෙනට් පනියන්දුවගේ කතා කරමින්.</u>

ගර උපසභාපතිතුමනි, ඇත්තෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පොල්වත්ත රෝහලේ රුධිර පරික්ෂණ ඒකකයක් ඉතා ඉක්මනින්ම ස්ථාපිත කර ගැනිමට හැකිවෙයි.2018 වර්ෂයේ ඩෙංගු රෝගින් 450ක් පමණ සිටියා.2014,2015, 2016,2017,2018 වර්ෂවල ඩෙංගු රෝගින් කොපමණ ප්‍රමාණයක් සිටියාද කියා සෞඛ්‍ය අංශයෙන් තොරතුරු ටික

ලබා දෙන්න. දැනට ආපු තොරතුරුත් ඇති.එම තොරතුරු ටික ලබා දෙන්න. එවිට මා ගරු සභාපතිතුමාටත් පිටපතක් දමා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් පොල්වත්ත රජයේ රෝහලේ ඩෙංගු රෝගීන් සඳහා විශේෂ රුධිර පරික්ෂණ මධ්‍යස්ථානයක් ආරම්භ කිරිමට කටයුතු සලසා දෙන්නම්. අවශ්‍ය කරන පහසුකම් ගරු රජිත ඇමතිතුමගෙන් ලබා ගන්න පුළුවන් වෙයි. කරුණු කරණා ටික ලබා දෙන්න. මා මෙය අතේම ගොස් කරගෙන එන්නම්. වෛද්‍ය අමල් හර්ෂණ සිටිනවා. එතුමා උදවු කරනවා අම්බලන්ගොඩට.කරගන්න අපහසුතාවයක් වෙනකන් නැහැ.ඒ විස්තර ටික මට ලබා දෙන්න.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්.__

ගරු ජනතා විමුක්ති පෙරමුණේ නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාමත් කාලෝජිතයි. වර්තමානයට ගැලපෙන යෝජනාවක්. අපි අම්බලන්ගොඩ නගර වැසියන් විදියට අපට තිබුණ එකම රෝහල පොල්වත්ත රජයේ රෝහල . අපි සියළු වෛද්‍ය පහසුකම් සපයා ගනු ලබන්නේ බලපිටිය මූලික රෝහලෙනි.මේ වන විට පොල්වත්ත රෝහල අත්හැර දමන තත්ත්වයට පත්කර තිබෙනවා.බොහෝ වේලාවට පොල්වත්ත රජයේ රෝහලේ වාට්ටු හිස්.වෛද්‍යවරු හා හේදියන් ඇතුළු සේවකයන් සිටිනවා.නමුත් ඉන් ජනතාව සේවය ලබා ගැනිමට අඩුයි.මේ නිසා වරින් වර ඩෙංගු උවදුර ඉස්මතු වෙනවා.මෙය සඳහටම නවතින්නේ නැහැ.මේ තත්ත්වය යටතේ දුප්පත් ජනයාට ප්‍රශ්නයකි. ඩෙංගු මදුරුවා දුප්පත් ද පොහොසත් ද කියා බලන්නේ නැහැ.ඉතාමත් දුප්පත් තත්ත්වයේ මිනිසාටත් මෙය වෙනවා.ඒ අයට අවශ්‍ය වෛද්‍ය පරික්ෂණ බලපිටිය රෝහලේ සිට පෝලිමේ සිට කර ගැනිමට යන විට වැඩි වේලාවක් ගත වේ. එම නිසා ඒ ජනතාව හියට තමන්ගේ දරුවන් හෝ හිතවතා මේ ව්‍යාසනයට ගොදුරු වෙලා තිබෙන විට ණය වි හරි මේ රුධිර පරික්ෂණය කර ගන්නවා.ඒ අය ඉතාමත් අසිරුතාවයකට පත්වෙනවා. රජයෙන් සෞඛ්‍ය සේවාව නිකං ලැබෙන අවස්ථාවක ඒ ජනතාවට එය අයිතියි.එම නිසා අපට යුතුකමක් තිබෙනවා දකුණු පළාත් අධ්‍යාක්ෂකගෙන් හෝ දැන් බලය තිබෙන්නේ ආණ්ඩුකාරතුමාට . ඔවුන් සමඟ සාකච්ජා කර පොල්වත්ත රෝහලට රුධිර පරික්ෂණ ඒකකයක් ලබා ගැනිමට එම ආයතන දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.එතුමාගේ යෝජනාව යටතේ ඉතාමත් කාලෝචිත යෝජනවාක්. අපි ඒ ගැන සතුටු වෙනවා.

__මූලාසනය – ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්__

ඇත්තටම විපක්ෂ නායකතුමා සම්බන්ධ වෙලා මෙය ඉෂ්ඨ කරගැනිමට පුළුවන් වුණොත් හොඳයි . දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට දන්වා. එතරම් මුදලක් වැයවෙන්නේ නැහැ මේ රුධිර පරික්ෂා කරන යන්ත්‍රයක් මිලදී ගැනිමට.එහෙම වුණොත් ලොකු සහනයක් වෙනවා. බලපිටිය රෝහලට ගොස් පෝලිමේ සිට සවස් වි තමයි පැමිණිමට වන්නේ.මොනවා වුණත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගනු ලැබූ ඔය තීරණය ක්‍රියාත්මක වුවා නම් පොල්වත්ත රෝහලට ඔය තත්ත්වය ඇති වෙන්නේ නැහැ.එතුමා ලොකු උත්සාහයක් ගත්තා අංශ දෙකක් හරි පොල්වත්ත රෝහලට ගෙන එමට.එය ඉටු කිරිමට දුනනේ නැහැ බලපිටිය රෝහලෙන් . ඒ එක ඒකකයක් දෙකක්වත් ගෙන එමට දුන්නේ නැහැ බලපිටිය රෝහලෙන්. අපි හොඳටම දන්නවා. ඒ සාකච්ජාවලට සහභාගි වුවා. ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා දන්නවා.අපි ගරු මන්ත්‍රීවරු පමණක් සහභාගි විමට කියා තිබූ සාකච්ජාවකට දකුණු පළාත් අධ්‍යක්ෂක තුමා මුණ ගැසිමට ගියා. බලපිටියේ ගරු මන්ත්‍රීවරු පමණක් සහභාගිවන්න කියා තිබුණා.නමුත් බලපිටියේ ගරු මන්ත්‍රීවරු සමඟ බස්රථ 4ක් 5ක් පමණ ජනතාව පැමිණ දකුණු පළාත් අධ්‍යක්ෂකතුමියට ගහන්නත් හදා ඒ කාලයේ වෛද්‍ය රණසිංහ මහතාගේ බිරිඳ තමයි එවකට දකුණු පළාත් අධ්‍යක්ෂකතුමිය හිටියේ. එතුමියටත් දැඩි ඕනැකමක් තිබුණා.එම නිසා මෙය කරගන්න දුන්නේ නැහැ. ලොකු ගැටළුවක් ඇති කළා.එතුමා ඉන්පසුව තමයි පොල්වත්තේ ආයුර්වේද රෝහල ඉදිකරනු ලැබුවේ.මේ රුධිර පරික්ෂාව හරි කර ගැනිමට පුළුවන්නම් විපක්ෂ නායකතුමනි, ඔබතුමාලාගේ ආණ්ඩුවක් තිබෙන්නේ.අපිට පුළුවන් දේ අපිත් කරන්නම්. ගරු ආණ්ඩුකාරතුමා හරහා මෙය කරගන්න පුළුවන්නම් ලොකු දෙයක්.මෙය හොඳ යෝජනාවක්. මේ සඳහා අපගේ අනුමතිය ලැබෙනවා.ලේකම්තුමියණනි , විපක්ෂනායකතුමාට අවශ්‍ය ලිපි ටික ලබා දෙන්න. ගරු ආණ්ඩුකාරතුමාටත් දන්වා ලිපි සකස් දෙන්න.ඉතා ඉක්මනින්ම මේ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය කටයුතු සූදානම් කරන ලෙස ඉල්ලා සිටිනවා.

## 06. කාරක සභා වාර්තා සලකා බැලීම

**06.01 2019.05.21 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

පුස්තකාල කමිටු වාර්තාව මා යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මැතිතුමිය කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා

**තීරණය-**
2019.05.21දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2019.05.27. දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මුල්‍ය කමිටු වාර්තාව මා යෝජනා කරනවා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>**

මුල්‍යා කමිටු වාර්තාවේ අපගේ වෙසක් උත්සවයට GI බට ගත්තා කියා තිබෙනවා.මෙවැනි දේවල් ගන්නා විට තොගයට ගන්නවාද ? පූර්ණා වෙළඳසැලෙන් එහෙම තොග ගණනට ගන්නවාද?

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මෙය ලබා ගෙන ඇත්තේ බෞද්ධ සිද්ධාස්ථාන පෙන්නුම් කිරිම සඳහා අපට ලබා දි තිබුනා සලකුණක්.ඒ සලකුණ පෙන්නුම්කිරිම සඳහා එම සලකුණ ලබා දුන් මහතාම අපට පයිප්ප ගැනිමට රු.25000/= ක මුදලක් ලබා දුන්නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>**

අපි සතුටු වෙනවා. මෙහි නාගරික සංවර්ධන අධිකාරියට බස්නැවතුම්පොළ ඉදිකිරිම වෙනුවෙන් ලක්ෂ 75ක මුදලක් ලබා දුන්නාද?මෙහෙම දේශිය හා විදේශිය ණය ලබා ගැනිමේදි මෙසේ නිරවුල් වෙනවා නම් අපට මීට වඩා දිර්ඝ ගමනක් යා හැකිය. අපි සතුටු වෙනවා.ඔබතුමාට මේමුදල් ගෙවීම පිළිබඳ ස්තුති වන්ත වෙනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මෙහිදි අප සඳහන් කළ යුතුයි නාගරික සංවර්ධන අධිකාරියට ලක්ෂ 75ක් ගෙවනවා වගේම නාගරික සංවර්ධන අධිකාරිය විසින් අම්බලන්ගොඩ නගර සභා තනායම සඳහා ගෙවිය යුතු මිලියන 07.06 ක් ( වැට් මුදල හැර) හිලව් කිරිමට තින්දු කර තිබෙනවා. ඒ අනුව බස්නැවතුම්පොළ හා සාප්පු සංකිර්ණය සඳහා ගනු ලැබු සම්පූර්ණ මුදලින් සාප්පු සංකිර්ණ සඳහා ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන ලක්ෂ 174ක් මේ වන විට ගෙවා නිමකර ඇත.බස්නැවතුම්පොළ සඳහා ලක්ෂ 151ක් මේ වන විට ගෙවා අවසන්.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්

පයිප්ප ගෙන බෝඩ් වගයක් ගසා තිබෙනවානේ ඔබතුමා. දැන් මා අසන්නේ මෙහි ධර්මචක්‍රය වැරදියි කියා ගරු ස්වාමින් වහන්සේලා දොස් නගනවා.දැන් අපෙනුත් විමසනවා. අපි දන්නේ නැහැ. පසුව තමයි එදා රැස්වීමට පැමිනි විට ඔබතුමා ප්‍රකාශ කළේ.මෙවැනි දේවල් කරන විට අපිව දැනුවත් කරන්න.අපිට ප්‍රශ්නයක් නැහැ. මෙවාට ජනතාව අසන ඒවාට පිළිතුරු සැපයිය යුතුයි.එක් පුද්ගලයෙකු පැමිණ ඡායාරූපයක් ගෙනවිත් පෙන්වනවා ධර්මචක්‍රය හඳුන ගන්න බැරිද කියා.මෙය සභාවට දමා දැනුවත් කලානම් අපට පිළිතුරු දෙන්න තිබුණා.අපිත් දන්නේ නැහැ. මෙය එක රාත්‍රියක ගසා දමා තිබෙනවා.අපරාදේ වියදමක් දරන්න වෙන්නේ කාගේ මුදල් වුණත් .මෙය දැනුවත් කර කරන්න. අපට උත්තර දෙන්න බැහැ.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්

මා එයට පිළිතුරක් ලබා දෙන්නම්.මේ ලකුණ දැනට කැනඩාවේ භාවිතා කරන ලකුණකි.කැනඩාවේ බෞද්ධ කෞතුගාරය කියන ආයතනයෙන් තමයි මෙය ලැබී තිබෙන්නේ.ඒ අය ඉල්ලා සිටියා මෙය බෞද්ධ සිද්ධාස්ථාන හඳුනා ගැනිම සඳහා මෙය සවිකරන ලෙස.මේවා සවිකිරිමට යන මුදල කියා රු.25000/= ක මුදලකුත් පරිත්‍යාග කළා.එතුමාලාගේ මුදලින් තමයි මේ වැඩ කොටස කරනු ලැබුවේ.අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ කිර්තිමත් ආදි සිසුවෙකු වන විජිත ලීලාරත්න කියන මහතා තමයි මේ මුදල පරිත්‍යාග කරනු ලැබුවේ.මේ කරන ලද ඉල්ලිම ප්‍රකාරව තමයි මෙය ඉටු කළේ.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්

කළාට කමක් නැහැ. අපි මේවාට පිළිතුරු සැපයිය යුතුයි.මේ එන්.ජී. ඕ අය සමඟ වැඩ කිරිමට හරි අමාරුයි. ඔවුන් ඡායාරූප කිහිපයක් ගසාගෙන ගොස් මේවා පෙන්විමෙන් අපට නැති ප්‍රශ්න ඇතිවේ.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්

එතුමා ඉතා හොඳ මහත්මයෙකි.එහෙම පුද්ගලයෙකු නෙමේ.එතුමාගේ පියාගේ ගම කෝට්ටේගොඩ. මේ වන විට එම කෝට්ටේගොඩ විහාරස්ථානයකට ලක්ෂ 550ක ගරු ස්වාමින් වහනිසේලා සඳහා නැවතිම සඳහා ආරාමයක් හදනවා.එතුමා අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ බෞද්ධ සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු සිදු කර තිබෙනවා.එතුමා බෝගහවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මේ ළඟදි ලංකාවට පැමිණ ගියා.එතුමාගේ ප්‍රධානම ඉල්ක්කය වි ඇත්තේ බෞද්ධාගම වෙනත් රටවල නැංවිම සඳහා ගරු ස්වාමින් වහන්සේලාගේ ඉංග්‍රිසි දැනුම වැඩි දියුණු කිරිමයි.එතුමා ප්‍රකාශ කළා අපගේ ගරු ස්වාමින් වහන්සේලා පිටරට වලට ගිය විට සිංහල අයට ධර්ම දේශනා සිංහලෙන් දේශනා කරන අතර ඒ රටවල අයට ධර්ම දේශනා පවත් වන්නේ නැත්තේ ඉංග්‍රිසි භාෂාවෙන් ධර්ම දේශනා පැවැත්විමට හැකියාව ගරු ස්වාමින් වහන්සේලාට නැතිකම නිසාය.එතුමාගේ බලාපොරෝත්තුව වි ඇත්තේ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ගරු ස්වාමින් වහන්සේලටත් ඉංග්‍රිසි මධ්‍යයෙන් ධර්ම දේශනා පැවැත්විමට කටයුතු කිරිමට. එතුමාගේ නිවස මේ සඳහා පැමිණෙන ආරාමයක් වශයෙන් සකස් කර ඇත. මා එම උත්සවයට සහභාගි වුවා.එතුමා හොඳ චේතනාවෙන් වැඩ කරන පුද්ගලයෙකි.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්

හරි .එය වෙන්නැති. එකපාරටම මේ බෝඩ්එක ගැසුවිට පසුගිය කාලයේ රටතුල සිදුවු සිද්ධි සමඟ විහාරස්ථාන පෙන්විමට මෙය ඉදිකළාද කියා ප්‍රශ්න හරියට. දැන් ඔබතුමා දැනුවත් කළ නිසා මේ පිළිබඳ දැනුවත් කළ හැක.ධර්ම චක්‍රය වැරදියි කියන ආදි ප්‍රශ්න තමයි.

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්

මා ඔයකියන ප්‍රශ්නය ඇසුවා.මා එතුමාගෙන් ඇසුවා. මේ එක එක රටවල භාවිතා කරන ක්‍රම තිබෙනවා.ලංකාවේ, ඉන්දියාවේ,තායිලන්තයේ , කැනඩාවේ ආදි රටවල එක විදියක්. බෞද්ධ කොඩිය වුණත් එක එක රටවල එක එක වර්ණ භාවිතා කරනවා.ඒ රටවල් වල හැටියට තමයි එක තිබෙන්නේ.එතුමාට අවශ්‍ය වෙලා තිබුණේ තමන්ගේ

නගරයට මෙවගේ බෝඩ් ටිකක් සවිකර ඒ ප්‍රදේශය තුලින් යම්කිසි මුදලක් ලබා ගෙන බෞද්ධ කටයුතු නංවා ලිම සඳහායි.

**තීරණය-**

2019.05.27 දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2019.05.29 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ටෙන්ඩර් කමිටු වාර්තාව මා යෝජනා කරනවා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා

තීරණය-
2019.05.29 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2019.05.23. දින පැවැති ක්‍රිඩා කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ක්‍රිඩා කමිටු වාර්තාව මා යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා. ඒවගේම මා මිට මාස දෙකකට පෙර මානාන ක්‍රිඩා පිටිය සඳහා කසළ දැම්මට බැරල් දෙකක් ඉල්ලා සිටියා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

එය ලබා දුන් බව පවසනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මස 08 දා ජාතික ක්‍රිඩා උළෙල පැවැත්වෙනවා.ඊට ප්‍රථම මෙම බැරල් දෙක ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ක්‍රිඩා කමටු වාර්තාවේ එය ලබා දුන් බව අපට කිව්වා.හිමාල් මහතා මෙය ලබා දුන්නේ නැද්ද?මෙය හදා තිබ් වැඩක් නැහැ එයට ගෙන යන්න.08 දාට කලින් එය ගෙනියන්න. පළාත් තරඟ පවත්වනු ලබන්නේ මානාන ක්‍රිඩා පිටියේ සහ පොල්වත්ත ක්‍රිඩා පිටියේ.එම නිසා ඊට කලින් මෙය යවන්න.

**තීරණය-**
2019.05.23 දින පැවැති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2019.05.14 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව මා යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. නන්දන රාජපක්ෂ මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**
2019.05.14 දින පැවැති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.06 2019.05.28 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

කළමනාකරණ කමිටු වාර්තාව මා යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. නන්දන රාජපක්ෂ මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**
2019.05.28 දින පැවැති කළමනාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.07 2019.04.08 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව හා ඒ සම්බන්ධ 2019.05.16 දින පැවති තාක්ෂණ ඇගයීම් කමිටු සරාංශ වාර්තාව සභාගත කරන ලදි**

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

2019.04.08 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව හා ඒ සම්බන්ධ 2019.05.16 දින පැවති තාක්ෂණ ඇගයීම් කමිටු සරාංශ වාර්තාව මා යෝජනා කරනවා

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**
2019.04.08 දින පැවැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව හා 2019.05.16 දින පැවති තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06.08 2019.05.30 දින පැවති රථ වාහන හා ත්‍රිවිල් රථ කමිටු වාර්තාව.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

රථ වාහන හා ත්‍රිවිල් රථ කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ත්‍රිවිල් රථ කමිටුව මාගේ නම ඇතුළත් වි තිබෙනවා. නමුත් මට ආරාධනා ලැබෙන්නේ නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ගියවසරේ කමිටුව සඳහා සහභාගි වූ අය වෙනස් වී තිබෙනවා.මා යෝජනා කරනවා ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියගේ නමත් යෝජනා කරනවා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ගැටළුවක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙම කමිටුව සඳහා ගරු චම්පා සුමුදු කුමාරි මහත්මියගේ නම යෝජනා වි තිබුණේ. එතුමියට පැමිණිමට නොහැකියි .මා ඒ වෙනුවට සහභාගි විමට කැමතියි.පසුගිය කමිටු වාරයටත් මා පැමිණියා.

**<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ඒ අනුව ගරු සභාව විසින් එස්.එම්. සරත් චන්ද්‍ර මහතා නමත් ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියගේ නමත් රථ වාහන හා ත්‍රි රෝද රථ කමිටුව සඳහා ඇතුළත් කිරිමට තින්දු කරනවා.

**තීරණය-**
2019.05.30 දින පැවැති රථ වාහන හා ත්‍රිරෝද රථ කමිටු වාර්තාව පිළිගත යුතු බවත්, ත්‍රිරෝද රථ කමිටුව සඳහා ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.නිලානි මෙනවියගේ නම සහ ගරු නගර සභා මන්ත්‍රී සරත්චන්ද්‍ර මහතාගේ නම ඇතුලත් කිරිම සුදුස බවත්, ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

- පස්වරු 12.05 ට පමණ ටෙන්ඩර් හා මිළ ගණන් විවෘත කරන ලදී.

**07.** **ටෙන්ඩර් හා මිළ ගණන්**

**07.01** **ටෙන්ඩර්:-**

**07.02** **මිළ ගණන් :-**

**07.02.01** **අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය වල්නාශක මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්**

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ලක්මාල් ඇගෝ මර්චන්ට් | ජයවීර ඇග්‍රෝ කෙමිකල්ස් |
|---|---|---|---|---|
| 01 | වල් නාශක | ලීටර් 01 | රු.2200/= ( Diuron) | රු.3100( හයිඩෝන්) |
| 02 | වල් නාශක | 400ml | රු.900/=MCPA 60% | |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය වල්නාශක මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ලක්මාල් ඇග්‍රෝ මර්චන්ට් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.02** **අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය රේසර් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන්**

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | නිව භාවානා මොටර්ස් | විජේසූරිය මොටර්ස් | අමන්දා මොටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | 30209 රේසර් | ජපන් | රු.1700/= | රු.1950/= | රු.1900/= |
| 02 | 3211Jරේසර් | ජපන් | රු.3100 | රු.3800/= | රු.3600/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය රේසර් මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති නිව් හවනා මෝටර් ස්ටෝස් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

## 08 ගෙවීම

08.01 අම්බලන්ගොඩ නගර සභාවට කොන්ත්‍රාත් වෙනුවෙන් තැන්පත් කරන ලද රු.34500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි කේ. ආර්.කේ . එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ගෙවිම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.02 පටබැඳිමුල්ල ළිඳ අයත් භූමිය සංවර්ධන කටයුතු හා කාණු ( රේණුක මොටර්ස් අසළ ) ඉදිකිරිමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.17000.23ක මුදලක් පෝරම 86සී , ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.03 පටබැඳිමුල්ල ළිඳ අසළ අලුත්වැඩියා කටයුතු කිරීම ( රේණුක මොටර්ස් අසළ ) ඉදිකිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.30447.37 ක මුදලක් පෝරඹ 86සී , ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.04 කරිත්ත කන්ද සක්වා ප්‍රින්ටර්ස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.59683.75 ක මුදලක් විලේගොඩ, ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.05 හල්වතුර කසළ අවසන් බැහැරලන භූමියට පිවිසෙන මාර්ගයේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රැඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.36781.68 ක මුදලක් විලේගොඩ, ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.06 අම්බලන්ගොඩ වෙරළ පිවිසුම් මාර්ගය සකස් කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.29431.79 ක මුදලක් පෝරඹ 86සී , ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.07 අම්බලන්ගොඩ නගර සභාවට කොන්ත්‍රාත් වෙනුවෙන් තැන්පත් කරන ලද රු.34500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි කේ. ආර්.කේ . එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.08 2019.04.01 සිට 2019.04.30 දින දක්වා ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් රු.234072.29 මුදලක් LRDC SERVICES (PVT) LTD ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.09 වරිපණම් අංක 349 ඔටෝ (පුද්)සමාගම සතු අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණයේ ඉහළ වු භූමිය මිනුම් කටයුතු කර පිඹුර පිළියෙල කිරීම වෙනුවෙන් රු.30000/= ක මුදලක් රබින් චන්ද්‍රසිරි මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.10 2019 අප්‍රියල් මාසය සඳහා කාර්යාලයේ අභ්‍යාන්තර දුරකථන පද්ධතිය වෙනුවෙන් රු.13770.07 ක මුදලක් ලංකා බෙල් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.11 අම්බලන්ගොඩ නගර ශාලා කාර්යාලය සඳහා කොටස් කිරීමේ කර්මාන්තයේ රුදවුම් මුදල වන රු.16292.50= ක මුදලක් පී.එච්.රංජිත් චන්ද්‍රසිරි මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.12 කෙරමිණිය පොකුණ පාර කාණු පද්ධතිය කොටසක් සකස් කිරීමේ කර්මාන්තයේ රුදවුම් මුදල වන රු.25219.58 ක මුදලක් පනියන්දුව ප්‍රජා මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.13 සුදුවැල්ල 11 වන හරස් පාර අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරීමේ කර්මාන්තය සඳහා රු306922/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි කේ.ආර්.කේ එනටර්ප්‍රයිසස් ආයතනයටට ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.14 2019.06.01 දින පැවැත්විමට නියමිත අනුකම්ටුවල ක්‍රියාකාරිත්වය විධිමත් කිරිමට පුහුණු වැඩසටහන සඳහා සභා අනුමතියට යටත්ව දේශක ගාස්තු වෙනුවෙන් රු.20000/= ක මුදලක් පී.ඒ.පී.පී.අභයවර්ධන මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.15 අම්බලන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් වෙනුවෙන් රු.123000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.16 අම්බලන්ගොඩ නගර සභාව විසින් හිඟ විගණන ගාස්තු වශයෙන් රු.3400447.50 ක මුදලක් විගණකාධිපති වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>
මෙහි පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. විගණක ගාස්තු වැරදියි වගේ. ලක්ෂ 34 ගාණක් දමා තිබෙනවා.

<u>මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
මෙහි රු.3400447.50 ක මුදලක් සඳහන් කර තිබෙනවා. එය නිවැරදිද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

දැන් මේකම විගණනය කරන්න වෙනවානේ.ලක්ෂ 34 ක් කියන්නේ සෙල්ලමක්ද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

මෙය ඉදිරිපත් කරන ක්‍රමයක් තිබෙනවා. මේ සියල්ල එකට දමන්නේ.

**<u>මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

අඩුම ගණනේ ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනීමට දැම්මා නම් හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ගරු මන්ත්‍රීවරු විදියට මේ සඳහා අනුමතිය ලබා දුන්නාම අපියි මේ සඳහා මුහුණ දෙන්නේ.පසුගිය වසරවල් වල අයවැය ලේඛණයේ මේවා පෙන්නා නැහැ.මෙහි අයවැය ලේඛණයේ ජංගම වියකිම් යටතේ පෙන්වා දී තිබෙනවාද ? මේ වසරේ හැර. අපි හිතමු ලක්ෂ 31 ක් කියා.

**<u>මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා , මෙහෙමයි ඉදිරිපත් කර තිබෙන්නේ . මේ අය සාදා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

එක නෙමේ මා කියන්නේ. එම රු.3400447.50 ක මුදල මා පිළිගන්නවා. මා අහන්නේ පසුගිය වසර වෙනකම් මෙහි හිඟ තිබුණානේ. අපි හිතමු පසුගිය වසර වෙනකම් ලක්ෂ 30ක් හිගයි කියා.මෙහි අයවැය ලේඛණයේ 2018/2019 වසර වල ජංගම වගකිමක් ලෙස පෙන්වා දී තිබෙනවාද?එහෙම පෙන්වා නැතිනම් අපිට මෙයට අනුමතිය දෙන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීවරු ලෙස මෙයට අත එසවීවාම . මෙය වැරදියි. අපි රු.3400447.50 ක් එකවර ගෙවන්න අවසර දුන්නාම අපියි මෙහි වැරදිකරුවන් වෙන්නේ. එම නිසා පසුගිය අයවැය වාර්තාවල මෙය විගණනය සඳහා පෙන්වා තිබෙනවානම් මුදල් ගෙවිය යුතුයි. හැබැයි මුදල් ගෙවන්නේ නැහැ. අපි නගර සභාව බැඳී සිටිනවා මුදල් ගෙවන්න ඒ ආයතනයට. එම නිසා එහෙම තිබෙන්න ඕන සටහනක්. එහෙම නැතුව මෙයට අත ඔසවන්න බැහැ. ගරු උපසභාපතිතුමා ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පසුයි මෙයට අනුමතිය දෙන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

මෙය පරික්ෂාවට යටත්ව එය අනුමත කරනවා.

**<u>මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මෙය විශාල ලිපි ගොණුවක් මෙය පෙන්වා හදා තිබෙනවා.2009.2018 වෙනකම් තමයි මේ රු.3400447.50 ක මුදලක් ගෙවීමට තිබෙනවා ගෙවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

මේ මුදල අයවැය ලේඛණයේ පෙන්වන්න.2018.12.31 දින වනවිට අයවැය වාර්තාවේ අපි ගෙවිය යුතු මුදල වන රු.3400447.50 පෙන්වා තිබිය යුතුයි.එකයි මා අසන්නේ. නැතිනම් කොහොමද 2019 වර්ෂයට මේ මුදලට අනුමතිය දෙන්නේ.එතැන ප්‍රශ්නයක් තිබෙනවා. එයට යටත්ව ගෙවිය හැකියි.එක හරිනම්.විගණන දෙපාර්තමේන්තුවෙන් මේ මුදල ගෙවන්න කියන එකත් හරි මේ මුදල ගෙවන්න තිබෙනවා . එකත් හරි .අපි සභාවක් විදියට මෙය ගෙවන්න අනුමතිය දෙන්න කියා අනුමත කරන්න එය අයවැය ලේඛණයේ තිබිය යුතුයි.වකගිම් විදියට. ඕනතරම් ආයතන වලට අපි ගෙවන්න තිබෙන ඒවා වගකිම් විදියට පෙන්වනවානේ.

<u>මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

අයවැය වාර්තාව මීට සම්බන්ධ වෙලා නැහැ.ඒ අයවැය ලේඛණය පරික්ෂා කර බලා එය සඳහන්ව ඇත්නම් ඊට යටත්ව ගෙවීමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

08.17 අම්බලන්ගොඩ බස්නැවතුම්පොළසඳහා මසකට රු250000/= ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.18 සෞඛ්‍ය අංශයට අවශ්‍ය අත්කරත්ත 03ක් සෑදීම වෙනුවෙන් රු.99450/= ක මුදලක් සංදීප ලේක් වර්ක්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.19 තාර බැරල් 50ක් ( කර්මාන්ත අංශයට ) ගැනීම වෙනුවෙන් රු.825000/= ක මුදලක් බිටුමික්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.20 ආදාහනාගාර ගෑස් සැපයීම වෙනුවෙන් රු.48400/= ක මුදලක් අරුණ ගෑස් සෙන්ටර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.21 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් රු.116500/= ක මුදලක් රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.22 අම්බලන්ගොඩ නගර සභා කර්මාන්ත අංශයට හා සෞඛ්‍ය අංශයට අවශ්‍ය උපකරණ සැපයීම වෙනුවෙන් රු.106177.10 ක මුදලක් රජයේ වාණිජ (විවිධ) නිතිගත සංස්ථාව ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.23 ජල සැපයුම ලබා ගැනිම සඳහා මාර්ග පලුදු කිරිම වෙනුවෙන් රු.6844.80 ක මුදලක් එස්.එච්.පියුමි තනුජා ද සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.24 සුදුවැල්ල පාර අලුත්වැඩියා කිරිම වෙනුවෙන්( අමතර වැඩ ) රු.199420.84 ක මුදලක් තල්ගස්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර නරග සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**(09)** **ගිණුම්**

**09.01** 2019 අප්‍රේල් මාසයට අදාළ පොදු ගිණුම් - වියදම් විශ්ලේෂණය හා 2019 අප්‍රෙල් මාස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය

**(10)** **ඇස්තමේන්තු**

10.01 අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.400000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

තීරණය

අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය ( අදියර 02) සඳහා රු.400000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර නගර සභා මන්ත්‍රි සෝභිත රංජිත් මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.02 අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.400000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

**තීරණය**

අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය සඳහා රු.400000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර සභා මන්ත්‍රි සෝභිත රංජිත් මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.(අදියර 02)

10.03 අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය ( අදියර 03) සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.490000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදි

**තීරණය**

අම්බලන්ගොඩ විජයාරාම පාර කොන්ක්‍රිට් කාණු ඉදිකිරිමේ කර්මාන්තය ( අදියර 03) සඳහා රු.490000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.04 අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ගාමිණි විද්‍යාල මාවත පැතිබැම්ම ඉදිකිරිමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.320000/= ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදි

**තීරණය**

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ගාමිණී විද්‍යාල මාවත පැතිබැම්ම ඉදිකිරීමේ කර්මන්තය සඳහා රු.320000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මියගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ ඒකමති තීරණය

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ගාමිණී විද්‍යාල මාවත පැතිබැම්ම ඉදිකිරීමේ කර්මන්තය සඳහා රු.320000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මියගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.05 කළුවඩුමුල්ල ගාමිණී විද්‍යාල මාවත කොන්ක්‍රීට් ආවරණ පුවරුව ඉදිකිරීමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.21000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.05 කළුවඩුමුල්ල ගාමිණී විද්‍යාල මාවත කොන්ක්‍රීට් ආවරණ පුවරුව ඉදිකිරීමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.21000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

**තීරණය**

කළුවඩුමුල්ල ගාමිණී විද්‍යාල මාවත කොන්ක්‍රීට් ආවරණ පුවරුව ඉදිකිරීමේ කර්මන්තය රු.21000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මියගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.06 ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො01) ඉදිකිරීමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.290000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

තීරණය

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො01) ඉදිකිරීමේ කර්මන්තය රු.290000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.07 ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො02) ඉදිකිරීමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.490000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

තීරණය

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො02) ඉදිකිරීමේ කර්මන්තය රු.490000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.08 ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො03) ඉදිකිරීමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.340000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

තීරණය

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො03) ඉදිකිරිමේ කර්මන්තය සඳහා රු.340000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.09 ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො01) ඉදිකිරිමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.340000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

තීරණය

ඕකන්ද අත්කම් නිවාස පාර පැති බැම්ම (නො01) ඉදිකිරිමේ කර්මන්තය සඳහා රු.340000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.10 අම්බලන්ගොඩ විහාරගොඩ පාරේ හරස් කාණුව ඉදිකිරිමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.240000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

තීරණය

අම්බලන්ගොඩ විහාරගොඩ පාරේ හරස් කාණුව ඉදිකිරිමේ කර්මන්තය රු.240000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.11 හල්වතුර වාහන සේදුම් ස්ථානය ඉදිකිරිමේ කර්මන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.350000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

තීරණය

හල්වතුර වාහන සේදුම් ස්ථානය ඉදිකිරිමේ කර්මන්තය රු.350000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

10.12 කසළ තුනි කිරිම Dozer D-04 Tralelive යන්ත්‍රය ලබා ගැනිම සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.499500/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි ,මේ පිළිබඳව මා අදහස් හා යෝජනා ඉදිරිපත් කළා. අදත් මාසිකව මෙච්චර මුදලක් දිලා අවසාන වශයෙන් අපට මේ යන්ත්‍රයේ අයිතියක් නැති වෙනවා.මේ යන්ත්‍රයක් නගර සභාවට මිලදී ගැනිමට අපි යෝජනා කරනවා.මෙච්චර විශාල මුදලක් මේ යන්ත්‍රය සඳහා ගෙවනවා.දැන් වාර ගණනාවක් මා මේ යෝජනාව කළා.

<u>මුලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

යෝජනා කළා. ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා යෝජනා කළා.අපට පාවිච්චි කරන ලද යන්ත්‍රයක් ලබා ගන්න. අලුතින් යන්ත්‍රයක් මිලදී ගැනිමට විශාල මුදලක් වැයවෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>

අලුතින් එකක් කොපමණ මුදලක් වෙනවාද?

__මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

මෙය අලුතින් මිලදී ගැනිමට එක්කොටි 21 ලක්ෂයක පමණ මුදලක් වෙනවා. මේ මුදල ගෙවිමට පැමිණෙන්නේ මාස 6කට වරක් තමයි පැමිණෙන්නේ. ඒ ගෙවිම පැමිණියේ. දැන් මේ ඇස්තමේන්තුව ඉදිරිපත් කළේ.මේ අවස්ථාවේ මේ තත්ත්වය අනුව අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්__

නැහැ . අනුමත කරනවා.එක හරි . දැන් මීට මාස ගණනකට ඉහත දී තමයි මෙය කර ඇත්තේ. මෙවා ක්‍රියාත්මක වෙන්න.

__මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ඔබතුමා දන්නවා .ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අපට මෙය ලබා ගන්න අවසර ලබා දෙන්න කියා.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්__

නැහැ එය කරගත්තේ ගරු සභාපතිතුමාගේ කට නිසා. එය අපි වැඩය කරන්න හරිගස්සා ගෙන එනවිට ගරු සභාපතිතුමා දොඩවන්න ගත්තා.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්__

අපට ආණ්ඩුකාරතුමාගේ අවසර ගතහොත් මෙය ගැනිමට පුළුවන්ද ?

__මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

පුළුවනි.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්__

ලේකම්තුමියණනි. මට ලිපිය සුදානම් කර දෙන්න.ගරු සභාවේ සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත නගර සභාවේ මුදල් අපට නැති නිසා මෙය ලබා දෙන්න කියා. මා මේ යන්ත්‍රයක් ලබා ගැනිමට අනුමතිය අරගෙන එන්නම්.

__මූලාසනය ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

මේ තත්ත්වය අනුව මෙය අනුමත කරන ලෙසඉල්ලා සිටිනවා.ඩෙංගු උවදුර හා කුණු දමන ස්ථානයේ කුණු දැමීමට නොහැකි වී තිබෙනවා. එය තල්ලු කිරිමට සිදුවෙනවා

**තීරණය**

කසළ තුනි කිරිම Dozer D-04 Tralelive යන්ත්‍රය ලබා ගැනිම සඳහා රු.499500/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

### 10.13 මහ අම්බලන්ගොඩ පුස්තකාලය අසළ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.235000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි

**තීරණය**

මහ අම්බලන්ගොඩ පුස්තකාලය අසළ කාණුව ඉදිකිරිමේ කර්මාන්තය සඳහා රු.235000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.14 සුදුවැල්ල පාර ප්‍රතිසංස්කරණය කිරීමේ ( වැඩිපුර වැඩ සඳහා ) කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.270000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි**

තීරණය

සුදුවැල්ල පාර ප්‍රතිසංස්කරණය කිරීමේ ( වැඩිපුර වැඩ සඳහා ) කර්මාන්තය සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.270000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.15 හල්වතුර ළමා උද්‍යානයේ ඇතුල්වීමට ( Cover Slab) සකස් කිරිම සඳහා තාක්ෂණසේවා නිලධාරින් විසින් සකස් කරන ලද රු.90000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි**

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මැතිතුමිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, හල්වතුරේ ළමා උද්‍යානය ගැන කතා කරන විට එහි ඇති ඇවිදින මංතිරුව නඩත්තු කටයුතු සිදු කරන්න. හෙට දිනයේ වුණත් කමක් නැහැ මෙය සුද්ද කරන්න.මා ඉල්ලා සිටිනවා සේවකයන් යොදවා මෙය පිරිසිදු කටයුතු සිදු කරන ලෙස.

<u>**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**</u>

එය අපේ සභාවේ වත්කමක්.එය නඩත්තු කරන්න සෞඛ්‍ය අංශයෙන්

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

කැලේ වැවුණු විට සත්තු සිටිමට පුළුවන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, හල්වතුර ළමා උද්‍යානයට Over Slab දමන රු.90000/= ක ඇස්තමේන්තුවක් මේ ඉදිරිපත් කර තිබෙන්නේ.දැන් වන විට මෙය හල්වතුර ළමා ක්‍රිඩාංගණය නෙමේ . බස්රථවලට ක්‍රීඩා කරන්න තමයි ලබා දි ඇත්තේ.ප්‍රදේශයේ ජනතාවගේ දැඩි විරෝධතාවයක් මේ සඳහා තිබුණා.ගරු මන්ත්‍රීවරයා දැඩි විරෝධය දක්වද්දි තමයි මේ කටයුත්ත සිදු කළේ. අපේ යාබද ඉඩම තිබේද්දි හල්වතුර ළමා ක්‍රිඩාංගණයේ කාණුව පස් දමා ගොඩකර වසා බස්රථ ගැනිමට. මා දන්නේ නැහැ නගර සභාව මෙවැනි කටයුතු කරන්නේ කොහොමද කියා මට ජේන විදියට. ඒ අසළ නිවාස දෙකක මිනිසුන් දෙදෙනෙකුට උණ.කොහෙන් ඩෙංගු හැදුනාද කියා මා දන්නේ නැහැ.සුමානයක් විතර ජලය බැස යන්නේ නැතිව තිබ් යාන්තම් අපේ සේවකයන් ගිහින් පස්ටික ඇඳ දැමුවා.කාණුවේ උඩින් සිලින්ඩරයක් දමා යටින් පස්ටික ඉවත් කර තමයි පැමින ඇත්තේ. ඒ අයට තෙරෙන විදියට තමයි කර ඇත්තේ. වෙන කරන්න දෙයකුත් නැති නිසා.මෙහි දැන් සම්පූර්ණයෙන්ම ක්‍රීඩාංගණය මඩ කර ඇත. දැන් දරුවන්ට සෙල්ලම් කරන්න පුළුවන් තත්වයක නැහැ.ඒ මදිවට එම බස්රථ රියදුරන් එහි බස්රථ ගාල් කරන්නේ නැහැ. පුරුදු විදියට මාර්ගයේ සැම තැනම ඒවා ගාල් කරනවා.හරි අපරාදයක් කළේ මේ අපේ ඉඩම් ටික. සභාවේ අනුමතියක් නැතිව මේවා ලබා දෙනවා තනි තින්දු මත. මෙය වැරදියි. මෙහෙම කරන්න එපා කියන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි, මෙතුමා මෙය ප්‍රකාශ කරනකම් මා මෙය දැනගෙන හිටියේ නැහැ.මාගේ බලවත් කනගාටුව හා අප්‍රසාදය ප්‍රකාශ කර සිටිනවා. මා අවුරුදු 3ට ලක්ෂ25ක ප්‍රතිපාදන එකතු කර ඔය ක්‍රීඩාංගණය ඔය තත්ත්වයට ගෙන එනු ලැබුවේ.ලක්ෂ 5,10,10 ක් වියදම් කර මෙය සාදා දෙනු ලැබුවේ.පස්දමා, වැට ගසා ,තණකොළ ඇල්ලීම ආදිය සිදු කරනු ලැබුවේ මා.දැන් එම ස්ථානයේම තමයි මා යෝජනා කර ඇත්තේ ළමා උද්‍යානය ලක්ෂ 25ක.අපි මේ ප්‍රතිපාදන දෙනු ලැබුවේ එක එක්කෙනාගේ උවමනා වලට බස්රථ ගාල් කිරිමට නෙවේ. නමුත් බස්රථ ගාල්

කිරිමට ඒ සඳහා සුදුසු තැන් ලබා ගත යුතුයි. ඒ ප්‍රදේශයේ කුඩා දරුවන්ට අපි මෙය ඉදිකර තිබෙන්නේ. එම දරුවන්ට ඒ දේ අහිමි කරනවා නම් කොච්චර ලොකු අසාධාරණයක්ද සිදු කරනු ලබන්නේ.

තීරණය

හල්වතුර ළමා උද්‍යානයේ ඇතුල්වීමට ( Cover Slab) සකස් කිරිම සඳහා රු.90000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**(11)** වෙනත් කරුණු

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12.01 පින්නදුව තොටුපළ මාර්ගය පුළුල් කර ගැනීම සඳහා කේ රමණී මියගේ පැවරුම් නියෝග හැර අනෙකුත් නිවැසියන්ගේ පැවරුම් නියෝග සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>

දකුණු පළාත් පෙත්සම් කාරක සභාවේ පින්නදුව තොටුපළ මාර්ගය පුළුල් කර ගැනීම සඳහා කේ.රමණී මියගේ පැවරුම් නියෝගය හැර අනෙකුත් පැවරුම් නියෝග අවශ්‍ය කටයුතු සඳහා යොමු කර තිබෙනවා. ඒ අනුව එච්.එච්..ජයන්තා ,එම්.ඩබ්. නන්දනි ,එස්.එම්.රෝහිණි ප්‍රියන්ත,එම්. ඥාණරත්න,එම් මහින්දපාල, ඩබ්.ජී. නිලූකා සංජීවනී, එම්. ප්‍රේමසිලි මහත්මියගේ පැවරුම් නියෝග ඉදිරිපත් කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

මොකක්ද දැන් අපි අනිත් එක්කෙනාට කරන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>

අත්පත්කර ගැනිමේ ක්‍රියාවලියයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ,මේ යෝජනාව සම්බන්ධයෙන් එක පුද්ගලයෙකු හැර අදාල පුද්ගලයා කැමැත්ත ලබා දි තිබෙනවා. දැන් ඒ අදාල එක් පුද්ගලයෙකු නැතිව බැරිද අපට ඉදිරි ක්‍රියා මාර්ග වලට යාමට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>

නැහැ. මා මෙය දැම්මෙත් එකයි. සභාවේ අනුමතිය ලබා දෙනවා නම් ඒ ඉදිරිපස කොටස නැතිව අනෙක් කොටස කිරිමට එය කළ හැකියි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>

එහෙම කරන්නේ කොහොමද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ඒ කොටස අතහැර දමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගරු නගර සභාමන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාගේ කොටසක් සිදු කළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

එහෙම කරනවාට මා විරුද්ධයි . මට අතින් ගෙවන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ දෙපැත්තේ වැසියෝ ආරම්භක ඉඩමේ වැසියෝ දෙනවානම් පමණයි ලබා දෙන්නේ.ඒ දෙන්නැති කෙනාගේ කැමැත්ත ගත හැකිද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය මොකද කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ චම්පා සුමුදු මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔය හත්දෙනාගේ එකඟතාවය තිබෙනවා. නමුත් රමණී මහත්මිය ඒ ඉඩම් කොටස ලබා දෙන්නේ නැතිනම් ඒ අයත් එකට කැමති වෙන්නේ නැහැ. අන්න එහෙම ප්‍රශ්නයක් එතැන තිබෙනවා.ඒ කියන්නේ මාර්ගයේ මුලම සිටින්නේ ඇයයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මෙය අත්පත් කර ගැනිමේ ක්‍රියාවලිය සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ චම්පා සුමුදු මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පින්නදූව තොටුපොළ මාර්ගය රමණී මහත්මියගේ අකමැති තාවයක් තිබුණද ඒ ඉඩම් කොටසත් සමඟම මේ අත්පත් කර ගැනිම සිදු කොට මෙම මාර්ගය පුළුල් කිරිමේ කටයුතු සිදු කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මැතිතුමා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මෙන්න මේ දෙය වෙනවා.සාමාන්‍යයෙන් අත්පත් කර ගැනිමේ ක්‍රියාවලියේදි නාගරික සංවර්ධන අධිකාරියෙන් තිබෙන නිවෙස් ප්‍රමාණය අනුව මාර්ගයක ප්‍රමාණයක් තිබෙනවා.සාමාන්‍යයෙන් අඩි 10 පළලට නම් කෙරෙන්නේ නැහැ.බොහෝ විට 16 පළල තමයි වෙන්නේ.එතකොට නිවෙස් වල ඉදිකර ඇති ඉස්සරහා කැලිත් කැඩෙන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ලිඛිතව ලිපියකින් දන්වන්න.අදාළ කරුණ පැහැදිලි කර ඒ අයට දන්වන්න . එතකොට ඉවරයි.ඔය කාරණාව කිවූ විට සමහර විට දෙන්න ඉඩ තියෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

එත් පළවෙනි එක්කෙනා දෙන්නේ නැතිනම් ප්‍රශ්නයක්නේ.ඔය කියන දේ අපි ප්‍රකාශ කර තිබෙන්නේ.රැස්වීම් වාර කිහිපයක්ම පවත්වා තිබෙන්නේ.මේගැන පැහැදිලි කර තිබෙන්නේ.

**තීරණය**

අම්බලන්ගොඩ පින්නදූව තොටුපළ පාර පුළුල් කිරිම සඳහා කැමැත්ත ප්‍රකාශ කර ඇති නිවැසියන්ගෙන් මාර්ගය පවරා ගැනිම කටයුතු සිදු කොට අකමැති පුද්ගලයන් සිටිනම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.02 2019 අප්‍රේල් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ අප්‍රියල් මස වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

2019 අප්‍රේල් මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව . ආයතනය පවත්වන ලද දින ගණන18 , පැමිණි රෝගින් සංඛ්‍යාව 134කි . රෝගින් පැමිණි දෛනික සාමාන්‍ය ගණන 7 කි. මාසය සඳහා වැයවූ ඖෂට සඳහා ගිය වියදමරු.13115.33 එක් රෝගියකු සඳහා ගිය මුදල රු.97.87 ක් වශයෙන් වාර්තාව ඉදිරිපත් කර ඇත.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2019 අප්‍රේල් මස සඳහා වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි

**12.03 අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශිය ක්‍රිඩා උළෙල 2019.06.02 දින ට කොඩිකණු 30 ක් පුටු 40 ක් නොමිලේ ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ප්‍රාදේශිය ලේකම්තුමිය විසින් ලිපියක් එවා තිබෙනවා.අම්බලන්ගොඩ අන්තර යෞවන සමාජ ප්‍රාදේශිය ක්‍රීඩා උළෙල 2019.06.02 දින අම්බලන්ගොඩ ප්‍රජාපති ගෝතමි බාලිකා විද්‍යාලයේ පැවැත්වෙන බැවින් කොඩි කණු 30ක් හා පුටු 40ක් නොමිලේ ඉල්ලා ඇත.එය සභා අනුමතියට යටත්ව ලබා දි තිබෙනවා.එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශිය ක්‍රීඩා උළෙල 2019.06.02 දින අම්බලන්ගොඩ ප්‍රජාපති ගෝතමි බාලිකා විද්‍යාලයේ පැවැත්වෙන බැවින් කොඩි කණු 30 ක් හා පුටු 40ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.04 ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විදේශගත වීම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් විදේශගත විම සඳහා ඉල්ලීමක් කර ඇත. විදේශගත විම සඳහා අවසර ලබා ගැනිම.2019.08.20 - 2019.09.06 දින දක්වා දඹදිව වන්දනාවේ යාම සඳහා විදේශ ගතවීමට සුදානම් වී සිටි. ඒ සඳහා ඔබතුමාගේ සහ ගරු සභාවේ පූර්ණ අවසරය ලබා දෙනමෙන් ඉල්ලා ඇත.ඒ සඳහා අනුමතිය ලබා දෙනවා

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් 2019.08.20 සිට 2019.09.06 දින දක්වා දඹදිව වන්දනාවේ යාම සඳහා විදේශගත වීම සඳහා අවසර ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.05 පොදු ස්ථාන වල වැසිකිළි සංකිර්ණ පද්ධති ඉදිකිරිම සඳහා වන අයවැය යෝජනාව සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මිළඟට මාර්ගස්ථ මාගි ප්‍රවාහන අධිකාරිය. පොදු ස්ථාන වල වැසිකිළි සැකසිම . 2019 අයවැය යෝජනා වලට අදාලව නිවාස ඉදිකිරිම් හා සංස්කෘතික ඉදිකිරිම් අමාත්‍යාංශය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර පළමු අදියර ලෙස පොදු ස්ථාන හා දුම්රිය ස්ථාන ආශ්‍රිතව වැසිකිළි සංකිර්ණ ඉදිකිරිමට සැලසුම් කර ඇත.මේ අනුව නිවාස හා ඉදිකිරිම් සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් 2019.05.28 දින ප්‍රධාන ලේකම්වරුන්ගේ හා පළාත් පාලන කොමසාරිස්වරුන් අතර බස්නැවතුම්පොළ අසළ සම්බන්ධිකරණ ආයතන ලෙස මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ සහ ශ්‍රී .ලංගමය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ බව මින් දන්වා සිටි.මේ ව්‍යාපෘතිය මහජනතාවට සුවිශේෂි ව්‍යාපෘතියක් වන බැවින් දකුණු පළාත සංචාරක කලාපයක් වන බැවින් මෙම අවස්ථාව දකුණු පළාතට වැඩි අවස්ථාවක් ලබා ගැනිමට උත්සාහ කරමින් පවති. දැනට වැසිකිළි පද්ධති නැති හා අබලන් වැසිකිළි පද්ධති නම්කරන ලෙස දන්වන ලෙස ඔබතුමාට දන්වා සිටි. මේ සඳහා වැසිකිළි පද්ධති සඳහා උපරිම ලක්ෂ 100යක මුදලක් වෙන්කර ඇති බව දන්වා සිටි. ව්‍යාපෘති ඉතා කෙටි කාලයක් තුල ආරම්භ කර මේ වසර තුල ආරම්භ කර ඉතා කඩිනමින් අවසන් කිරිමට සැලසුම් කර ඇති අතර මේ අවශ්‍යතාවය සංචාරක පුරවරයක් ලෙස දකුණු පළාතට සුවිශේෂි අවස්ථාවක් වන බැවින්ද මේ සඳහා දායකත්වය ලබා ගැනිමට අප ආයතනය කඩිනමින් සම්බන්ධිකරණය කටයුතු සිදු කරන බව ඔබතුමාට වැඩිදුරටත් දන්වා සිටි.ඒ අනුව බස්නැවතුම්පොළේ ඉඩ කඩිනමින් වෙන්කර ගැනිම සඳහා ඉඩකඩ ලබාදෙන ලෙස වැඩිදුරටත් දන්වා සිටි. ඒ අනුව මේ අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ,අපගේ අම්බලන්ගොඩ නගර සභා සිමාවේ තිබෙන මෙම වැසිකිළිය මා නගර සභාවේ ගරු මන්ත්‍රීවරියක් ලෙස සිටින කාලයේදි තමයි ඉදිකරනු ලැබුවේ. මෙය ඉදිකළ දිනයේ සිට ජනතාවට සැහෙන පිඩනයකින් පෙලුනා.මේ ස්ථානයලබා දෙනවිට මහජනතාවට අපහසුතාවයකට හා පිඩනයකට ලක්නොවන විදියට ලබා දෙන ලෙස ඉල්ලා සිටි. මා ඔබතුමාට තවත් යෝජනාවක් ඉදිරිපත් කර සිටිනවා. මානාන ක්‍රීඩාපිටියත් වැසිකිළි පද්ධතියක් ලබා දෙන ලෙස යෝජනා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මැතිතුමා කතා කරමින්</u>**

මානාන ක්‍රිඩාංගණයේ ක්‍රිඩා කර නැද්ද? එම ක්‍රිඩාංගණයේ තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්</u>**

එහි තිබුණට එය වසා දමා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මැතිතුමිය කතා කරමින්</u>**

එහි ජලය සහ විදුලි බලය පවා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මැතිතුමිය කතා කරමින්</u>**

ඒ මෙය වෙන්කළාමනේ. වෙන අය ක්‍රිඩා කරන විට වසා දමා තිබෙන්නේ.මෙය නිතරම මරණාධාර සමිතියෙන් වසා දමා තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

ඔබතුමිය එහි ගිහින් නැහැ. ගියානම් හොඳට සෙල්ලම් කරන අය දන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඉතා හොඳ යෝජනාවක් මේ වැසිකිළි පද්ධති ඉදිකරන එක . මට තිබෙන ගැටළුව තමයි මෙය පිරිසිදු කරන එක හා ආරක්ෂක සේවය පිළිබඳව.එහෙම නැතිව තිබුණොත් මිට වඩා ප්‍රශ්න ඇතිවෙනවා.මේ සඳහා පිරිසිදු කිරිම හා ආරක්ෂක සේවය පිළිබඳව සැලිකිලිමත් වි නිසියාකාරව මේ කටයුත්ත සිදු කළ යුතුයි. එහෙම නැති වුණොත් මිට වඩා ප්‍රශ්න ඇතිවෙයි. මේ පිළිබඳව සැලකිලිමත් වි කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් .ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

මේ ගරු මන්ත්‍රිතුමිය ගෙන එනු ලැබු යෝජනාව ඉතා හොඳ යෝජනාවකි. ඒ වැසිකිළි තිබුණා අපගේ පෙර පාසලේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්</u>**

වැසිකිළි තිබුණා පෙර පාසලේ . ප්‍රජා ශාලාවේත් තිබෙනවා. එක නිසා තමයි මා ප්‍රකාශ කළේ ගිහින් නැහැ කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ් .ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

එහි අක්‍රමිකතා සිදුවු නිසා තමයි එය වසා තබන්න කිව්වේ. ඒ නිසා තමයි තීරණය කරනු ලැබුවේ එය වසා තැබිමට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ තිබෙන පොදු වැසිකිළිය දැනට පවත්වාගෙන යාමට හොඳ තත්ත්වයේ නැහැ. මෙය කිහිප වතාවක්ම ප්‍රශ්න වලට භාජනය වුණා. මේ බස්නැවතුම්පොළ තිබෙන්නේ ජල මට්ටමේ. නැවත මෙහි අඩි 4ක් පමණ උසට වැසිකිළි වල නැවතත් ඉදිකරනු ලැබුවා.අලුතින් තැනක් දෙන්න නැහැ. මෙතැන තමයි ඔබතුමාට ලබා දිමට තිබෙන්නේ.මෙය දෙනවානම් අඩි 08ක ප්‍රමාණයකට පඩි දමා උස්සා ගොඩනැගිල්ලක් ස්වභාවයට මෙය ඉදිකළ යුතුයි. යටට මෙය සෙල්ෆිට් ටැංකියක් දමා ඉදිකළ යුතුයි. කොළඹ මහ නගර සභාවෙන් පාලනය වන නාන කාමරයකට ගියත් එය ඉතා හොඳ මට්ටමේ තිබෙනවා.තනිකර නිවින නාන කාමර උපකරණ සවිකර තිබෙන්නේ. ඒවා ටයිල් අල්ලා කිසිම අපිරිසිදු කමක් නැතිව ලැඟුම් හලක වගේ තිබෙනවා.මේවා පිරිසිදු කිරිමට ඒ පුද්ගලයන්ට භාර දි තිබෙනවා. ඒ අය රු10/= හෝ රු.20/=ක් අයකරනවා.බස්නැවතුම්පොළෙත් මෙය සිදු වෙනවා. රු.10/= දි යනවා. අපි නගර සභාවෙන් ජලය සපයනවා . මෙහි පිරිසිදු කිරිම් නැහැ. දැන් ගිහින් බැලුවත් සාමාන්‍යයෙන් කාන්තාවකට යන්න පුළුවන් තත්ත්වයේ නැහැ. පිරිමි පුද්ගලයෙක් නම් කොහොම හරි නාහය වහගෙන ගිහින් එනවා. මෙවගේ ව්‍යාපෘතියකට යනවා නම් එම භූමියේ

ස්භාවය අනුව එය නිර්මාණය කරන ලෙස මා ඉල්ලා සිටිනවා.නැතිනම් ඒ නිලධාරින් හා කොන්ත්‍රාත් කරුවන් සතුටු වන විදියට තමයි මෙවා සැලසුම් කරනු ලබන්නේ.ඒ ඉඩමේ ජල මට්ටම අනුව මේ කටයුත්ත සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

- පස්වරු 1.20ට පමණ ගරු සභාපතිතුමා සභා ගැබෙන් නික්ම ගිය අතර මුලාසනය සඳහා ගරු උප සභාපතිතුමා කටයුතු කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඩෙංගු වැඩසටහන යටතේ මේ බස්නැවතුම්පොළ අසළ නිවෙස් පරික්ෂාවට ගිය විට එම නිවැසියන් දොෂාරෝපණය කරනු ලැබුවා මේ වැසිකිළි පද්ධතිය පිළිබඳව. ඔවුන්ට නිවෙස් වල සිට කැම කන්නවත් බැහැ. දුර්ගන්ධය හමනවා.එය නිතරම උතුරා යනවා. එය නිතරම සුද්ද පවිත්‍ර කරන ලෙස ඉල්ලා සිටිනවා.දුම්රිය ස්ථානයෙන් ප්‍රකාශ කර සිටියා මේ කාණුව සුද්ද කරන්නේ නැහැ. මෙය නිතරම උතුරන නිසා. ඒ අසළ නිවෙස් වලින් අපට දෝෂාරෝපණය කළා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රී සරත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙය අපි සැදුවා. එහි තිබෙන භූමියේ ස්භාවය නිසායි මෙය මේ ආකාරයට සිදුවී ඇත්තේ.සෞඛ්‍ය අංශයෙන් මෙය ඇයි සිදු නොකරන්නේ. අපගේ ගලි බවුසරය තිබෙනවානේ.ගලි බවුසරයට මොකක්ද වෙලා තිබෙන්නේ.මෙහි කුරුසය කැඩී ඇත්නම් එය දැම්මට පැය දෙකක් පමණ ගත වන්නේ. අළුත්වැඩියා කටයුතු සිදු කරනවා කිව්වාම මාසයක් විතර යනවා.මෙහි සම්පේක වැදිමට යන්නේ මෙහි රියදුරාගේ හොඳකම වෙන්නැති.ඇස්සලයේත් වැදිගොස් ඕන සම්පේකේ වදින්න.ලේකම්තුමියණි මේ ගැන විශේෂයෙන් බලන්න. රියදුරු මහතා ගැන විශේෂයෙන්ම බලන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි, රියදුරුට වගකිමක් තිබෙනවා මේ වාහනය,JCB එක හෝ වටිනා වාහනයක් ඒ යන්ත්‍රයේ ආරක්ෂිතභාවය පිළිබඳව. රියදුරු කිසිම වගකිමක් නැතිව කලු ගලක් ඇති තැනකට මෙය දමා තිබෙනවා.නැත්නම් මෙහි සම්පේක වදින්න බැහැ.වාහනයක සම්පේක තිබෙන්නේ ආරක්ෂාකාරී විදියට උඩ.මේ ගැබ්එක දැන දැනම දැම්මා . මෙහි ඇක්සලයත් වද්දාගෙනම ගිහින් තිබෙන්නේ. මේ මුදල හරිනම් රියදුරු මහතාගෙන් අයකර ගන්න. නැතිනම් මේවා කවදාවත් පාලනය කරන්න බැරිවෙනවා. ඊළඟට JCBඑක දුවයි. වතුර බලන්නේ නැහැ ඔයිල් බලන්නේ නැහැ.මෙහි වැඩකිරිමට තිබෙන JCB එකත් කැඩී යයි.  එය කැඩී ගියාම අපට කියන පිළිතුරද වැඩ කරන්නේ නැහැ කියන එක.එතකොට කොහොමද මේ නගර සභාවෙන් මේ වැඩ කරගන්නේ.එහෙනම් ඒ වරද කරන රියදුරාට වහාම දඩුවමක් දෙන්න.රජයේ ඕනම ආයතනයක තිබෙනවා. හමුදාව පවා තිබෙනවා.රියදුරෙකු අතින් වාහනය හැපුනොත් ඔහුගේ වැටුපෙන් පරික්ෂණයක් කර අඩුකර ගත යුතුයි.රජයේ ඕනෑම දෙපාර්තමේන්තුව තිබෙනවා.මට හැගෙන්නේ ඔය වගකිව යුතු නිලධාරින් ඔය සේවකයන් ආරක්ෂා වන විදියට කටයුතු සිදු කරන බවයි. මේ මහජන මුදල් අපේවත් තමුන්නාසේලාගේවත් නෙමේ.මේ නගරයේ එකතු වන මුදල්.සෙල්ලම් කරන්න එපා. මා ඉල්ලා සිටිනවා මේ වාහනයේ රියදුරු මහතා පිළිබඳ පරික්ෂණයක් පවත්වන ලෙසත් ඒ පිළිබඳ වාර්තාවක් ලබන සභාවට ඉදිරිපත් කරන ලෙස.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

ලොකු ඇස්ලයක් වද්දාගෙන ගිහින් තමයි සම්පේක වදින්නේ.ඒක දන්නේ නැති රියදුරු මහතෙකු ඔය වාහනයට දමා තිබෙනවා කියන්නේ අපේ තිබෙන වටිනා දෙයක් නැති කර ගැනිමකි.කවුද අපේ විශ්‍රම ගිය සේවක මහතා. ඔහුට පසුව කවුද මේ වාහනය ධාවනය කරනු ලැබුවේ.සෝමරත්න මහතා විශ්‍රාම ගියාන් පසු එම වාහනය දිව්වේ කවුද ? දැන් ධාවනය කරන එක්කෙනාද ඒ . දැන් ධාවනය කරන කෙනා කවුද ?සෝමරත්න මහතා විශ්‍රාම යාමට කලින් නිවාඩු ගිය විට ධාවනය කරනු ලබන්නේ කවුද ? ඇයි සුරේන් මහතා යොදවන්නේ නැත්තේ.සුරේන් මහතා කම්ප්‍රේක්ටර් රථයට යොදවා තිබුණත් එය ධාවනය වන්නේ සවස 2.00 වන තුරු පමණ නේද?එතකොට 2.00න්පසු නේද ගලි රථය ධාවනය වන්නේ.ඇයි මේ කොන්ත්‍රාත් පදනම මත සිටින සේවකයෙකුට මෙය ධාවනය කරන්න දුන්නේ.ඇයි එයා එහෙම දැම්මේ. මා දැක්ක විදියට ඔහු තරුණ රියදුරු මහතෙක්.මා හිතන්නේ නැහැ කිසිම වගකිමක් ගන්නවා කියා.එම වාහනය සමඟ. වගකීම ඔබලා තමයි පැහැර හැර තිබෙන්නේ.විශේෂයෙන්ම

ඔගොල්ලන් පැහැර හැර තිබෙනවා. මෙයට නිසියාකාර රියදුරු මහතෙකු යොදවා නොතිබිම පිළිබඳව.එම නිසා තමයි මේ සිද්ධියට මුහුණ පෑමට සිදු වි ඇත්තේ. ලේකම්තුමියණනි, මේ ගැන සොයා බලා වාර්තාවක් ලබන සභාවට ඉදිරිපත් කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>

අනිත් එක ගරු සභාපතිතුමා , මේ සඳහා යන ඇස්තමේන්තු අලාභ හානි වු ප්‍රමාණය සම්පූර්ණ වාර්තාවට ඇතුළත් කරන්න.නැතිනම් මෙය පාලනය කරගන්න බැරිවෙනවා.

**තීරණය**

පොදු ස්ථානවල වැසිකිළි සංකිර්ණ පද්ධති ඉදිකිරිමඅවසර ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.06 පොසොන් සතිය නිමිතිකොට ගෙන දිවයින දිවයින පුරා වෙළඳසැල්වල සිගරට් විකිණිම නතර කිරිම හා මහජනතාව ගැවසෙන ස්ථානවල සිගරට් බිම නැවැත්විම පිළිබඳ විශේෂ ව්‍යාපාරය සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

පොසොන් සතිය නිමිතිකොට ගෙන දිවයින පුරා වෙළඳසැල්වල සිගරට් විකිණිම නතර කිරිම හා මහජනතාව ගැවසෙන ස්ථානවල සිගරට් බිම නැවැත්වීමේ නගරාශ්‍රිත විශේෂ ව්‍යාපෘතිය.පොසොන් සතිය නිමිති කොටගෙන දිවයිනේ බොහෝ ප්‍රදේශවල විවිධ මට්ටමේ පිංකම් සංවිධානය කරනු ලැබේ. මෙහිදි සුරා සැල් මංශ අලෙවිසැල් වසා තැබිමට සියලු දෙනා කටයුතු කරන අයුරු අපට දැකිය හැකිවේ. නමුත් දිනකට 60-65 අතර ප්‍රමාණයකට මරණය ගෙන දෙන සිගරට් වෙළඳාමෙන් වැළකි සිටිමට හෝ එම ක්‍රියාව වැළැක්වීමට ගන්නා උත්සාහය ප්‍රමාණවත් නොවන බව අපට පෙනි යයි.මේ සඳහා මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය මෙවර පොසොන් උත්සවය නිමිතිකොට ගෙන දිවයින පුරා මහජන පුස්තකාල හා එක්ව තම පුස්තකාලය පිහිටා ඇති ප්‍රදේශයේ සිගරට් විකුණන කඩ පොසොන් සතිය පුරාවට සිගරට් විකිණිම නතර කිරිමට යොමු කිරිම හා මහජනතාව ගැවසෙන ස්ථාන වල සිගරට් පානය නතර කිරිමට විශේෂ නගරාශ්‍රිත ව්‍යාපාර සංවිධානය කර තිබේ.මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ ක්‍රියාකාරි පුස්තකාලයක් වන ඔබ පුස්තකාලයට මේ සමඟ තොරතුරු පත්‍රිකාවක් එවා ඇති අතර මේ පොසොන් සතියේවත් මිනිසුන් මරණ සිගරට් වෙළෙඳාමෙන් වැළකී සිටිමු යන තේමාව යටතේ පොස්ටර් නිර්මාණය කොට තම ප්‍රදේශයේ ප්‍රදර්ශනය කිරිමට සලස්වන්න මෙහිදි මෙම තේමාව පිටත පණිවුඩ ප්‍රදර්ශනය නොකරන මෙන් ඉල්ලා සිටිමු. ඒගොල්ලො මේ ඉල්ලා සිටින්නේ මෙම පුස්තකාලය කඩ හිමියන්ගේ ලැයිස්තුව වැඩසටහනේ ඡායාරූප 2009.06.03 වන දින සිට ඒ කියන්නෙ සිගරට් විකිණිම නතර කරන්න කියලා තියෙන්නෙ පොසොන් සතිය නිමිත්තෙන්. සුරාසල් එහෙම වහනවා සිගරට් විනිණිම නතර කරන්නෙ නෑ කියලා තමයි ඉල්ලීම කරන්නෙ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මැතිතුමිය කතා කරමින්</u>

ඕකටම සම්බන්ධ කරලා තව ඉල්ලීමක් කරනවා අපේ මන්ත්‍රීවරු අත්සන් කරලා. පොහොය දින ව්‍යාපාර ස්ථාන වසා දැමීම කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

සිගරට් බොන්න එපා කියලා අපිට ප්‍රදර්ශනය කරලා කල හැකියි. ඒ ලියුම අනුව කටයුතු කරන්න නිත්‍යානුකූල තත්ත්වයක් එක්ක එපැයි අපි යන්න. ඒක නිසා බැනර් ප්‍රදර්ශනයක් කරන්න ඒ තත්වය තුල. පස්සෙ ඉල්ලීමක්

කරනවනෙ මන්ත්‍රීවරු පොහොය තියෙන හැම දවසකම ව්‍යාපාර වහන්න කියලා. ඒක වෙළඳ සංගමයට යොමු කරලා ගන්න තීන්දුවක් වෙළඳ සංගමය තියෙනවනෙ .

__මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්__

ඒ අය ඒවා තිබෙනවා විස්තර පත්‍රිකාවක්. එහෙම විකුණන වෙළඳසැල් හිමියන්ගේ නම දමා එවන්න කියා.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්__

ඉල්ලීමක් කරන්න පුළුවනි . අනෙක් කරුණ ඔය නිවාඩු ලබා දෙන්න කියන එක.

__මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්__

බල කරන්න බැහැ.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්__

ඉල්ලීමක් කරගන්න පුළුවනි.මෙහෙන් ලියුමක් දාන්න ලේකම්තුමිය ඉල්ලීමක් කරලා. 100% ක්ම බෞද්ධයො ඉන්නෙ අම්බලන්ගොඩ නගරයෙනෙ. පොහොය දාට කඩ වහන්න කියලා ඉල්ලීමක් තියෙනවද මන්ත්‍රීනරු ඉල්ලීමක් කරලා.

__මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්__

සෝභිත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්න.

__ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මැතිතුමා කතා කරමින්__

මම යෝජනා කරනා පොහොය දින අම්බලන්ගොඩ ව්‍යාපාර ස්ථාන වසා දමන්න කියලා. අම්බලන්ගොඩ නගරය හොඳ බෞද්ධයින් ඉන්න නගරයක්. මුස්ලිම් ව්‍යාපාරිකයින් සෑම සිකුරාදාම ව්‍යාපාර වසා දමලා ආගමික ස්ථානවලට යනවා. පොහොය දවසෙ නිවාඩු දෙනවා නම් ඒගොල්ලන්ගෙ ආගමික කටයුතු කරන්න. මම ඉල්ලීමක් කරනවා හැම කඩයකටම දන්වන්න කියලා.

__ගරු නගර සභා මන්ත්‍රී එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මැතිතුමිය කතා කරමින්__

එම යෝජනාව මා ස්ථිර කරනවා

__මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්__

මෙයට ඇතුළත් වුණානම් හරි පෞද්ගලික පංතිත් පොහෝය දිනට නිවාඩු ලබා දෙන ලෙස.

__ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්__

ඔය ඉල්ලීමට එකඟ නොවන ආයතන තුනත් තියෙනවා කාගිල්ස්, සුපර් මාකට් තුන. අනික් සියලුම ආයතන වැසුවත් ඔය ආයතන තුන වහන්නෙ නෑ. ඒ හා සමානව වෙළඳාම් කරන අනික් වෙළෙන්දො අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න ඕන. එතකොට ඒ ආයතන විතරක් ඇරලා අපට බල කරන්න අයිතියක් නෑ. අපි සාධාරණ ඉල්ලීමක් කලත් ඒ ආයතන තැන, අවුරුද්දට, නැකතට, වෙසක් එකට, පොහොයට. අර නත්තලට විතරයි වහන්නෙ. ඒ ආයතන තුන වැස්සීම තමයි ඉස්සෙල්ලාම කරන්නෙ. එතකොට අනික් ඒවා වහගන්න පුළුවන්.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්

ඒ දවස්වල ඕක කලේ නෑ. අපි කලේ කුණු ට්‍රැක්ටරේ කුණු පුරවලා ටේලරේ ඉස්සරයින් තිබ්බා.

මූලාසනය -ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

මේ යෝජනාව අනුව ඉල්ලීමක් කරමු සියලුම ව්‍යාපාරිකයින්ගෙන් බෞද්ධ නගරයක් නිසා මේ දේ ක්‍රියාත්මක කරන්න කියලා. බල කිරීමක් කරන්න බෑ. ඒ වගේම අපේ එක නිලධාරියෙක් සෞඛ්‍ය අංශයෙන් හරි යොදවා ඉල්ලීමක් කර ගන්න පුළුවන් නම් ලොකු දෙයකි. ඒ අය අත්සන් පත්‍රයක්ද එවා තිබෙනවා.ඒ අයගෙන් අත්සන් ලබා ගැනිමට පුළුවන් නම් හොඳයා ඒ සතියට සිගරට් විකුණන්නේ නැහැ කියා.

ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මැතිතුමා කතා කරමින්

වෙළඳ සංගමයටත් දැනුම් දෙන්න.අම්බලන්ගොඩ ප්‍රධාන වෙළඳ සංගමයක් තිබෙනවානේ.

මූලාසනය -ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

වෙළඳ සංගමයටත් දැනුම් දෙන්න.

**තීරණය**

පොහොය දින අම්බලන්ගෙඩ පිහිටි සියළුම වෙළඳසැල් වසා තබන ලෙස ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මැතිතුමා විසින් කරන ලද යෝජනාව සඳහා වෙළඳ සංගමයෙන් ඉල්ලීමක් කිරිම සුදුසු බවට මූලාසනය දරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව සභාවේ සම්මත විය.

## 12.07 2019 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම ධම්මානන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

මූලාසනය -ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

15/6 ධම්මානන්ද මාවත ,විලේගොඩ , අම්බලන්ගොඩ. මේ ලිපිය එවා ඇත්තේ ගරු සභාපතිතුමාට.2019 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම .ධම්මානන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරිම. ඉහත කරුණු යටතේ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පලාත් පාලන අමාත්‍ය වජිර අබේවර්ධන මහතා විසින් අංක පී එල්/3/5 දරණ 2019.03.06 දින ලපියක් නගර සභාවට එවා ඇත. මීට පෙර මෙම පාර පුද්ගලිකව නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා විසින් ඒ මහතාගේ මුදලින් ඉටු කිරිමට කටයුතු කිරිමේදී මාගේ විරුද්ධත්වය නිසා පාරට අප ඉඩම නගර සභාවට පවරා දිමට නොකරන ලදී. මාගේ දරුවන්ටත් , පවුලේ අයටත් ආත්ම ගරුත්වයක් තිබෙන නිසා අපහාස , උපහාස වලට ලක්වීමට මා අකමැති බැවින් එය ඒ අවස්ථාවේ ඉටු නොකරන ලදී. ගරු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමා මුදල් වෙන්කරන ලද ලිපිය ලැබුන පසු ඔබතුමා විසින් මා පමණක් මෙම පාරට මෙම ඉඩම පවරා දිම නොකර ඇති බව දැන්විම තුල ඊට පසුදිනකම එයට ඉඩම පවරාදිමේ ආකෘති පත්‍ර පුරවා නගර සභාවට ලබා දෙන ලදි.2019 අප්‍රෙල් මාසික රැස්විමේ මෙම පාර සංවර්ධනය කිරිමේ ඇස්තමේන්තු ඉදිරිපත් කිරිමෙන් පසු ලසන්ත මන්ත්‍රිතුමා එය තමාගේ පුද්ගලික වියදමින් ඉටු කරන බව පවසා ඇත. එය පාලන පක්ෂයේම මන්ත්‍රීවරයෙක් මා වෙත දැනුම් දුන් අතර එය සභාපතිතුමා ක්‍රියාත්මක කිරිමට එකඟතාවයක් ඇති බවද දැනගන්නට ලැබුනි. බදු ගෙවන්නෙකු වන මා විසින් මාගේ ඉඩම පවරා දුන්නේ පුද්ගලිකව මන්ත්‍රීවරයෙකුගේ වියදමින් පාර සාදා ගැනීමට නොව රජයෙන් ලබාදුන් මුදලින් සාදා ගැනිමට කැමති නිසා වන අතර පුද්ගලිකව මන්ත්‍රීවරයෙකුගෙන් පාර සංවර්ධනය කරන්නේ නම් මා එයට විරුද්ධව වන බවද මා විසින් නගර සභාවට ලබා දී ඇති ඉඩම පවරා දිමට නගර සභාවට ලබාදුන් ආකෘති පත්‍රය නැවත මා වෙත දෙන ලෙස මින් ඉල්ලා ඇත.මා පාරේ පදිංචි අනිකුත් අයද දෙවන වතාවටත් තම ඉඩම් නගර සභාවට පවරා දිමේ ආකෘති පත්‍ර පුරවා භාර දී ඇති බවද දැනුම් දෙමි. රජය මගින් ලබාදි ඇති මුදලින් පාර සංවර්ධනය කිරිමට මා කැමැත්ත පලකරන අතර පුද්ගලික

කෙනෙකුගේ මුදලින් පාර සංවර්ධනය කිරිමට මා විරුද්ධ වන බවද වැඩිදුරටත් මින් දැනුම් දි ඇත. මා කරන මෙම ඉල්ලිම කෙරේ නගර සභා මන්ත්‍රිවරුන්, මන්ත්‍රිවරුන්ගේද අවධානය යොමු කර නගර සභාවෙන් සාධාරණයක් ඉටු කරදෙන ලෙස ඉල්ලා ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමනි, කවුද එවා ඇත්තේ.

**<u>මූලාසනය -ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ඩබ්ලිව් දර්ශන් ද සිල්වා කියන මහත්මයෙක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මෙම ලියුම අරගෙන ආවේ ජ්‍යොෂ්ඨ මන්ත්‍රීවරයෙක් වන ජයන්ත මන්ත්‍රීතුමා ඇවිල්ලා කරුණු පැහැදිලි කරලා දුන්නෙ. අපේ වගකීමක් වෙනවා මේ සඳහා රජය මුදල් වෙන්කර තිබෙන්නේ.ඒ මුදල් සියළු දෙනා සමඟ සහායෝගය දි මේ කර්තව්‍ය ඉටු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත අජිත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

ඔය ලිපියේ ලියා තිබෙනවා මාගේ ආත්ම ගෞරවයත් හා දරුවන්ගේ ආත්ම ගෞරවයත් නැතිවෙනවා මා මෙය හැදුවොත් එහෙම කියා. මා අම්බලන්ගොඩ නගරයේ ව්‍යාපාරිකයෙකුගේ පුතෙකි. මා හොරවැඩ කරලා, මංකොල්ලා කා , ගංජා විකුණා, කසිප්පු විකුණා මුදල් උපයා නැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

යම් ප්‍රශ්නයකදි මහජන නියෝජිතයෙක් වුණාම බලන්න ඕන ක්‍රමයක් තිබෙනවා.එක් එක් පුද්ගලයා එක එක ආකාරයට ප්‍රකාශ කරනවා.දැන් අපිට ඕන තරම් බනින අවස්ථා තිබෙනවා.එම නිසා අපි මුලිකත්වය දිය යුත්තේ මේ මාර්ගයේ සිටින ජනතාවගේ ප්‍රශ්නයටයි.ඔයාට හදන්න පුළුවන් කියන එක ගැන කිසි ගැටළුවක් නැහැ. ඒ ගැන තර්ක කරන්න යන්නේ නැහැ.යම් පුද්ගලයෝ එක එක විදියට දේශපාලනය කරනවා.පක්ෂ පාට භේදයක් නැතිව කරන කාර්ය භාර්ය කවුරු කළත් මෙය ගැටුමකට නොගිහින් විසඳා ගත යුතුයි. මාර්ගයක් හදන්න බැහැ එක්කෙනෙක් හරි විරුද්ධනම්.මෙයින් ප්‍රශ්නය ඇතිවෙන්නේ අනෙකුත් ප්‍රදේශයේ සිටින ජනතාවට. මේ ප්‍රතිපාදන ලැබි තිබෙනවා නම් එම ප්‍රතිපාදන ලබාගෙන මේ කාර්ය ඉටු කරන්න. අපි කියන්නේ එකයි. ඔබතුමාටත් ඒ පිළිබඳව අවධානය යොමුකරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත අජිත් කුමාර මැතිතුමා කතා කරමින්</u>**

මේ විලේගොඩ ගරු මන්ත්‍රිවරයෙක් අවුරුදු 22 ක් වෙනවා මේ ප්‍රශ්නයට. තවම ප්‍රශ්නය විසඳි නැහැ. තවම ප්‍රශ්නය විසඳි නැහැ.එතුමටත් මතක් වි ඇත්තේ මා මන්ත්‍රි වුවාට පසුවයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමාටත් යම් යම් ප්‍රශ්න ගැටළු තිබෙනවා. ඔබතුමා දන්නේ නැහැ. මේ නගර සභාව ක්‍රියා කරන අකාරය අපි දන්නවා. අපි පක්ෂ පාටක් බලන්නේ නැහැ. ජේෂ්ඨ ගරු මන්ත්‍රිවරයෙක් ඉල්ලු විට අපි එයට ගරු කරනවා. අපි කතා කරන්නෙත් ඒ නිසායි.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>**

සිද්ධිය මා කියන්නම්.මෙය දිගින් දිගටම යන්න එපා

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා  කතා කරමින්**

දැන් මෙතුමා කරන්න ගියොත් එහෙම අර ඉන්න පුද්ගලයා විරුද්ධ වෙනවා. මෙය ලෙඩක්.මේ මුදල් ප්‍රතිපාදන ලැබුනු පසු මෙය හදන්න. කවුරුවත් තරහා කර ගන්න යන්න එපා.

**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**

ගරු රාහුල මන්ත්‍රීතුමා මෙතැන ප්‍රශ්න ඇති කර ගන්න එපා. දිගින් දිගටම ගරු සභාපතිතුමා ඒ මන්ත්‍රීවරයාට උපදෙස් දුන්නා මෙන්න මේ දෙය කරගෙන එන්න කියා. නමුත් එතුමා ඒ දෙය කරගෙන ආවේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

මොකක්ද කරගෙන එන්න කිව්වේ.

**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**

ගරු සභාපතිතුමා ප්‍රකාශ කළා ඔබතුමා දන්නවා මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ මෙවැනි සිද්ධියක් ඇතිවෙලා අදටත් උසාවි ගිහින් දැන් නඩුව නගර සභාව පරාද වන මට්ටමට පැමිණ තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

ප්‍රශ්න කියන්නකෝ.

**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**

අපගේ හිටපු නාගරික මන්ත්‍රීවරයෙක්  මේ විදියට අත්සන් කර  අයදුම්පත්‍ර භාරදී තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

එතුමා මා සමඟ ප්‍රකාශ කර සිටියා . සියළුම අයදුම්පත්‍ර එතුමා අත්සන් කර දුන් බව. එතුමා සාමදාන විනිශ්චවරයෙකි. ගරු සමාදාන විනිශ්චය කෙනෙක් වුණාට පසු අනෙක් කර්තව්‍ය කියන්න දෙයක් නැහැ.මා කියන්නේ වැඩිදුර යන්න නෙමේ.

**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**

නැහැ ඔබතුමා හොඳටම දන්නවා පැවරුම් නියෝග වල ගරු මන්ත්‍රීවරු දෙදෙනෙකු අත්සන් කළ යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

මේ අහන්න කියන දෙය

**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**

ඔබතුමා පොඩ්ඩක් පිළිගන්න

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්**

මා කියන්නේ මේ ගැන සාධරණව බලා සාධාරණය ඉටු කරන ලෙසයි.මේ මාර්ගයට සියළු දෙනා අත්සන් කර  දී නැද්ද?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>**

ඔබතුමා එකනේ කතා කරන්න දෙන්නේ නැහැ. ඔබතුමා දන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ඔබතුමා මේ ප්‍රශ්නයට පැමිණිය යුතුයි. මේ මාර්ගයේ මූලික කටයුතු සිදු වී තිබෙනවාද?ප්‍රතිපාදන වෙන්කර ගන්න ඇත්තේ ඒවා කරගෙන නේ.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මූලික කටයුත්ත තමයි අප ලබා දුන් පැවරුම් නියෝග ලබා දිම.ජයන්ත මහතා පැවරුම් නියෝග ගෙන පැමිණියා. එකක් හැර ගෙන ආවා.එ පැමිණි මෙහොතේ ගරු සභාපතිතුමා උපදෙස් දුන්නා . මෙන්න මේ පැවරුම් නියෝග සඳහා මන්ත්‍රීවරු දෙදෙනෙක් අත්සන් කළ යුතු බව. අදාල කොට්ඨාශයේ මන්ත්‍රීවරයා අත්සන් කළ යුතු වෙනවා.මේ වෙනකම් එහෙම ඇවිත් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

දැන් මෙතුමා තරහා නම් මෙතුමා කොහොමත්ම අත්සන් කරන්නේ නැහැ.එතකොට මෙය නොකරන තත්වයට නේ යන්නේ. මෙය කෙරෙන තත්වයට යන එකයි අපි ප්‍රකාශ කරන්නේ.කොට්ඨාශ මන්ත්‍රී කියන එක නෙමේ අපි කියන්නේ.එහෙම නම් අපි මෙයට ඡන්දයක් විමසන්න දමනවා. එහෙම කරන්න ආවොත් එහෙම.ඔබතුමා සහායෝගය දක්වන්න. මේ මාර්ගයක් හදන කාර්යට. එහෙනම් කලින් කළානම් ඉවරයි.සල්ලිවලට දෙනවානම්.මේ එවපු මුදල් යන එක අසාධාරණයක්. එකයි අපි කියන්නේ.මේහි ඕකන්දෙත් දමා තිබෙනවා. මා දැක්කේ දැන් එය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්</u>**

ගරු .උප සභාපතිතුමනි,අභ්‍යාන්තර හා ස්වදේශ කටයුතු පළාත් පාලන අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමා එවන ලද මුදල් අවිච්ඡේදනය වෙන්න නොදිම අපේ යුතුකම. ඒවා අප සභාවට පැමිණි මුදල්.පුද්ගලික වියදමින් මේ ප්‍රශ්නය වෙනුවෙන් කැපකරන්නේ නැතිව ඒ ලැබුණු මුදල් වලින් සංවර්ධන කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.ඒ සඳහා විරෝධතාවය ප්‍රකාශ කරනවා. මොනවත් ප්‍රශ්න නැහැ.අපි එතුමා සමඟ සතුටුවෙනවා . එතුමා දමනු ලැබූ යෝජනාවට. අපි දැඩි විරෝධතාවය ප්‍රකාශ කර සිටිනවා ගරු වජිර අමාත්‍යතුමාගෙන් ලැබුණු ප්‍රතිපාදන වලින් අනිවාර්යෙන්ම ඒ දෙය කළ යුතු බවයි. පැවරුම් ලිපි සියළු දෙනාම ලබා දී තිබෙනවානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

නැහැ. අත්සන් කරන්නේ නැතිව ලැබි නැහැ. එහෙනම් සභාවට ඉදිරිපත් වි නැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා කතා කරමින්</u>**

අපි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් විදියට දැඩි විරෝධය පළ කර සිටිනවා . ඒ ගරු වජීර අබේවර්ධන මැතිතුමාගේ ප්‍රතිපාදන. ඒ සභාවට ලැබුණු මුදල්. ඒ ය එම කාර්යේම යොදවන්න. පෞද්ගලික වියදමින් කරනවාට අපි විරුද්ධයි.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>**

දැන් සාමන්‍යයෙන් මාර්ගයක් සඳහා මුදල් වියදම් කරනවා නම් එම මාර්ගය රජයට පවරා තිබිය යුතුයි. දැන් සැම මාර්ගයක්ම පවරා තමයි තිබෙන්නේ.මෙහෙම මුදල් එවූ විට පැවරුම් නියෝග රැගෙන එන ලෙස දැන්නූ විට එක්කෙනෙකු හැර අනික් අයගේ පැවරුම් නියෝග ලබා දි තිබුණා. ලබා දි තිබුණත් ගරු මන්ත්‍රීවරයාට ප්‍රකාශ කළා මේ ටික අත්සන් කරගෙන එන ලෙස.එක් මන්ත්‍රීවරයෙක් පමණක් අත්සන් කර තිබෙනවා. මන්ත්‍රීවරු 2ක් අත්සන් කර මේ සභාවට ලබා දෙන්න තිබෙනවා. ඔය වගේ ගරු මන්ත්‍රීවරයෙක් අත්සන් කර මහ අම්බලන්ගොඩ

ප්‍රදේශයේ මෙවැනි සිද්ධියක් වී උසාවියේ නඩුවක් පවතිනවා. මෙහෙම මුදල් වියදම් කරන්න බැහැ කියා. මෙහෙම තත්ත්වයක් ඇති වුණොත් කියා පැහැදිලි කර ජයන්ත මහතාට ප්‍රකාශ කර සිටියා. මෙය හරියට කරගන්න එම ප්‍රදේශයේ මන්ත්‍රීවරයාත් තවත් මන්ත්‍රීවරයෙකුත් අත්සන් කළ යුතු බව මෙක තවම සම්පූර්න වී නැහැ. එක් මන්ත්‍රීවරයෙක් පමණයි අත්සන් කර තිබෙන්නේ.මෙහෙම කැගසා මෙය කරන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

මට ඔබතුමාගෙන් නොදන්නා දෙයක් දැන ගන්න ඕන.ප්‍රතිපාදනයක් ඒව්වාම වියදම් කරන්න බැරිද ?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>**

ප්‍රතිපාදන කියන්නේ රජයේ මුදල්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මැතිතුමා කතා කරමින්</u>

මේ ගැටළුව රජයේ කොයි පාර්ශවයෙන් හෝ වේවා පළාත් සභාවේ හෝ මධ්‍යම රජයේ හෝ වේවා මේවා රජයේ මුදල්. රජයේ මුදල් වලින් ව්‍යාපෘති කරනවා නම් එම ව්‍යාපෘති ඉදිරිපත් කර පුද්ගලයා හෝ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නිලධාරියා දැනගත යුතුයි මේ ව්‍යාපෘතිය සඳහා නම්කරන භූමිය හෝ මාර්ගය කිසිදු නිත්‍යානුකූල ගැටළුවක් නොමැති බව. ඊට අමතරව එසේ ගැටළුවක් තිබේනම් එම ගැටළුවේ තිබෙන කරුණු භාවිතා කිරිමට හැකිවන පරිදි විසඳා රජයේ මුදල් වියදම් කිරිමට හැකිවන පරිදි එම ගැටළුව නිරාකරණය කර එම මුදල් ප්‍රතිපාදන ලබා ගත යුත්තේ . අපි සංවර්ධන කමිටු වලදි මුදල් ප්‍රතිපාදන අනුමත කරන්නේ නැහැ කුමන හෝ හෝ ගැටළුවක් තිබෙන කිසිදු යෝජනාවකට.එහෙම අයිතියක් අපට නැහැ.අපට එම ප්‍රතිපාදන ලබාදිමට ගරු ජනාධිපතිතුමා ලබා දි තිබෙන මුදල් ආඥා පණත් වල සඳහන් වි තිබෙනවා.මෙතැන තිබෙන්නේ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා එතුමාගේ පුද්ගලික මුදල් වලින් මෙය හදන්න උත්සාහ කර තිබෙනවා. ඒ අවස්ථාවේදි එක පුද්ගලයෙක් විරුද්ධ වෙලා තිබෙනවා.දැන් විරුද්ධ වෙච්ච පුද්ගලයා මුදල් ප්‍රතිපාදන ලබාගෙන තිබෙන්නේ.දැන් මෙතැන මේ දෙගොල්ලන්ටම මේ මාර්ගය සැදිමට අවශ්‍යතාවයක් තිබේ. නමුත් ඒ හදනවාට බී කැමති නැහැ බී හදනවාට ඒ කැමති නැහැ. දේශපාලනික වශයෙන් මා සඳහන් කරනවා ඔය විලේගොඩ මාර්ගයක් සැදිමට ඩෙංගු වැඩිවුණු නිසා කනගාටුවෙන් වුණත් සඳහන් කර යුතුයි.මාගේ මතකයේ හැටියට ලක්ෂ 23ක් ද කොහේ වෙන්කළා හරස් මාර්ගයට කාණු සමඟ ගැඹුරු කාණු. ඔය මාර්ගය සාදන්න ආවාම කොන්ත්‍රාත්කරුට එය හදන්න දුන්නේ නැහැ.අම්බලන්ගොඩට ඩෙංගු ප්‍රවණතාවයක් තිබූ ස්ථානයකි . මේ මාර්ගය වසා හදන්න දෙන්නේ නැති වූ විට මා පොලිස් ස්ථානාධිපතිතුමාට ප්‍රකාශ කර සිටියා මේ රජයේ ප්‍රතිපාදනවලින් මේ මාර්ගය හදන්න දෙන්නේ නැතිව බාධා පමුණුවනවා නම් පවතින නීතිය යටතේ දින 14 කට සිර භාරයේ දමන්න.ඉතිරි ටික මා බලා ගන්නම් කියා .මා එතුමාට ප්‍රකාශ කළා වගකිව යුතු නිලධාරියෙක් එවන්න. කොන්ත්‍රාත් කරුට ප්‍රකාශ කළා ඔබතුමා මේ මාර්ගය හදන්න.ඔය විලේගොඩ ඇති වූ ගැටළුව .ඕවට වගකිව යුත්තේ දේශපාලන ඒ ද බී ද කියා වැඩක් නැහැ.ඔවැනි තත්ත්ව තමයි නිර්මාණය වුණේ. ඔවා ඉතා වැරදියි.කවුරු කොහොම කළත් . පාරක් හදන එක කාටත් පොදුයි. එයට දේශපාලනභයක් නැහැ.නිල් එක්කෙනා විතරකුත් නෙමේ, රතු එක්කෙනා විතරකුත් නෙමේ, කොළ එක්කෙනා විතරුකුත් නෙමේ.ඔය සියළුදෙනා ගමන් කරනවා ඔය මාර්ගයේ.ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාගෙන් මා ඉල්ලා සිටින්නේ ඔබතුමා ඔය සියළු කරුණු මෙයට එකතු කරගෙන ඔය පාර හොඳට හදන්න.කාණුත් දමා පාර හදා ගන්න.වෙන විකල්පයක් නැහැ. මේ ප්‍රශ්නය නිරාකරණය කිරිමට. ආණ්ඩුවේ මුදල් තිබෙන්නේ ලක්ෂ 15 ද , කමිටු දමා දෙගොල්ලන් සමඟ කාණුත් දමා මාර්ගය හදන්න. ඔය ප්‍රදේශය සැහෙන ඩෙංගු ඇතිවුන ප්‍රදේශයක්. ඔබතුමා කාණු දමා මෙය කරන්න.විලේගොඩ පාර හදද්දි ප්‍රශ්න මටත් පැමිණියා. ඔබතුමා පස්සට යන්න එපා.මේ දෙගොල්ලන්ම එකතු කරගෙන මෙය කරන්න. මේ මුදල් ලබා ගෙන. මේ මුදල් තව ටික දිනයි තිබෙන්නේ . මේවා අවිච්ඡේදනය වෙනවා තව ටික දිනකින්.ඒ මුදල් ටිකක් ලබා ගෙන ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාගේ පුද්ගලික ධන පරිත්‍යාගයක්. අපි එය අභයන්න ඕන.අද සමාජයේ සිදුවන හොරකම් සමඟ. එතුමා ව්‍යාපාර වලින් හම්බකරන මුදල් වලින් තමයි මෙය කරන්නේ. මා මේ ලැබෙන වැටුප ශතයක්වත් ගන්නේ නැහැ. එය අඩු ආදායම්ලාභි දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දෙනවා.සත 5ක් ගන්නේ නැහැ. අපි දේශපාලනයට ආවේ නැහැ මුදල් හම්බ කිරිමට.මා අභය කරනවා එතුමාගේ පුද්ගලික මුදල් වලින් එම මාර්ගය හැදිමට තිරණය කිරිම ගැන. ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා මේ මුදල් ටිකත් ලබාගෙන ඔබතුමාගේ මුදලුත් දමා ඔබතුමාගේ

කොට්ඨාශයේ ඔය මාර්ගය ඉතා හොඳින් හදා ගන්නා ලෙස.ප්‍රශ්න පැමිණියාම අපි සාකච්ඡා කර විසඳා ගත යුතුයි.දැන් එතුමා හදන්න හැදුවාම බාධා පමුණුවන පුද්ගලයා ගැන මාගේ අසතුට ප්‍රකාශ කරනවා.කුමන පක්ෂයේ හෝ වේවා එතුමාගේ කොට්ඨාශයේ මේ එතුමාගේ මුදල් වලින් ගමේ පාර හැදීමට බාධා පමුණු වීම ගැන මාගේ කානගාටුව ප්‍රකාශ කරනවා.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>

විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි. අපි මේ පාර ජයන්ත මහතා සිටි කාලයේ හදන්න හැදුවා. නගර සභාවට පවරා ගෙන. මේ කියන පුද්ගලයා පැවරුම් ලිපි දුන්නේ නැහැ.ඊට පසු ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා මෙය පුද්ගලිකව හදන්න හැදුවාම මේ පුද්ගලයා දුන්නේ නැහැ.මෙහි ගැටළු සහගත තත්වයක් තිබෙන්නේ.අදාල විෂයභාර නිළධාරිණියට ප්‍රකාශ කර සිටියේ මෙහි මේ විදියේ ගැටළුවක් තිබෙනවා. එම නිසා අදාළ ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරයා ලවා මේවා අත්සන් කර ගන්න කියා. මේ අත්සන් නැතුව, නගර සභාවට පවරන්නේ නැතිව මෙය හැදීමට බැහැ.තේරුම් ගන්න. අපේ විපක්ෂ නායකතුමා ප්‍රකාශ කළ ආකාරයට දෙපැත්තට බෙදිගොස් හදන්න බැහැ.නමුත් ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා මේ මාර්ගය තිබෙන ප්‍රමාණයට හරි හදනවා කිව්වා.මොකක්ද නිත්‍යානුකුල තත්වය. නිත්‍යානුකුල තත්වය එනකම් රජයේ මුදල් වියදම් කරන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා ඉතා ළඟින් ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා ඇසුරු කරනවා. මෙය මැතිවරණයට එනවිට තිබු ප්‍රශ්නයකි. එතුමා ගමේ ජනතාවට මැතිවරණයට පෙර පොරොන්දු වී තිබුණා . මේ මාර්ගය හදන බවට. දැන් ඒ පොරොන්දුව මත මුදල් සොයාගෙන මෙය හදන්න. දැන් එතුමා මෙය සෑදීමට ගත් විට තමයි මේ රජයෙන් මුදල් සොයාගෙන ඇවිත් තිබෙන්නේ.දැන් අර ලිපිය එවා තිබු පුද්ගලයාට සිදුවෙනවා වගේ අවනම්බුවක් මෙතුමාටත් සිද්ධ වෙනවා. ව්‍යාපාරිකයෙක් හැටියට. මේ ගැනත් සලකා බැලුවානම් හොඳයි අපේ සාහෝදර මන්ත්‍රීවරුන්.එහෙම හැදෙන්නේ නැති තත්වයක තිබෙනවිට තමයි මෙතුමා එය පුද්ගලික වියදමින් සිදු කිරිමට කටයුතු කළේ. මාත් එම රැස්වීමට සහභාගි වුණා.පොරොන්දුවක් දුන්නා මෙතුමාගේ පුද්ගලික වියදමින් මෙය සාදා දෙනවා කියා. මා හිතනවා මෙතුමාටත් අවස්ථාවක් ලබා දුන්නොත් හොඳයි කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ .ඉන්ද්‍රා අයිරාංගනී මැතිතුමිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඉතාමත් ස්තුතිවන්ත වෙනවා ඔබතුමා සත්භාවයෙන් කරන්න හැදු වැඩය පිළිබඳව . ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් තමන්ගේ ගමේ මේ වැඩය ධන පරිත්‍යාගයෙන් කිරිමට කැමති වීම පිළිබඳව.මා ඉල්ලීමක් කර සිටිනවා. මෙය ගමේ දේශපාලන මතිමතාන්තර මත කරන්න දෙන්නේ නැහැ. දැන් මට වුණොත් එකයි. මේක තමයි අපේ රටේ තිබෙන ස්වභාවය.මේක තමයි අපේ කරුමේ. මේක තමයි අපේ රට දියුණුවට පත්නොවන එකම හේතුව. මා ප්‍රකාශ කර සිටිනවා ගරු මන්ත්‍රීතුමනි, මේ ලක්ෂ 6 වෙන්කර තිබෙන්නේ ගරු වජිර අබේවර්ධන මැතිතුමා විසින්.ඔබතුමා මේ ලක්ෂ 6ක් ලබා ගන්න. ඔබතුමා ගමේ අයත් සමඟ එකතු වෙලා මා මෙන්න මේ වැඩේ ගමේ සිදු කරනවා. මේ සඳහා තව ලක්ෂ 6ක් ගරු වජිර අබේවර්ධන මැතිතුමාගෙන් ලැබී තිබෙන බව පවසා සහායෝගයෙන් කටයුතු කරන්න.ඒ ලක්ෂ 6ත් ලබා ගත් පසු හොඳින් වැඩ කොටස කරගත හැකියි.මේ මහතාත් එකතු කර ගන්න. නැතිනම් පෙනවානේ නිල සෙවණට සිදුවු දෙය.එතකොට ඒවා හැදෙන්නේ නැහැ. රාජකාරියට බාධාවක් වෙනවා.එක එක්කෙනා විරුද්ධ වෙනවා. ඔබතුමා බුද්ධිමත් ගරු මන්ත්‍රීවරයෙක්.ගමේ අයට විස්තරය කියා ඒ අයගේ සහායෝගයක් ගෙන ඔබතුමාගේ මේ කාර්ය කර ගැනිමට ඉතාමත් ලස්සන විදියට ශක්තිමත් පාරක් හදන්න හැකිවේවායි කියා මා අශිර්වාද කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී පී සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>

ගරු උප සභාපතිතුමනි, මා හිතන්නේ මේ මාර්ගයේ නිවෙසියෙක් තමයි මේ ඉල්ලීම කර තිබෙන්නේ.එතුමා ඉදිරිපත් කර කරන කරුණු අනුව එතුමාගේ පුද්ගලික මතය තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. එතුමා හෝ එතුමාගේ පවුලේ උදවිය පුද්ගලිකව අපහසුතාවයට පත්වෙන විදිය තමයි සඳහන් කර තිබෙන්නේ. හැබැයි මෙය පොදු කටයුත්තක්. මෙය පොදු මාර්ගයක් සෑදිමේදි එක එක්කෙනාගේ පුද්ගලික මත හා පුද්ගලික වන අපහසුතා පිළිබඳව

ඇහුම්කන් දීමට තිබෙන හැකියාව අඩුයි. මොකද නගර සභාවක් විදියට ගරු මන්ත්‍රීවරුන් විදියට පත් වී තිබෙන්නේ පොදු මහජනතාවට සේවය කිරීමට.අපි පත්වී තිබෙන්නේ . එම නිසා අපට ඇහුම්කන් දෙන්න වෙන්නේ පොදු මහජනයාගේ මතයට.තනි පුද්ගලයෙකුගේ මතයට නෙමේ. අවසානාවකට මේ පාරේ හිමිකරුවෙක් ඕහු. මේ පාරවල් වලට අපි කියන්නේ පුද්ගලික පොදු පාරවල්.එතකොට නගර සභා නොනව පාරවල් පුද්ගලික පොදු පාරවල්.එම පුද්ගලික පොදු පාර අයිති ඒ දෙපැත්තේ සිටින නිවැසියන්ට. ඒ අයගේ ඉඩම් වලින් කොටසක් තමයි මේ මාර්ගයට කවදා හරි දී තිබෙන්නේ. එම නිසා ඔවුන්ට පැහැදිලි අයිතියක් තිබෙනවා. අපි නගර සභාවෙන් ඒ පාර නැත්නම් එතුමාගේ හෝ එතුමියගේ නිවසට මේ සැලැස්ම අනුමත කර දෙන්නේ නැහැ.එක තමයි එතුමාගේ පොදු ප්‍රවේශ මාර්ගය.එම නිසා ඉතාමත් ශුද්ධ වූ අයිතියක් මේ පාර දෙපැත්තේ නිවැසියන්ට තිබෙනවා මේ පාර සම්බන්දව කටයුතු කිරීමේදී.එහිදි විරුද්ධ වීම හෝ එකගවීම මේ සියළු දෙනාටම තිබෙනවා.එම පාර සංවර්ධනය කිරීමේදි අම්බලන්ගොඩ නගර සභාව විදියට මේ මාර්ගයේ නිවැසියන්ගේ අවසරය ලබා ගත යුතුව තිබෙනවා.වසර ගණනාවක් තිස්සේ මේ ප්‍රශ්නය දිග හැරෙනවා .මා දන්නා ඉතිහාසය තුල වසර 16ක කාලයක සිට මේ පාර සංවර්ධනය කරන්න හැදුවා.ඔය කියන ජේෂ්ඨ මන්ත්‍රීවරයා තමයි මෙය කරන්න නොදුන්නේ. ඇත්ත කතාව . මා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කළා. විටින් විට මේ මාර්ගය සැදීමට ගත්තාම ඔය කියන මන්ත්‍රීවරයාම තමයි මේයට බාධා කළේ. අද එතුමා ඉදිරිපත් වෙනවා මෙය කරන්න කියා. එය හොඳයි.ජනතාව වෙනුවෙන් එහෙම දෙයක් කිරීමට ඉදිරිපත් වීම ගැන අපි සංතෝෂ වෙනවා.අවසානයේ හරි මේහි බරපතල කම තේරුම් ගෙන ජනතාව සමඟ ඉදිරිපත් වෙලා මේ මාර්ගය සංවර්ධනය කිරීමට ඉදිරිපත් වීම ගැන අපි සංතෝෂ වෙනවා.නමුත් අගේ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මන්ත්‍රීතුමා එතුමාගේ පුද්ගලික වියදමින් තමයි මේ මාර්ගය සැදීමට ඉදිරිපත් වී තිබෙන්නේ.අපි යම් යම් අවස්ථාවලදි අපට පුළුවන් ආකාරයට ජනතාවට ඒ සේවය කරන්න ඉදිරිපත් වෙනවා.ඒවා බොහොම හොඳ දේ. විපක්ෂ නායකතුමා කිවූ පරිදි අපි හම්බකරන දෙයක් අපට ලැබෙන දෙයක් ජනතාවට දෙන්න පුළුවන් නම් එකතමයි උතුම්.මේ කාරණාව සාක්ෂාත් කර ගැනිම සඳහා අපි එතුමාට උදවු කිරීමට තිබෙනවා.මාත් එතැන ඉන්නවා.ඒ කාරණාව මත අපි ගරු ලසන්ත මන්ත්‍රීතුමාට උදවු කරන්න යනවිට මේ කාරණාව නවතිනවා.එතකොට අර ජනතාව පිඩා විදිනවා.මේ පාර හැදෙන්නේ නැහැ.අපට අවශ්‍ය වන්නේ ගරු සභාපතිතුමා හරි එහෙම නැත්නම් ගරු සභාපතිතුමා හරි මෙයට නිවැරදි විසඳුමක් දීමයි.මා විශ්වාස කරන්නේ නැහැ රජයේ ප්‍රතිපාදන තව මාස දෙක තුනකට වඩා තිබෙයි කියා.එහෙනම් රජයේ ප්‍රතිපාදන යන්න කලින් මේ යෝජනාව ක්‍රියත්මක විමට තිබෙනවා.එහෙම නම් රජයේ ප්‍රතිපාදන වලින් මේ මාර්ගය හදන්න කියන එක තමයි අපට පෙන්න තිබේන්නේ.එතකොට වජිර අබේවර්ධන ඇමතිතුමා මේ ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා නම් නගර සභාවට මේ මුදල් ලැබි තිබෙනවාද ?ලැබි තිබෙනවා නම් ඒ පිළිබඳව සහතිකයක් තිබෙනවා නම් ඒ රජයේ පිළිගත් මුදල්

__මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.__

මෙම මුදල් ලැබි නැහැ.ගරු මන්ත්‍රීතුමාට මා දැනගන්න කියන්නේ. ගරු සභාවෙන් සභාපතිතුමා ලිපියක් යවා තිබෙනවා මේ පාර තවම නගර සභාවට පැවරි නැති බවට.

__ගරු නගර සභා මන්ත්‍රී පී සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්__

දැන් මේ නිවෙසියන් කියා සිටිනවා නේ ඒ අය කැමැත්ත දෙන්න කැමතියි කියා. මා කියන්නේ එකඟතාවයකට පැමිණෙනවා නම් මා මේ යෝජනාව කරන්නේ. ගරු ලසන්ත මන්ත්‍රීතුමාට එකඟතාවයට පැමිණිමට පුළුවන් ද කියන එක.මෙතැනදි ගරු වජිර අබේවර්ධන ඇමතිතුමාගේ ප්‍රතිපාදන ලැබෙන බවට අපට සහතිකයක් තිබෙනවා නම් අපට ඒ යෝජනාවට කැමත්ත දෙන්න පුළුවන් කම තිබෙනවා. අපි දිය යුතුවත් තිබෙනවා.පුද්ගලික මුදල් වලට විරෝධතාවයක් තිබෙනවා නම් මේ පාර කෙරෙන්නේ නැහැනේ.එතකොට අපිට ඡන්දය දිපු ජනතාව පිඩා විදනවා.එකට අපට අවශ්‍යතාවය තිබෙනවා.සාධාරණ යුක්ති සහගත නැහැ මෙය නොදි ඉන්න එක.එහෙමනම් මා ඉල්ලා සිටිනවා මේ යෝජනාවත් සමඟ අපේ ගරු මන්ත්‍රීවරයාත් විශාල සේවයක් කරන්නේ මේ වේලාවේ . එය අපට නිකම්ම බැහැර කරන්න බැහැ.එම නිසා මා යෝජනා කරනවා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන වලින් කාණු දෙපැත්තත් ,රජයේ ප්‍රතිපාදන වලින් පාරත් සදා මේ දෙකම එකට කරන්න කියා.ගරු මන්ත්‍රීතුමා කැමති නම්. මා දන්නේ නැහැ මට කරන්න පුළුවන් යෝජනාවක් කරන්න විතරයි. මෙය ක්‍රියාත්මක විය යුතු විදියක්.එතකොට ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා ජනතාවට පොරෝන්දු වූ ආකාරයට තමන්ගේ පුද්ගලික වියදමින් ඒ කාණු

දෙපැත්ත සකස් කරනවා.එතකොට ඒ නිවෙසියන්ට කියන්න බැහැනේ කාණු හදපු නිසා අපකිර්තියට පත් වෙනවා කියා.එතුමාගේ ප්‍රතිපාදන වලින් කාණු දෙපැත්ත හදනවා. ස්භාවයෙන්ම පහත් බිමක් මෙය.රේල්පාරේ සිට කාණු පද්ධතිය ගෙන එමට වෙනවා මහා පාරට .එතකොට මේ ව්‍යාපෘතියට ඔයිට වඩා මුදලක් වියදම් කරන්න වෙයි කාණු පද්ධතිය සඳහා .එතකොට මේ ව්‍යාපෘති දෙකටම එක හා සමාන වියදමක් දරන්න වෙනවා.මෙතුමාට එම මුදල වියදම් කරන්න වෙනවා. අවසානයේදි අපි නගර සභාව දක්ෂ වෙනවා ජනතාවට උපරිම සේවයක් ලබා දෙන්න ගරු මන්ත්‍රිතුමාගේ නිහඩ සේවයත් රජයේ ප්‍රතිපාදනත් දෙකම ගෙන මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න. ඉතිං මා දන්නනේ නැහැ. එයට ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත මහතා කොච්චර දුරට එකඟ වෙයිද කියා.අපිට පුළුවනි ගරු මන්ත්‍රිවරු විදියට නිවැරදි දේ නිවැරදිව දකින්න විතරයි.මේ සභාවට යෝජනා කරන්න විතරයි.මට කිසිම අවස්ථාවක වැරදි දෙයක් යෝජනා කරන්න බැහැ.එකට අනුමතිය දෙන්නත් බැහැ.මා දන්නේ නැහැ අනෙක් මන්ත්‍රිවරුන්ගේ අනුමතිය සම්බන්ධයෙන්. එතකොට මේ ව්‍යාපෘතිය නිති විරෝධිව කිරිමට අනුමතිය ලබා දෙන්න බැහැ.එකම නිත්‍යානුකුල ක්‍රමය වන්නේ සියළු දෙනාම එකතු වන ගරු මන්ත්‍රිතුමා කැමති නම් පමණක් එතුමාගේ ආශිර්වාදයත් සමඟම කාණු පද්ධතිය දෙකකට නෙමේ. මෙයට සමාගාමිව.එතකොට එතුමාගේ ගෞරුත්වයත් ආරක්ෂාකාරි වන විදියට එතුමාගේ ප්‍රතිපාදන වලින් කාණු හැදෙනවා. රජයේ ප්‍රතිපාදන වලින් පාර හැදෙනවා.සමහර විට මේ ප්‍රතිපාදන නාවොත් පාර හැදෙන්නේ නැහැ. හැබැයි මෙතුමාගේ කාණු පද්ධතිය හැදෙනවා.එතකෙට එතුමා ඉදිරියෙන් සිටිනවා.එතුමායි දිනන්නේ . එහෙම බැලුවත්.මා දන්නේ නැහැ කොච්චර දුරට මේවා සාර්ථක වේද කියා. අපි ප්‍රර්ථනා කරන්නේ . මෙයට රජයෙන් ප්‍රතිපාදන ලැබෙයි.මෙතුමාත් අපි අවතක්සේරු කරන්නේ නැහැ. මෙතුමාත් මේ ප්‍රතිපාදනවලට දායකත්වය දෙයි.මා අවශ්‍යනම් මේ යෝජනාව නැවතඉදිරිපත් කරන්න . එහෙම නැතිනම් වෙනත් මන්ත්‍රිවරයෙක් ඉදිරිපත් කරන්න.මේ කාණු පද්ධතිය අපේ නිලධාරින් දම්මවා ඇස්තමේන්තු කර ඒ ඇස්තමේන්තුවටත් පාර සංවර්ධනය කිරිම ගරු වජිර අබේවර්ධන ඇමතිතුමාගේ යෝජනවාක් විදියට සම්මත කර මෙය නිවැරදි කර මේ සංවර්ධන කටයුත්ත සිදු කරන බවට යෝජනාකර මේ කටයුත්ත සිදු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**මුලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**

කෙටියෙන් කියන්න. සභාව තව ගෙනියන්න තියෙනවා.මෙහි නිත්‍යානුකුල තත්ත්වයක් ඇත්තේම නැහැ. මා ඔබතුමාට මා ලිපි ගොණුව පෙන්නුවා.

**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මැතිතුමිය කතා කරමින්**

එහෙනම් මොකටද මෙය ඉදිරිපත් කර තිබෙන්නේ.

**මුලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**

මේ ලිපිය සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු මන්ත්‍රිතුමලා මෙය බලන්න. නිකං කාලය කන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මැතිතුමා කතා කරමින්**

යුතුයි. එතුමා විලේගොඩ ප්‍රදේශයට ඉතා විශාල සේවයක් එතුමා කරනවා. විලේගොඩ ප්‍රදේශයට මැතිවරණ සමයේ එතුමා විසින් ගෙන ආ යෝජනාවකි.මේ සඳහා මේ මාර්ගය හදන්න එතුමාගේ පුද්ගලික වියදමින් මුලින්ම මේ සභාවේ ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත මහතා තමයි මේ යෝජනාව ගෙනවිත් කතා කළේ.මෙතුමාට එය ඉටුකිරිමට නොහැකි වුවහොත් මෙතුමාට අසාධාරණයක් වෙනවා.මෙතුමානේ මේ මාර්ගය හදන්න මුලින් යෝජනා කළේ. එහෙමනම් ඇයි එයා විරුද්ධ වුණේ. එයා විරුද්ධවෙලා දැන් මෙතුමාගේ කැමැත්ත ගන්න හදනවා මුදල් අනුමත කරගෙන.එය අසාධාරණයි. මෙතුමා තමයි මේ කර්තව්‍යයට මුලින් අත තබනු ලැබුවේ.එහෙනම් මෙතුමාටත් යම්කිසි සාධාරණත්වයක් තිබෙනවා ඒ පුද්ගලයාගේ ඒ කටයුත්තට විරුද්ධවිමට.එතුමාගේ කැමැත්ත අනුව මෙය සමව කර ගන්නවා නම් හොඳයි. නමුත් නගර සභාවට අයිතියක් තිබෙනවා මේ පාර පවරා ගත් පසු මේ කටයුත්ත සිදු කරන්න කියා ඉදිරිපත් වෙන්න .මේ කටයුත්තට ඒ පුද්ගලයා අකමැතිනම් ගරු නගර සභා මන්ත්‍රි ලසන්ත මහතාගේ වැඩපිළිවලට අකමැති නම් නගර සභාවට බලයක් තිබෙනවා නේද මහජනතාවගේ ඉල්ලිම අනුව මේ මාර්ගය නගර සභාවට පවරාගෙන මේ කටයුත්ත සිදු කරන්න.ඒ ප්‍රදේශයේ සිටින හිමිකම් කියන

පාරිභෝගික  ජනතාව තමයි ඒ අපහසුතාවයට පත්වෙන්නේ.නගර සභාවට අයිතියක් තිබෙනවා නේද ඒ පුද්ගලයාගේ එම විරෝධතාවය මැඩලා ඒ අවස්ථාවේ මා හිතන්නේ යම් ක්‍රියාමාර්ගයක් ගත හොත් හොඳයි කියා. අර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි දෙගොල්ලන්ගේම කැමැත්ත පරිදි. නැත්නම් අපි යෝජනා කරනවා මේ අවස්ථාවේදි ගරු ලසන්ත මන්ත්‍රීතුමාගේ ගෙනා ආ  යෝජනාව ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන්න. මොකද එතුමාත් විරුද්ධ වුවොත් මේ පාර හැදෙන්නේ නැහැ. එතුමා මේ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාට විරුද්ධ වුණානම් එතුමාටත් අයිතියක් තිබෙනවා මෙයට විරුද්ධ වීමට.මෙතුමාගේ වැඩපිළිවලට එතුමා විරුද්ධ වුණානම් මෙතුමාට එතැන ආවාසියක් වෙනවා..

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>

නැහැ . ගරු මන්ත්‍රීතුමනි අවාසියක් නෙමේ නිත්‍යානුකූලභාවයක් නැති වෙනවා අපට කරන්න මා එදෙත් කියන්නම් . හොඳම උදාහරණය තමයි දැන් පසුගිය දා  සති කිහිපයකට කලින් පෝරඹ පුද්ගලයෙක් පැමිණියා පාරක් පවරන්න..මා එතුමාට  පැවරුම් නියෝග ලබා දුන්නා . ගිහිල්ලා  ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා මුණ ගැහෙන්න. ඒ පැවරුම් නියෝග එතුමා අත්සන් කර අදාල පුද්ගලයන්ගෙන් මේ ඉඩම පවරා දිම සම්බන්ධව ලිපියකුත් සමඟ ඉදිරිපත් කරන්න. ඒ අදාල ලිපිය මේ සභාවේ තිබෙනවා. නිත්‍යානුකූල විදියට හරියට ගෙනවිත්.දැන් මෙච්චර වෙලා ඔබතුමලා පැය ගණක් කැගහනවා. මේ පැවරුම් නියෝග වල ගරු නගර සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු අත්සන් කළ යුතුයි. පලවෙනියට අත්සන් කර තිබෙනවා පුවන්වඩු ජයන්ත මහතා. එතකොට මොහු මන්ත්‍රීවරයෙකුත් නෙමේ දැන්.මෙහි නිත්‍යානුකූල තත්ත්වය මොකක්ද කියා කියන්න ඔබතුමාලා දැන්.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

මේ ලියුම දැම්මේ ඇයි  සභාවට

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>

ඒකතමයි. මේ ෆයිල් එකට දැන් ලිපියක් ඇවිත් තිබෙනවා මේ සභාවට. එක නිසා තමයි එහෙම වුනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

මීට පසු මේවා යොමුකරන විට නිත්‍යානුකූල තත්ත්වය බලා  නිර්දේශ කර දමන්න සභාවට.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>

ගරු මන්ත්‍රීවරු මේ ෆයිල් එක බලන්න. ගරු සභාපතිතුමා මා ඉදිරියේදිමයි උපදෙස් දුන්නේ මෙය නිත්‍යානුකූල කර අරගෙන එන්න කියා. එහෙම යොමු කරන්නේ නැතිව සභාවට ලිපියක් එවා තිබෙනවා. මේ අද පැමිණි ලිපියක් . මෙය ගරු සභාපතිතුමා සභාවට යොමුකරන්න කියා සඳහන් කර ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

අපි සියළුදෙනාම ගරු මන්ත්‍රීවරු උදේ පාන්දරට මේ අරවා මෙවා එවන්න එපා. අදත් උදේ එවනවා . කියවන්න විදියකුත් නැහැ. මොකුත් නැහැ. අපි මේවා දන්නේ නැහැනේ

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>

එම නිසා මා නිත්‍යානුකූල වෙන්නේ නැහැ. මෙය ගරු සභාපතිතුමා සභාවට යොමු කරන්න කියා සඳහන් කර ඇත. මේ තත්ත්වය උදාවෙනකම් මෙය නිත්‍යානුකූල වෙන්නේ නැහැ. අපි යෝජනා කරනවා ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාට මේය නිත්‍යානුකූල තත්ත්වයට ගෙනඑමට කටයුතු කරන්න. පුළුවන් කෙනෙක් සිටි නම්.රජයේ මුදල් වියදම් කරන විට නිත්‍යානුකූල තත්ත්වය තිබිය යුතුයි. විපක්ෂනායකතුමා සඳහන් කළ පරිදි. රජයේ මුදල් වියදම් කරන්න මෙය නිත්‍යානුකූල තත්ත්වය ඇතිවිය යුතුයි. මා මේ ලිපිය සභාවෙන් ඉවත් කරනවා.

**තීරණය**

ඩබ්ලිව් දර්ශන් ද සිල්වා මහතා විසින් 2019 වර්ෂයේ ධම්මානන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරිම සම්බන්ධව විරෝධය පල කර එවන ලද ලිපිය ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.08 අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය විසින් පවත්වනු ලබන විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, අම්බලන්ගොඩ. විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන්. විශේෂ ඩෙංගු වැඩසටහනක් පවතිනවා අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේත. අම්බලන්ගොඩ නගරයේ වැඩිම ඩෙංගු රෝගින් ප්‍රමාණයක් වාර්තා පහත සඳහන් කොට්ඨාශ වල. වාර්තාවෙන් දැක්වෙන පරිදි පහත සඳහන් ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වනු ඇත.2019.06.07 දින මහ අම්බලන්ගොඩ හා පනියන්දූව කොට්ඨාශයේ.අම්බලන්ගොඩ නගර සභාව මගින් පෙරවරු 8.00 ට වැඩසටහන ආරම්භ කරනවා.යොදවන කණ්ඩායම් ගණන 20කි. ඩී. එන් . අයි . අබේවර්ධන මහතා. එතුමා තමයි මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා.2019.06.08 දින තල්ගස්ගොඩ තිලකපුර. තිලකපුර අපට අයිති නැහැ.තල්ගස්ගොඩ ප්‍රජා ශාලාව පෙරවරු 8.00ට. සහභාගි වන ගණන 20කි. ඩී.ආර් . සී . සෝමරත්න මහතා. සිවළුදෙනාම එ අදාල ප්‍රදේශයේ මන්ත්‍රිවරු සහභාගි වුණානම් හොඳයි.විශේෂයෙන් අපි රෝහලට ගියත් කතා වෙන්නේ අම්බලන්ගොඩ ඩෙංගු සිටින බව.සියළු දෙනාම සහභාගි වන්න. විශේෂයෙන් මහ අම්බලන්ගොඩ, පනියන්දූව, තල්ගස්ගොඩ ,තිලකපුර.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , විශේෂයෙන් කතා කළ යුතුයි මෙය ඩෙංගු මර්ධන වැඩසටහනක් නිසා.මේ ඩෙංගු උවදුර සඳහා අපේ නගරයේ ජනතාව පෙර නොවූ විරූ අන්දමින් මෙය වැඩි වි තිබෙනවා.ඉතිහාසයේ වැඩිම ඩෙංගු රෝගින් ප්‍රමාණයක් වාර්තාවෙන්නේ මේ කාලය තුළයි. මෙයට ගරු සභාවක් විදියට කනගාටු වෙනවා සේම අපේනුත් මේ සඳහා වූ දායකත්වය පිළිබඳ ප්‍රශ්න කරගත යුතු වෙනවා. පසුගිය කාල වකවානුව තුල විවිධ යෝජනා ඉදිරිපත් කළා මේවා වළක්වා ගැනිමට. එයට අපිට නොහැකියාවක් තිබුණා. මේ සම්පත් තිබියදි මේ ජනතාව මේ දුක් විදින්නේ.රෝග වලට ගොදුරු වෙන්නේ. අපේ පණතේ කියා සිඩිනවා ජනතාව රෝග වලින් බේරා ගැනිමට සුඛිත මුදිත කිරිම කියා . අපිට එය නොහැකි වෙලා තිබෙනවා. අපි ඒ ගැන කනගාටු වෙන්න ඕන සභාවක් විදියට. මා මේ නැගි සිටියේ සම්පූර් ණ සභාවක් විදිවයට.පාලක පක්ෂයේ විතරක් නෙමේ. ගරු සියළුම මන්ත්‍රිවරුන්ට මේ අඩු වැඩි නැතිව මේ ප්‍රශ්නය තිබෙනවා.තමුන්නාසේලා අපි කාටත් මහජන නියෝජිතයන් විදියට වගකිමක් තිබෙනවා.මේ සම්බන්ධව අප්‍රමාණ වෙහෙසක් දරන්නේ බලපිටිය රෝහල.ඔවුන් දැඩි වෙහෙසක් දරනවා මේ රෝගින්ට ප්‍රතිකාර කිරිමටත්, ඒ අවශ්‍ය පහසුකම් ලබා දිමට. ඇඳන් ලබා දිම, දිවා රාත්‍රී මේ සේවය සිදුවෙනවා.විශේෂයෙන් වෛද්‍යවරුන් , හෙද හෙදියන්, අනෙකුත් සේවකයින් දැඩි වෙහෙසක් ගන්නවා මේ සම්බන්ධව. විශේෂයෙන්ම අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාව තමයි විශාල වශයෙන් රෝගීන් විදියට මෙහි ප්‍රතිලාභ ලබා ගන්නේ. ඒ සම්බන්ධයෙන් අප නගර සභාවෙන් විය යුතු දෙයක් තිබේනම් ඒ සම්බන්ධව කටයුතු කරන ලෙසත් ඒ පිළිබඳව බලපිටිය රෝහලට නගර සභවෙන් විශේෂ ස්තුතියක් පුද කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.</u>

පසුගිය සතියක නගර සභාව මැදිහත්වෙලා ඩෙංගු වැඩසටහන් දෙක්ක කළා. මේ සඳහා හමුදා නිලධාරින්, පොලිසිය , ග්‍රාම නිලධාරින් ගෙන්වා අම්බලන්ගොඩ ප්‍රදේශය තුල විශාල වැඩ සටහනක් කළා.සභාව මේ වගකිම පැහැර හැරියේ නැහැ. අනිවාර්යෙන්ම එය ඉෂ්ඨ කළා.අවසනාවකට මෙන් මෙය දිගින් දිගටම යනවා. දැන් වෙලා තිබෙන්නේ නගරයෙන් පිටත් ගිහිල්ලා. මේ තත්ත්වය මර්ධනය කළ යුතුයි.කලින් මෙහෙම තත්වයක් උදා වුයේ නැහැ. මොනවාහරි ක්‍රමයකින් මේ තත්ත්වය උදා වුණා. පසුගිය සභා වකවනුවල අප සිටින විට මෙවැනි

තත්ත්වයක් ඇති වුයේ නැහැ.මෙයට මුලික කරුණ වුයේ අප පාලනයෙන් ඈත්වෙලා හිටියා වසර තුනක් පමණ.මේ නගර සභාව පාලනයක් නැතිව තිබ්බා.එක තමයි මේ ඇති වුනේ. නැතිනම් වසරින් වසර මෙය පවත්වා ගෙන ගියා.කොහොම වුණත් සභාවක් වශයෙන් අප මෙයට මුහුණ දිය යුතුයි.ඉදිරියේදී අම්බලන්ගොඩ නගරයෙන් ඩෙංගු මර්දනය කිරිමට කටයුතු කළ යුතුයි. අපේ ගරු සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළා වගේ බලපිටිය රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිතුමාට ස්තුතිය පුදකර.ලිපියක් යවන්න සභාව තින්දු කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

අනෙක් කරුන අපි ඉල්ලා සිටිනවා එය නිවෙස්වලටත් පොඩි උපදෙස් පත්‍රිකාවක් යවන්න මේ සම්බන්ධව. ගොඩක් වෙලාවට මහජනතාවගේ වරදිනුත් වෙනවා.ශිතකරණ වල වතුර වැක්කෙරේන එවා. පොඩි සොප් පියනකින් වුණත් ජලය අස්කර හැකි බව ඒ සඳහා පැමිණෙන නිලධාරින් පවසනවා. ඒ ගොල්ලෝ වැඩ සටහන් කර කියනවා.දැනුවත් කිරිමේ වැඩසටහනක් අත්පත්‍රකාවක් මගින් හරි ලිපි මගින් හරි සිදු කරන්න.

<u>**මුලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**</u>

මේ දින වනකොටත් නඩු දමා තිබෙනවා. හැමතැනම ගිහින් නඩු දානවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

ඔබතුමා ප්‍රකාශ කළා හමුදාවෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කළ කියා.අපේ පැතිවලටනම් එහෙම පැමිණියේ නැහැ.

<u>**මුලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**</u>

මෙය නගරයේ කළා.

විලේගොඩ ප්‍රදේහයේත් කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>

දැන් බලන්න නෙස්ටර් ලඟ කාණුව. දැන් ගිහින් බලන්න ජලය පිරි ඩෙංගු මදුරුවන් බෝවන හැටි. අපේ කොට්ඨාශයේ කාණු ඇත්තේම නැහැ. පතුල් විතරයි තිබෙන්නේ. ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන ගමන් මහජනතාව දැනුවත් කරන්න. මොකද එයාටම හැදෙන්න ඕන මේහි ආමාරුකම දැනේන්න. අපි ඉල්ලා සිටිනවා මේ සම්බන්ධ අත් පත්‍රිකා හරි ලිපියක් හරි බෙදන කෙනෙක් හරි මගින් ජනතාව දැනුවත් කරන ලෙස යෝජනා කරනවා

**තීරණය.**

අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මහින් විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම පිළිබඳ යොමුකරන ලද ලිපිය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කර අතර ඒ සඳහා බලපිටිය මුලික රෝහලට ස්තුතිය පුද කර ලිපියක් යොමු කිරිම සුදුසු බවට මුලාසනය දැරු ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදි..

**12.09 ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි කාර්යාලය , ක්‍රීඩා සංවර්ධන මධ්‍යස්ථානය - ජාතික මහා ක්‍රීඩා උළෙල 11 වන අදියර ගාල්ල දිස්ත්‍රික් ක්‍රිකට් තරහ2019.06.08 පොල්වත්ත නගර සභා ක්‍රිඩාංගණයේ සහ මානාන ක්‍රිඩාංගණ දෙක නොමිලේ ලබා දෙනලෙස ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>**මුලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්.**</u>

ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි කාර්යාලය , ක්‍රීඩා සංවර්ධන මධ්‍යස්ථානය , මාකුරුගොඩ , බද්දේගම. ගරු සභාපති , අම්බලන්ගොඩ නගර සභාව. ජාතික මහා ක්‍රීඩා උළෙල - 2019 11 වන අදියර - ගාල්ල දිස්ත්‍රික් ක්‍රිකට් තරහ. 2019

ජාතික මහා ක්‍රිඩා උළෙලේ 11 වන අදියර තරඟ ලෙස දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් සංවිධානය කරනු ලබන ගාල්ල දිස්ත්‍රික් ක්‍රිකට් තරඟ ( කාන්තා/පිරිමි) 2019.06.08 දින අම්බලන්ගොඩ පොල්වත්ත නගර සභා ක්‍රිඩාංගණයේ සහ මානාන ක්‍රීඩාංගණයේ පැවැත්වීමට තීරණය කර ඇත. මෙම තරඟ පැවැත්වීම සඳහා 2019.06.08 දිනට ඉහත ක්‍රීඩාංගණ දෙක මුදල් අයකිරීමකින් තොරව වෙන්කර දිමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි.දකුණු පළාතේ ක්‍රීඩා සංවර්ධනය වෙනුවෙන් ඔබ දක්වන්නාවූ සහයෝගය කෘතඥපූර්වකම අගය කරමි. මෙය ලබා දිමට අවසර ඉල්ලා සිටිනවා.

**තීරණය**

ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි කාර්යාලය මඟින් 2019.06.03 දින එවන ලද ලිපියට අනුව 2019 ජාතික මහ ක්‍රීඩා උළෙල ගාල්ල දිස්ත්‍රික් ක්‍රිකට් තරඟ ( කාන්තා/පිරිමි) 2019.06.08 වන දින අම්බලන්ගොඩ පොල්වත්ත පියසේන ක්‍රිඩාංගණය හා මානාන ක්‍රීඩාංගණය නොමිලේ ලබා දිම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 12.10 එක්සත් මරණාධාර සමිතිය මගින් ඕකන්ද නිල පියස ගොඩනැගිල්ල ඉදිකිරිමට අදාල බිම කොටසක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිම සම්බන්ධ ලිපිය සභාවෙන් ඉවත් කරන ලදී.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

නිල පියස ගොඩනැගිල්ල ඉදිකිරිමට අදාලව මේ එවා ඇති ලිපිය අයින් කරනවා. නිල පියස යෝජනාව ඉවත් කළ නිසා මේ ලිපිය ඉවත් කරනවා.

**තීරණය**

එක්සත් මරණාධාර සමිතිය විසින් නිල පියස 86 - ඕකන්ද ග්‍රාම නිලධාරි වසමේ නිල පියස ඉදිකිරිම සම්බන්ධව 2019.05.29 දින යොමුකර ඇති ලිපිය ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මියගේ යෝජනාව ප්‍රතික්ෂේප කළ නිසා මෙම ලිපියද ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 12.11 අම්බලන්ගොඩ පොල්වත්ත පොදු සුසාන භූමියේ ඉදිකිරිමට යෝජිත නිළ සෙවණ සම්බන්ධව විරෝධය පළ කිරිම සම්බන්ධ ලිපිය සභාවෙන් ඉවත් කරන ලදී.

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

මේ ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා කරන ලද ඉල්ලිමත් මෙම යෝජනාව අයින් කළ නිසා මේ ලිපියත් ඉවත් කරනවා.

**තීරණය**

ගරු නගර සභා මන්ත්‍රි ධනසේන මාදුවගේ මහතා විසින් පොල්වත්ත සුසාන භූමියේ ඉදිකිරිමට නියමිත නිල පියස ඉදිකිරිම සම්බන්ධව 2019.05.28 දින යොමුකර ඇති ලිපිය ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මියගේ යෝජනාව ප්‍රතික්ෂේප කළ නිසා මෙම ලිපියද ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 12.12 පෙර පාසල් වාර්ෂික එක් දින චාරිකාව සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

පෙර පාසැල් වාර්ෂික එක්දින චාරිකාව සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දිම. අම්බලන්ගොඩ නගර සභාව යටතේ පාලනය වන පෙර පාසැල් 07ක ඉගෙනුම ලබන දූවා දරුවන් ( 155දෙනෙකු) වාර්ෂික අධ්‍යයන චාරිකාව යාම සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම සම්බන්ධයෙනි.චාරිකාව යාම සඳහා අපේක්ෂිත දින ගණන 01. ඒ අය ඉල්ලා සිටිනවා. බස්රථ 05ක් සඳහා රු.100000/= මුදලක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි  මැතිතුමිය කතා කරමින්</u>**

පොඩි දරුවන්ගේ වැඩේනේ. මෙය ලබා දෙන්න.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මේ සඳහා කවුරුත් විරුද්ද නැහැනේ. එහෙනම් එය ලබා දෙනවා.

තීරණය

අම්බලන්ගොඩ නගර සභාව යටතේ පාලනය වන පෙර පාසල් 07 ක ඉගෙනුම ලබන දූවා දරුවන් ( 155) සඳහා වාර්ෂික අධ්‍යයන චාරිකාව යාම සඳහා ප්‍රවාහන පහසුකම් වශයෙන් රු 100000/= ක මුදලක් ලබා දීම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.13 කළුවඩුමුල්ල නාගරික කොට්ඨාශය පිළිසකර කරලීම සම්බන්ධයෙන් ප්‍රණාමය පුද කරලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

ඒ.ඩබ් . ජයන්ත ද සිල්වා, නො.26, පඤ්ඤාලෝක මාවත, කලුවඩුමුල්ල,අම්බලන්ගොඩ. කළුවඩුමුල්ල නාගරික කොට්ඨාශය පිළිසකර කරලීම සම්බන්ධයෙන් ප්‍රණාමය පුද කරලීම. 2019.04.02 වෙනි දිනින් ඇරඹී සතිය පුරාම , කලුවඩුමුල්ල නාගරික කොට්ඨාශයේ පවතින මාවත්හි පිලිසකර කටයුතු වෙනුවෙන් සේවකයින් හා අවශ්‍ය සේවා පහසුකම් ලබාදීමට කටයුතු සැලැස්වීම සම්බන්ධයෙන් ගම්වාසින් වෙනුවෙන් සේවකයින් හා අවශ්‍ය සේවා පහසුකම් ලබාදිමට කටයුතු සැලැස්වීම සම්බන්ධයෙන් ගම්වාසින් වෙනුවෙන් අපගේ ස්තුතිය ප්‍රථමයෙන් පුදර සිටිනවා. එම සතියේ දින 05තුල පහත සඳහන් කාර්යයන් ඉටු කර ගැනීමට හැකි වූ බව දන්වමි. කලවඩුමුල්ල කොට්ඨාශයේ පවතින මාවත්හි වැඩි ප්‍රමාණයක ( ඕකන්ද හැර) මාවත් දෙපස තණකොළ හා ගස්වල අතුකපා පිරිසිදු කිරිම සිදු කරන ලද අතර විජයාරාම පාරේ පන්සල අසළ කොටසක පැවති කඩතොලු තාර දමා පිලිසකර කර ගැනිමට හැකිවිය. තවද පඤ්ඤලෝක මාවතේ පිං ළිඳ ලඟ සිට ම පැත්තේඅඩි 400ක් පමණ දිගට පැති කණුවක් වැසි ජලය බැස යන ආකාරයෙන් කපා හන්දියේ හරස් බෝක්කුවට සම්බන්ධ කිරිම , ළිද අසළ අපද්‍රව්‍ය හා කොන්ක්‍රිට් කොටස් වලින් වැසි ගොස්ව තිබූ හරස් බෝක්කුව රැදී තිබූ අපද්‍රව්‍ය ගොඩදමා සුද්ධ පවිත්‍ර කරන ලදී.එම කොටසේ වෙල පැත්තේ දමා තිබූ නිවාස වලින් කඩා ඉවත්වන ලද සුන්බුන් සියල්ල ශුද්ද පවිත්‍ර කිරිම.ඕකන්ද කානු පද්ධති සියල්ලම , පඤ්ඤාලෝක මාවතේ දෙපැත්තේ පවතින කානු වලින් ද ගලා බසිනා වැසි පඤ්ඤාලෝක පටු මගෙහි පිහිට ඇති ප්‍රධාන කාණුවට සම්බන්ධ වන අතර එකි කානුව මීට පෙර කිසිදා පිරිසිදු නොකිරිම මත කාණුව ( අඩි 650ක් පමණ දිග) ¾ පමණ ප්‍රමාණයක් අපද්‍රව්‍ය හා පස්වලින් ගොඩ වී තිබුණි. එම ගොඩවී තිබූ කාණුව මුලුමනින්ම පිරිසිදු කරන ලද අතර එම ස්ථානයේ පාර හරහා දමා තිබූ බෝක්කුව යට තැන්පත් වි තිබූ ගල් සහ වැලි දැඩි පරිශ්‍රමයක් දරා මුළුමනින්ම පිරිසිදු කරන ලදි. මෙම බෝක්කුව හරහා ජල  නල තුනක් එලා ඇති අතර එම හේතුවෙන් මුළු මනින්ම පිරිසිදු කරන ලදී.මෙම බෝක්කුව හරහා ජල නල තුනත් එලා ඇති අතර එම හේතුවෙන් අපද්‍රව්‍ය රැදෙන එක වැලැක්විය නොහැකි බවත් එය විධිමත්ව ජල නල සැකසිය යුතුව ඇති බවත් දන්වා ඇත. ධම්මික මහතාට ඒ බැව් දන්වා ජලසම්පාදන ඒකකයෙන් සේවකයින් ගෙන්වා එය නිවැරදිව සකස් කර ගැනීමට කටයුතු කලත් එක් හරස් බටහයක් පමණක් නිසි පරිදි සැකසුවද අහල් 3 හරස් බටය හා අහලේ හරස් බට එසේ සැකසිය නොහැකි බව එකි සේවකයින් දන්වා සිටින ලදි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මැතිතුමා කතා කරමින්**

ගරු සභාපතිතුමා මට විනාඩියක් දෙන්න. මේ ලිපිය ලියා ඇත්තේ ජයන්ත අයියා. මං හොඳින් දන්නවා. පඤ්ඤාලෝක මාවතේ පළල අඩි 20ක් හෝ ඊට වැඩි . ඔය එයාගේ නිවස අසළ අඩි 12ක් අඩි 08ක් පාරට දි නැහැ. දැන් මේ නන්දොඩවනවා.ඔය විකාර ලියන්නේ.ඔය බොරු ලියන්නේ. ඇයි ඔය බොරු.තමන්ගේ ඉඩමේ දෙන්න ඕන පාර හරියට දෙන්න. පාර හරියට හැදෙනවා.

**මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්**

එම බෝක්කුවේ වැලි හා අපද්‍රව්‍ය එකතු වීම වැලැක්විය නොහැකි බව දන්වා ඇත.කරුණාකර ඒ පිළිබඳ අවධානය යොමු කරමින් අවධානය යොමු කරන ලෙස දන්වා සිටි.තවද එහි දුරකථන කණුවක් ගැලවී කාණු ගැට්ටට සිරවී ඇති බවද එය ඉතා අවධානම් තත්ත්වයක් ඇති බවත් එය කඩිනමින් ඉවත් කරන මෙන් දන්වා ඇත.මෙම ස්ථානය මත කාණුව සිරවී නිරන්තරයෙන් අපද්‍රව්‍ය සිරවීම සිදුවන බව දන්වා සිටි.තවද වැසි සහිත දිනවලදී මේ හේතුවෙන් කාණුව දෙපසින් ගලායන ජලය පාර දෙපසින් නිවාස වලට යාම සිදුවේ.තවද පඤ්ඤාලෝක පටුමගේ කෙලවර කන්දේගොඩ පාරට සම්බන්ධ ස්ථාන වල අඩි 20ක් හරස් බෝක්කුවක් අඩි4ක් පමණ දිග අඩි 50ක් පමණ දිග කොන්ක්‍රිට් කාණුවක් ජලය බැස නොයන අයුරින් මුළුමනින්ම වැසි යන අයුරින් කැලෑ ගස් වැවී තිබුණි.එය සම්පූර්ණයෙන් සිදු කිරිමට නොහැකි වූ බව දන්වා සිටි.මේ සඳහා විශාල වශයෙන් සඳහන් කළ යුතු කාර්යයක් ඇත.මේ සඳහා යොදන ලද්දේ ඉතා සීමිත සේවක සංඛ්‍යාවකි.ඉහත දක්වා ඇති සියළු කාණු හා බොක්කු පිරිසිදු කරන ලද්දේ එස්.ඒ රත්න කුමාර, කේ.ඒ . ලවාන් කෝසල,ජානක හා සමන් යන සේවකයන් 4නා පමණක් බවත් සේවා සැලකිය යුතු යුතු බවත්, මේ නිසා සැලකිය යුතු වැඩ කොටසක් ඔවුන්ගේ පුද්ගලික වැඩ කොටසක් සේ සලකා කාල වේලාව නොබලා වැඩි පරිශ්‍රමයක් දරා සිදු කළ බවත් මෙහි රාජගාරිය අප සැම සිත් ගන්නා අයුරින් සිදු කිරිම පිළිබඳ විශේෂ ස්තුතිය පුද කරනවා. ඔවුන්ගේ සේවය ඇඟියිමකට ලක් කිරිමෙන් ඉදිරියේදි ඉතා හොඳ සේවකයින් පිරිසක් බිහිකළ හැකි බව මාගේ විශ්වාසයයි.ගරු නාගරික මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා විසින් ලබා දුන් සහායෝගය මත අපේක්ෂා නොකළ වැඩ කොටසක් කිරිමට හැකි වූ බව වැඩිදුරටත් දන්වා සිටි.තවද ඉදිරියේදි ඇති අනෙකුත් වැඩ කොටස් සඳහා ඔබ නගර සභාව මඟින් ලබා දෙන කොටස් වෙනුවෙන් සහාය දක්වන බව ගම්වාසින් වන අප දන්වා සිටි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා කතා කරමින්**

මට පොඩි දෙයක් කිමට අවශ්‍යයි.ඔය ලිපියේ සඳහන් කරුණු අනුව සේවකයින් අභයකිරිම ගැන ප්‍රකාශ කළ යුතුයි. ඔවුන් තමන්ගේ වැඩක් ලෙස මේ කාණු ඇතුලේ රිංගමින් ඉතා ඕනැකමින් වැඩ කටයුතු කළා.ඒ අය අභය කිරිම තමයි මේ ලිපියේ තිබෙන විශේෂම දේ. අනික් ඒවා තිබෙන්නේ අපේ ආඩුපාඩු.වැඩකරන සේවකයින් අභය කිරිම අපි හැමදෙනාම කළ යුතු බව ප්‍රකාශ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්**

මටත් පොඩි දෙයක් කියන්න තියෙනවා මේ ස්තුති ලිපිය සම්බන්ධයෙන්.මේ කතා කරන ගරු මන්ත්‍රීවරයා මාගේ යෝජනාවට කැමැත්ත ප්‍රකාශ නොකළත් මේ පක්ෂයේ සියළුම දෙනා මට පක්ෂව ඡන්දය ලබා දුන්නා.ඒ යෝජනාවට අනුවයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ.ඔහු අද ඒ ප්‍රතිලාභ ලබනවා ඔහුගේ ගමට.ඒගැන මා සංතෝෂ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්**

න්‍යාය පත්‍රයේ සමහර ලිපි ඉදිරිපත් කිරිමේදි සාරාංශය කියා කරුණු ඉදිරිපත් කරන්න.

**තීරණය**

අම්බලන්ගොඩ , පඤ්ඤාලෝක මාවතේ කලුවඩුමුල්ල නො 26 හි පදිංචි ඒ.ඩබ්.එම්. ජයන්ත ද සිල්වා මහතා විසින් කලුවඩුමුල්ල කොට්ඨාශය පිළිසකර කරලීම සම්බන්ධව ප්‍රණාමය පුද කිරීමේ ලිපිය ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී .

**12.14 පෝරඹ , වලව්ව පාර නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව ඇති ලිපිය සභාගත කරන ලදී**

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

එස් හොඳමුණි. පී.කේ. දිනුෂා නිලන්ති, එල් දර්ශන ප්‍රිය පත්ම,ජී.ඩබ්ලිව්. කිර්තිරත්න , යන අය විසින් පෝරඹ වලව්ව පාරට සම්බන්ධව ඇති නිවාස ඉදිරිපිටින් ඇති මාර්ගය සංවර්ධන කටයුතු සඳහා අම්බලන්ගොඩ නගර සභාවට පවරා දෙන ලෙස කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඒ සඳහා අවශ්‍ය කරන පැවරුම් නියෝග නිසි ආකාරයෙන් සකසා ඇත. වරිපණම් බිල්පත්ආදී ඒ සියළු දේවල්ද ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා මෙහි අත්සන් තබා ඇත. ඒ සඳහා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ පෝරඹ වලව්ව පාර සංවර්ධන කටයුතු සිදු කිරිම සඳහා ඉදිරිපත් කර ඇති පැවරුම් නියෝග අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12.15 ජාතික විගණන කාර්යාලය - 2018 අම්බලන්ගොඩ නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සභා ගත කරන ලදි**

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

මේ වාර්තාව මත ඒ කියන්නේ මූල්‍ය වත්කම් ඒ අය පිළිගත්තා කියා තිබෙනවා.ඒ මතය තමයි පිළිගත්තා කියා තිබෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>

විමසුම් කිසිවක් නැද්ද?

<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>

නැහැ . මතය තමයි පිළි ගත්තා කියන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා කතා කරමින්</u>

මෙහි ඡායා පිටපතක් ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතාට ලබා දෙන්න.

**තීරණය**

සහකාර වගණකාධිපතිතුමා විසින් අම්බලන්ගොඩ නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සාභාව දැනුවත් කිරිම සඳහා ඉදිරිපත් කරන ලදී.

- **වෙනත් කරුණු**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්

විලේගොඩ පාර විලේගොඩ හංදියේ සිට පනියන්දුව දක්වා මානාන හංදියට කාපට් කිරීමට කටයුතු සූදානම් කර තිබෙනවා.පලමු පියවර වශයෙන් මා මුදල් වෙන්කර වැඩ පටන් ගනු ලැබුවා. නගර සභාවට ජාතික ජලසම්පාදන මණ්ඩලය මේ පනියන්දුව හංදියේ සිට කුලසේකර හංදියේ සිට මානාන බෝක්කුව දක්වා බට දැමීමට ලක්ෂ 30ක් මුදල් බැඳ තිබෙනවා නගර සභාවට. මා මුදල් බැද්දට ඒ වට ඇමුණුම් පැමිණියේ නැහැ. ඒ අලුත් වැඩියාව තාම කළේ නැහැ.එතකොට නගර සභාව මේ ලක්ෂ 30න් පාර හැදුවොත් නැහැ.මා මාර්ග 5ක් විතර හැදිය යුතුයි සති 5ට. මා පිළිවෙළට දමා තිබෙන්නේ .පඤ්ඤාලෝක මාවතේ ඉදිරියට අපට බට එළිමට තිබෙනවා.එතකොට පඤ්ඤාලෝක මාවත කැඩෙනවානේ . අතන කඩන්නේ නැහැනේ නගර සභාව ඒ මුදල පඤ්ඤාලොක මාවතට හිලව් කරන්න.දැන් අර පාර හදන්නේත් නැහානේ. එම නිසා එම මුදල හිලව් කරන්න.

මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

මේ සඳහා ජල සම්පාදන මණ්ඩලයට කියන්න ඉල්ලිමක් කරන්න කියා.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්

ඉල්ලිම කරන තිබෙන්නේ.

මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

ඒක එවන්න කියන්න සභාවට දාන්න.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්

ඊට වඩා වැඩි වුනොත් ඒගොල්ලො ඉතුරු සල්ලි ගෙවයි.

මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්

වැඩිවන මුදල ගෙවන්න වනවා.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්

මේක හදාගෙන යනවිට තව ගැටලු එනවා.දැන් මහ අම්බලන්ගොඩ පාරත් හදනවා,ඇන්කර් ඒජන්සිය එහා පැත්තේ.මම ඒකට සල්ලි දුන්නා. ඒ පේජ්සි අක්කාලගේ ගෙදර ඒ අය තමයි මේ පාරලොකු කරන්න ඉඩ දි තිබෙන්නේ .එහෙම ඉඩ දුන්නාම ඒ අයගේ මෙතැන . මෙතනත් ඉඩම් කැල්ලක් තිබෙනවා මේ පාර හරහා ඉඩම් කැල්ලක් තිබෙනවා. මේ ඉඩම් කැල්ල මෙහෙම කර කෙලින් කරාම පාර හරි කෙලින් . ඇය ඡායාරූප ගෙන තිබෙනවා . මා දැන් ටිකක් හැදුවා . ඉතිරි ටික හදන්නේ නැතිව නතර කළා . ඇය ඉල්ලිමක් කර තිබෙනවා. මෙහේට . ඇත්තටම පව් . ඒ අයට පාර කෙලින් කළාම ඒ අයගේ ඉඩම් කැල්ල යනවා. මොකද ඒ අයගේ තාත්තා තමයි මේ ඉඩමට ඉඩ දි තිබෙන්නේ.ඇත්තටම එතනට ගිහින් බැලුවාම ඒක සාධාරණයි.දැන් මම පාර හදනකොට මම ගිහින් බැලුවම මටත් දුක හිතුනා.ඒ නිසා මේ සම්බන්ධව කර තිබෙන ඉල්ලීම සලකා බලලා මෙය ඉටුකර දිය යුතුයි.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්

ඔය කියන පුද්ගලයා සභාවට ආවා.ඒ අනුව අපි කිවුවා නීත්‍යානුකූල තත්වය බලලා අපි ඒක කරල දෙන්නම් කියලා.

ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මැතිතුමා කතා කරමින්

ගරු උප සභාපතිතුමා , මාගේ මහ අම්බලන්ගොඩ ළමා උද්‍යානය හදන එක. එම ස්ථානය බලන්න ගියාද දන්නේ නැහැ. නිවාස දෙකට ලිපි දෙකක් යවන්න කිව්වා . පාර පිළිබඳව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු උප සභාපතිතුමා . දැන් ළමා උද්‍යාන හදන්න මුදල් සියල්ල ලැබී තිබෙන්නේ.මේ මසේ 31 වෙනිදා හැදුවේ නැත්නම් මුදල් ආපසු යනවා. අපට කරිත්ත කන්ද එකේ ගැටළුව නැහැ.එතැන අපේ ක්‍රිඩා පිටිය තිබෙනවා. එතැන පාරවල් දෙකක් දි තිබෙනවා.ඊළඟ මාසය වන විට ජුලි වෙනවා. අගොස්තු මාසයේ 31.මුදල් යනවා. එතකොට නගර සභාව වගකිව යුතු වෙනවා ප්‍රතිපාදන ලබා දි නගර සභාව අක්‍රිය විම පිළිබඳව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

මෙය ඉස්සර වෙලා සවිකරන්න කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

සවිකරන්න බැහැ. ඒ අයට නැවත ගලවන්න බැහැ. මේවා මෙහෙම වුණාම අපිටත් පොඩි පසුබැමකට ලක්වෙනවා.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි මොකද එහි තත්ත්වය

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

උජිත් කමල් මහතාට තමයි ඔතනින් පාරක් දිය යුත්තේ. අනෙක් අයට පිටුපසින් පාර තිබෙනවා.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මෙය ගිය සභාවේත් කතා වුණා. මේ සතිය ඇතුළත ගිහින් තිරණයක් ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා කතා කරමින්</u>**

මෙය අපි වෙන්කර දිය යුතුයි ඒ ලාලන්ස් ආයතනයට.එ ළමා උද්‍යානය හදන්න වෙන්කර දෙන්න ඕන.මෙහි පාරවල් දෙකක් දෙන්න බැහැ. අපි කුඩා කාලයේ ඔතැන සෙල්ලම් කළා .මෙතැන තිබුණේ ළමා උද්‍යානයක්.

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මේ සඳහා තාක්ෂණසේවා නිලධාරින් සමඟ ලේකම්තුමියත් යන්න. මෙය පරික්ෂාකර බලා අනෙක් අයට පාර තිබෙනවා නම් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන තත්ත්වයට ගෙන්න. ඒ අයත් සමඟ සාකච්ජා කර බලන්න. ඒ අය නඩු මගට ගියොත් අපට මෙය කරන්න වෙන්නේ නැහැ.සාධාරණව ගිහින් බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

දැන් අපේ E පුස්තකාලය නැද්ද?

**<u>මූලාසනය - ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

එය ක්‍රියාත්මක වෙනවා.

- පස්වරු 3.30ට පමණ ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදිප් මහතා නැවත සභා ගර්භයට පැමිණියහ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , දැන් අපේ E පුස්තකාලය නැද්ද? එය ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ මොකක් හරි ගැටළුවක්ද

**<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ වහලා නැහැ. මෙය ළමයි පාවිච්චි කිරිමේ අඩුතාවයක් තිබෙනවා.ගෙවල්වල ෆොන් පාවිච්චි කරන නිසා එය භාවිතය අඩුවෙලා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

ගාල්ලගේ ලසන්ත කියන කෙනා ත්‍රි රෝද රථය ගාල් කිරිමට ඉඩ නොදිම කියා ලිපියක් තිබෙනවා. මෙය කමිටුවට ආවාද.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමා කතා කරමින්</u>**

මේ කමිටුවට පැමිණියා. එම වාර්තාවේ තිබෙනවා . එය ගෙන බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ප්‍රශ්නය සම්බන්ධව ත්‍රි රෝද කමිටුව තින්දුවක් දි තිබෙනවා. නැවත සාකච්ජා කිරිම අවශ්‍යා නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මැතිතුමා කතා කරමින්</u>**

පොල්වත්ත ප්‍රදේශයේ පාරවල් බොහොමයක් හැදුවා. එ ගැන සංතෝෂයි. ගරු විදුහල්පති ජගත් මහතාගේ නිවස අසළින් ඇති පාර සාදා නැහැ. ඒ ගැන මොකක්ද දන්නේ නැහැ තිබෙන තත්තවය.

**<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි අපි එය සාදා දෙන්නම් ගැටළුවක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ වන විට තාර කර්මාන්තය සාර්ථකව කෙරෙනවා. අර පෙරමුසු තාර වලින් නිමාකළයුතු මාර්ග 6-7ක ප්‍රමාණයක් තිබෙනවා අප ප්‍රදේශවල. දැන් ඒ කර්මාන්තය කෙරේන්නේ නැද්ද? පෙරමුසු තාර ඇනිමේ කටයුතු.

**<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට කෙරේන්නේ නැහැ. අපි මුදල් දි ටොන් 10ක් ප්‍රමාණයක් අපට ලැබිය යුතුයි. ඒලැබෙන කේ.වි .ඩබ් ප්ලාන්ට් එක මෙහෙන් ගලවාගෙන ගිහින්. දැන් අපි ගන්නවානම් ගොඩක් දුර ගිහින් ගෙන්න ඕන. ඉතිං එක පාඩුයි. දැනට අපට ඉතිරි වි තිබෙන්නේ තල්ගස්ගොඩ. ඔබතුමාගේ පාරවල් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා කතා කරමින්</u>**

තිබෙනවා. පින්නදූවේ පාරවල් 4ක පමණ තිබෙනවා. කෙරමිණිය පොකුණ පාරේ භාගයක තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි අද තාර බැරල් 50ක් අලුතින් ගෙන්නුවා. තාර බැරල් 350ක් විතර වැඩ කර තිබෙනවා. අපි ඉතිරි වැඩ ටිකත් කර පාරවල් වල වැඩ ඉවර කරනවා. සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

- **පස්වරු 2.30 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

රණසි උත්පලා ගුණවර්ධන මිය
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2019 -06–28** වන දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.